# කාර්යසාධන වාර්තාව 2025

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**වැය ශීර්ෂ අංකය 283**

**පරිසර අමාත්‍යාංශය**

# අන්තර්ගතය

අන්තර්ගතය ........ iii

වගු ලැයිස්තුව ........ v

ඡායාරූප ලැයිස්තුව ........ vii

**01** පරිච්ඡේදය
ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........ 1

**1.1** හැඳින්වීම ........ 1

**1.2** ආයතනයේ දැක්ම, මෙහෙවර ........ 2

**1.3** ප්‍රධාන කාර්යයන් ........ 3

**1.4** සංවිධාන සටහන ........ 4

**1.5** දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ........ 6

**02** පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........ 11

**2.1** ලබා ගන්නා ලද ප්‍රගතිය ........ 11

**2.2** වසරේ ක්‍රියාත්මක විශේෂ වැඩසටහන්/අමතර ක්‍රියාකාරකම් ........ 45

**2.3 2025** වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවූ අභියෝග ........ 46

**2.4** අනාගත දැක්ම ........ 47

**03** පරිච්ඡේදය
**2025** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය ........ 48

**3.1** මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශය ........ 48

**3.2** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 49

**3.3** මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශ ........ 50

**3.4** මූල්‍ය ප්‍රකාශ සටහන් ........ 51

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය ........ 52

**3.6** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය ........ 52

**3.7** මු.රෙ. **208** ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ........ 53

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 54

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව ........ 55

**04** පරිච්ඡේදය
කාර්ය සාධන දර්ශකය ........ 68

**4.1** කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධක දර්ශක පහත පරිදි වේ) ........ 68

**05** පරිච්ඡේදය ........ 72

තිරසර සංවර්ධන අරමුණු **(SDG)** සපුරා ගැනීමේ කාර්යසාධනය ........ 72

**5.1** තිරසර සංවර්ධන අරමුණු **(SDG)** සපුරා ගැනීමේ කාර්යසාධනය ........ 72

**5.2** තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ........ 76

06 පරිච්ඡේදය ........ 78
මානව සම්පත් පැතිකඩ ........ 78
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 78
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය ........ 78
6.3 මානව සම්පත් සංවර්ධනය ........ 78
6.4 2025 වසරේ විශ්‍රාම ගැනීම් ........ 78
6.5 සේවයෙන් ඉල්ලා අස්වීම්/ තනතුරු වලින් නිදහස් වීම ........ 79
6.6 මියගිය නිලධාරීන් පිළිබඳ විස්තරය ........ 79
6.7 විනය කටයුතු ........ 79
6.8 සේවය අත්හැර යාම ........ 80
6.9 දේශීය/ විදේශීය පුහුණු ........ 80
6.10 පුහුණු වැඩසටහන් ........ 83
6.11 ණය ලබාදීම ........ 84
6.12 තොරතුරු අයිතිවාසිකම් ඒකකය ........ 84
07 පරිච්ඡේදය ........ 85
අනුකූලතා වාර්තාව ........ 85
7.1 අනුකූලතා වාර්තාව ........ 85
08 පරිච්ඡේදය ........ 92
කැලෑ දෙපාර්තමේන්තු අරමුදල ........ 92
8.1 කැලෑ දෙපාර්තමේන්තු අරමුදල පිළිබඳ හැඳින්වීම ........ 92
8.2 අපේක්ෂිත අරමුණු හා නිමැවුම් ........ 93
8.3 කැලෑ දෙපාර්තමේන්තු අරමුදලට අදාලව ක්‍රියාකාරී සැලැස්ම ........ 93
8.4 2025.12.31 දිනට ප්‍රගතිය ........ 94
8.5 විගණකාධිපති වාර්තාව ........ 97
8.6 ගිණුම් වාර්තාව ........ 102

# වගු ලැයිස්තුව


| | | | |
|---|---|---|---|
| වගුව | 2.1 | දෙපාර්තමේන්තු වැඩසටහන - 2025 නඩත්තු | 14 |
| වගුව | 2.2 | පරිසර කළමනාකරණ කටයුතු | 16 |
| වගුව | 2.3 | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගොවි වන වගා ස්ථාපනය කිරීම | 19 |
| වගුව | 2.4 | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2023/2024 වසරවල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම | 20 |
| වගුව | 2.5 | දීප ව්‍යාප්ත වන ව්‍යාප්ති වැඩසටහන් | 21 |
| වගුව | 2.6 | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගෙවතු සංවර්ධනය කිරීම | 22 |
| වගුව | 2.7 | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ බීජ පැල නිෂ්පාදනය කිරීම | 23 |
| වගුව | 2.8 | දීප ව්‍යාප්ත රුක්රෝපණ වැඩසටහන් | 24 |
| වගුව | 2.9 | මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන | 25 |
| වගුව | 2.10 | නාගරික තුරුගොමු ස්ථාපනය | 26 |
| වගුව | 2.11 | වනාන්තර ආශ්‍රිත මාර්ග දෙපස කැලි කසල ඉවත් කිරීම | 26 |
| වගුව | 2.12 | පයිනස් වන වගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම | 28 |
| වගුව | 2.13 | පුද්ගලික අංශයේ නැවත වනවගා කිරීමේ වැඩසටහන 2025 | 29 |
| වගුව | 2.14 | පාරිසරික සංචාරක ගමනාන්ත | 30 |
| වගුව | 2.15 | සංචාරක පැමිණීම - 2025 | 44 |
| වගුව | 2.16 | සංචාරක කර්මාන්තයෙන් ලද මුළු ආදායම | 45 |
| වගුව | 3.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 48 |
| වගුව | 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 49 |
| වගුව | 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශ | 50 |
| වගුව | 3.4 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 52 |
| වගුව | 3.5 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ  කාර්යසාධනය | 52 |
| වගුව | 3.6 | මු.රෙ. 208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 53 |
| වගුව | 3.7 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම | 54 |
| වගුව | 4.1 | කාර්යසාධන දර්ශක | 68 |
| වගුව | 5.1 | තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 72 |
| වගුව | 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 78 |
| වගුව | 6.2 | 2025 වසරේ බඳවා ගැනීම් | 78 |
| වගුව | 6.3 | 2025 වර්ෂයේ විශ්‍රාම ගැනීම් | 78 |
| වගුව | 6.4 | සේවයෙන් ඉල්ලා අස්වීම් / තනතුරුවලින් නිදහස් වීම | 79 |
| වගුව | 6.5 | මියගිය නිලධාරීන් පිළිබඳ විස්තර | 79 |
| වගුව | 6.6 | විනය කටයුතු | 79 |
| වගුව | 6.7 | සේවය අත්හැර යාම් | 80 |
| වගුව | 6.8 | දේශීය පාඨමාලා | 80 |
| වගුව | 6.9 | විදේශීය පුහුණු | 81 |
| වගුව | 6.10 | දේශීය පාඨමාලා | 83 |
| වගුව | 7.1 | අනුකූලතා වාර්තාව | 85 |
| වගුව | 8.1 | තැගි මුදල් ගෙවීම | 93 |
| වගුව | 8.2 | උසාවි ගමන් වියදම් ගෙවීම | 93 |
| වගුව | 8.3 | වන ආරක්ෂණ කටයුතු සඳහා ගෙවීම් | 94 |
| වගුව | 8.4 | පුහුණු හා සම්මන්ත්‍රණ | 94 |
| වගුව | 8.5 | මුද්‍රණ කටයුතු හා වෙනත් වියදම් | 94 |

| | | | |
|---|---|---|---|
| වගුව | 8.6 | තෑගි මුදල් ගෙවීම් | 94 |
| වගුව | 8.7 | උසාවි වියදම් ගෙවීම | 94 |
| වගුව | 8.8 | වන ආරක්ෂණ කටයුතු සඳහා ගෙවීම් | 95 |
| වගුව | 8.9 | පුහුණු ,සම්මන්ත්‍රණ හා වැඩසටහන් | 96 |
| වගුව | 8.10 | මුද්‍රණ කටයුතු හා වෙනත් වියදම් | 96 |

## ඡායාරූප ලැයිස්තුව


| | | | |
|---|---|---|---|
| රූපය | 2.1 | පුබුදුගම ANR වගාව | 12 |
| රූපය | 2.2 | ප්‍රතිස්ථාපිත කඩොලාන නඩත්තුව | 12 |
| රූපය | 2.3 | ආගමික ස්ථානවල රුක් සිටුවීම/නඩත්තු කිරීම | 13 |
| රූපය | 2.4 | ගොවි වන වගා ස්ථාපනය කිරීම | 19 |
| රූපය | 2.5 | ගොවි වන වගා නඩත්තු කිරීම | 20 |
| රූපය | 2.6 | බීජ පැළ නඩත්තුව | 20 |
| රූපය | 2.7 | පැළ තවාන් සංවර්ධනය කිරීම | 21 |
| රූපය | 2.8 | වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම | 22 |
| රූපය | 2.9 | ගෙවතු සංවර්ධනය කිරීම | 23 |
| රූපය | 2.10 | බීජ පැල නිෂ්පාදනය කිරීම | 24 |
| රූපය | 2.11 | රුක් රෝපණ වැඩසටහන් සිදු  කිරීම | 24 |
| රූපය | 2.12 | මාර්ග දෙපස රුක් රෝපණය | 25 |
| රූපය | 2.13 | නාගරික තුරුගොමු ස්ථාපනය | 26 |
| රූපය | 2.14 | වනාන්තර ආශ්‍රිත මාර්ග දෙපස කැලි කසල ඉවත් කිරීම | 27 |
| රූපය | 2.15 | සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයට අදාල නව මාර්ග පුවරු සකස් කිරීම | 30 |
| රූපය | 2.16 | සිංහරාජ රක්ෂිතය තුල ඇති ස්වාභාවික මංපෙත්  නඩත්තු කිරීම | 31 |
| රූපය | 2.17 | සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ පිටදෙනිය ප්‍රවේශ පාලම ප්‍රතිසංස්කරණය කිරීම | 31 |
| රූපය | 2.18 | භූමි අලංකරණය වැඩිදියුණු කිරීම | 31 |
| රූපය | 2.19 | අනියම් කම්කරුවන් යොදවා අවශ්‍ය නඩත්තු කටයුතු සහ මෙහෙයුම් කටයුතු සිදු කිරීම | 32 |
| රූපය | 2.20 | ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම | 32 |
| රූපය | 2.21 | ඔලියගන් කැලේ ජෛව විවිධත්ව මධ්‍යස්ථානයේ දේශන ශාලාව ප්‍රතිසංස්කරණය | 32 |
| රූපය | 2.22 | කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ සංචාරක මඟපෙන්වන්නන් පුහුණුව | 33 |
| රූපය | 2.23 | කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ ප්‍රවර්ධන කටයුතු සඳහා සිහිවටන ලෙස අලෙවිය සඳහා ටී ෂර්ට් සහ තොප්පි සකස් කිරීම | 33 |
| රූපය | 2.24 | කන්නෙලිය රක්ෂිතයේ ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම | 33 |
| රූපය | 2.25 | කොට්ටව රක්ෂිතයේ ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම | 34 |
| රූපය | 2.26 | අඩාහැලෙන ඇල්ල ප්‍රවේශ පත්‍ර කවුළුව අසල නාම පුවරු ස්ථාපිත කිරීම | 34 |
| රූපය | 2.27 | නකල්ස් සංරක්ෂිතය තුළ ඇති ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම | 34 |
| රූපය | 2.28 | උඩවත්ත කැළේ රාජකීය උද්‍යානය තුළ පුවරු සැකසීම හා මංපෙත් නඩත්තු කිරීම | 35 |
| රූපය | 2.29 | නකල්ස් සංරක්ෂිතය තුළ පුවරු සැකසීම හා මංපෙත් නඩත්තු කිරීම | 35 |
| රූපය | 2.30 | හුරුළු පාරිසරික වන උද්‍යානයේ ප්‍රධාන සෆාරි ජීප් රථ මාර්ග අලුත්වැඩියා කිරීම | 36 |
| රූපය | 2.31 | හුරුළු පාරිසරික වන උද්‍යානයේ ප්‍රධාන සෆාරි ජීප් රථ මාර්ගයේ ඇති ලන්ටානා ඇතුළු ආක්‍රමණික ශාක ඉවත් කිරීම | 36 |
| රූපය | 2.32 | ඉහලකන්ද වැවෙහි වැව් බැම්මේ තෘණ සිටුවීම | 37 |
| රූපය | 2.33 | ඉහලකන්ද වැව  ධාරිතාවය වැඩි කිරීම සඳහා පස් කපා ඉවත් කිරීම | 37 |
| රූපය | 2.34 | කොළපතනඇල්ල  ප්‍රවේශපත්‍ර කාර්යාලය අසල ගිමන් හලක්    ඉදි කිරීම | 37 |
| රූපය | 2.35 | ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම | 38 |
| රූපය | 2.36 | Elephant Rock නාම පුවරු ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම | 38 |

# 01 පරිච්ඡේදය
# ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජාතියේ සෞභාග්‍ය සහතික කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම කාර්යභාරය සහතික කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් 2025 වර්ෂය තුළ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ කටයුතු පහත දක්වා ඇති පරිදි පුළුල් විෂයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී.

- සමාජ සහ පාරිසරික ප්‍රතිලාභ තිරසාරව ලබා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රශස්ථ වන ආවරණයක් පවත්වා ගැනීම.
- රටේ දැව අවශ්‍යතාවයන් සපුරාලීම හා දැව සැපයුම ඉහළ නැංවීම උදෙසා නිෂ්පාදන වන වගා ස්ථාපනය කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම.
- ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා වන සංරක්ෂණ ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව වනාන්තරවල ආරක්ෂාව ශක්තිමත් කිරීම.
- රජයේත්, ප්‍රජාවගේත්, පුද්ගලික අංශයේත් සහභාගිත්වයෙන් තුරු වැස්ම ඉහළ නැංවීම.
- පර්යේෂණ, අධ්‍යාපන සහ ව්‍යාප්ති යන අංශ ඔස්සේ ජාතික වන සම්පත් සංවර්ධනය සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම.
- ප්‍රජා වන කළමනාකරණ වැඩ කටයුතු ව්‍යාප්ත කිරීම.
- පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.
- වන නිෂ්පාදන හා සේවාවන් තිරසාර ලෙස භාවිතය හා කළමනාකරණය කිරීම.

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ 13ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම් (i) සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති (ii) වන විද්‍යා සහ වන වගා කළමනාකරණ (iii) භූ විද්‍යා තොරතුරු හා වන සංගණන (iv) පරිසර කළමනාකරණ හා භූ සම්පත් (v) පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු (vi) වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම (vii) සැලසුම් හා ප්‍රගති පාලන (viii) පාරිසරික සංචාරක (ix) ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ (x) ප්‍රවාහන අංශය (xi) මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන (xii) මුදල් අංශය (xiii) අභ්‍යන්තර විගණන යන අංශ ඒ යටතට ගැනේ.

මෙම අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව දීර්ඝ තොරතුරු විස්තරයක් ඉදිරියේ දක්වා ඇති පරිච්ඡේද මඟින් විස්තර කෙරේ. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, වවුනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල පිහිටි දිසා වන කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම දිසාවන්ගේ කටයුතු කොළඹ, රත්නපුරය, නුවරඑළිය, අනුරාධපුරය සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල ස්ථාපනය කර ඇති කලාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාල මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී සිදු කරයි. පර්යේෂණ කටයුතු කුඹල්පොල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි පර්යේෂණ මධ්‍යස්ථානවල අධීක්ෂණය හා සම්බන්ධීකරණය යටතේ සිදු කෙරේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර

### දැක්ම

රටවැසියාගේ හා ජාතික ආර්ථිකයෙහි හිත සුව පිණිස දැව හා වෙනත් වන ද්‍රව්‍ය සඳහා වැඩී එන ඉල්ලුම සපුරාලීම මෙන් ම මනා පාරිසරික සේවාවන් පවත්වාගෙන යාම සඳහා දේශීය වන හා වෘක්ෂ සම්පත් තිරසාර අයුරින් කළමණාකරණය කිරීම.

### මෙහෙවර

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

• මනා දේශගුණික තත්ත්වයන් මෙන් ම පස, ජල සම්පත්, සතුන් හා වෘක්ෂලතා සංරක්ෂණය හා රටෙහි සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, ඓතිහාසික, විනෝදාත්මක හා සමාජ ආර්ථික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රශස්ත හා ප්‍රමාණවත් වන ආවරණයක් දිවයිනෙහි පවත්වාගෙන යාම.

• වනබිම් සතු භූමි ලක්ෂණ, වන සතුන් හා වෘක්ෂලතා, ඓතිහාසික, සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, පාරිසරික හා සමාජීය ලක්ෂණ සැලකීමට ගත් ඒකාබද්ධ භූමි පරිශීලනය මඟින් වන බිම් ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.

• වන වගා බිම් සංවර්ධනය මඟින් දේශීය පරිභෝජනය සඳහා මෙන් ම අපනයනය සඳහා අවශ්‍ය වන දැව නිෂ්පාදනය වර්ධනය කිරීම සහ එමඟින් පාංශු හා ජල සම්පත් සංරක්ෂණය සහතික කිරීම.

• අනාගත දැව අවශ්‍යතා අඛණ්ඩව සපුරා ගැනීම උදෙසා වන සම්පත් විද්‍යාත්මක පදනමින් කළමනාකරණය කිරීම සහ ඒවායේ තිරසාර සංවර්ධනය සහතික කිරීම.

• වන සම්පත් තිරසාර සංවර්ධනයට ලක් කිරීම සඳහා අවශ්‍ය වන, වන විද්‍යා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.

• වන සම්පත් සංවර්ධනය උදෙසා දායකවන්නා වූ අනෙකුත් ආයතන සමඟ වෘත්තීය මට්ටමින් සම්බන්ධතා පවත්වාගෙන යාම.

• ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නංවාලීම උදෙසා වන සංරක්ෂණය, කළමනාකරණය හා සංවර්ධනය ඉලක්ක කොටගත් ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

• වන සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ අවබෝධය හා හැකියාවන් ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපනික හා ව්‍යාප්ති වැඩසටහන් මෙහෙයවීම.

• තත්කාලීනව බලපවත්නා වන සංරක්ෂණ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව වන සම්පත් ආරක්ෂා කිරීම.

• ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කොට, සංරක්ෂණ ක්‍රියාවලියට අවහිර නොවන අයුරින් පරිසර සංචාරක කටයුතු පවත්වාගෙන යාම.

• පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් වන සංවර්ධන ක්‍රියාවලීන් ප්‍රවර්ධනයට පියවර ගැනීම

## 1.4 සංවිධාන සටහන



වන සං.ජ.
අති වන.සං.ජ.(මෙහෙයුම්)
අති වන.සං.ජ.( අධ්‍යාපන)
අති වන.සං.ජ.( පරිපාලන)
වන සං (ව. ආ. නි.ක්‍රි.)
වන සං (පරි.ක.භූ. ස)
වන සං (ව. වි. ව. ව)
වන සං (ස. ව. වි. ව්‍ය)
වන සං (සැ.භා.පු.පා)
වන සං (පා.ස)
වන සං (ජෛ වි ජ සං)
වන සං (භූ වි තො)
වන සං (පර්යේෂණ)
වන සං (අ. ධා. සං)
වන සං (පි.පා)
ප්‍ර.ග
ප්‍ර.අ.වි.
නි.ව.සං.-කලාප (05)
නි.ව.සං. (02 )
නි.ව.සං. (01
ග-II - 01
නි.නි.
ස.ව.සං
ස.ව.සං/දි.ව.නි.(23)
ගණකාධි. III
ව්.ව.පා.
පරි. නි
සං.නි
භාෂා පරි.
ව.පා.
අ.ව.නි.
ක.සේ.නි.
සැ.ශි.
පුස්තකාලාධි.
බි .ව.නි
ව.ව්‍යා.නි.
වන.ක්.ස
ව.ගා.ක./ කා.කා.ස
කා.කා.ස

## කෙටි යෙදුම

| | | |
|---|---|---|
| වන.සං.ජ | - | වන සංරක්ෂක ජනරාල් |
| අති.ව.සං.ජ (මෙහෙයුම්) | - | අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) |
| අති.ව.සං.ජ (අධ්‍යාපන) | - | අතිරේක වන සංරක්ෂක ජනරාල් (අධ්‍යාපන,පර්යේෂණ හා පුහුණු) |
| අති.ව.සං.ජ (පරිපාලන) | - | අතිරේක වන සංරක්ෂක ජනරාල් (මානව සම්පත් කළමනාකරණ, පරිපාලන හා ආයතන සංවර්ධන) |
| වන.සං (පරි.ක.භූ.ස) | - | වන සංරක්ෂක (පරිසර කළමණාකරණ හා භූ සම්පත්) |
| වන.සං (සැ.ප්‍ර.පා) | - | වන සංරක්ෂක (සැලසුම් හා ප්‍රගති පාලන) |
| වන.සං (ව.වි.ව.ව.ක) | - | වන සංරක්ෂක (වන විද්‍යා හා වන වගා කළමනාකරණ) |
| වන.සං (ස.ව.වි.ව.ව්‍යා) | - | වන සංරක්ෂක (සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති) |
| වන.සං (ව.ආ.නී. ක්‍රි). | - | වන සංරක්ෂක (වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම) |
| වන.සං (පා.ස) | - | වන සංරක්ෂක (පාරිසරික සංචාරක) |
| වන.සං (ජෛ.වි.ජ.සං) | - | වන සංරක්ෂක (ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ) |
| වන.සං (භූ.වි.තො.වන.සං) | - | වන සංරක්ෂක (භූ විද්‍යා තොරතුරු හා වන සංගණන) |
| වන.සං (පර්යේෂණ ) | - | වන සංරක්ෂක ( පර්යේෂණ ) |
| වන.සං (අ.ධා.සං) | - | වන සංරක්ෂක (අධ්‍යාපන හා ධාරිතා සංවර්ධන) |
| වන.සං - ( පි.පා) | - | වන සංරක්ෂක (පිරිස් හා පාලන) |
| ප්‍ර.ග | - | ප්‍රධාන ගණකාධිකාරී |
| ප්‍ර.අ.වි | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| ක.නි.ව.ස | - | කලාප නියෝජ්‍ය වන සංරක්ෂක |
| නි.ව.ස | - | නියෝජ්‍ය වන සංරක්ෂක |
| ගණකාධි. - ii | - | ගණකාධිකාරී |
| නී.නි | - | නීති නිලධාරී |
| ස.ව.සං. | - | සහකාර වන සංරක්ෂක |
| දි.ව.නි | - | දිසා වන නිලධාරී |
| ගණකාධි. - iii | - | ගණකාධිකාරී |
| වි.ව.පා | - | විශේෂ වන පාලක |
| පරි.නි | - | පරිපාලන නිලධාරී |
| සං.නි | - | සංවර්ධන නිලධාරී |
| භාෂා පරි. | - | භාෂා පරිවර්තක |
| ව.පා | - | වන පාලක |
| ක.සේ.නි | - | කළමනාකරණ සේවා නිලධාරි |
| අ.ව.නි | - | අඩවි වන නිලධාරී |
| සැ.ශි | - | සැලසුම් ශිල්පී |
| පුස්තකාලාධි. | - | පුස්තකාලාධිපති |
| බී.ව.නි | - | බීට්ටු වන නිලධාරී |
| ව.ව්‍යා.නි | - | වන ව්‍යාප්ති නිලධාරී |
| ව.ක්.ස | - | වන ක්ෂේත්‍ර සහකාර |
| වගා. ක. | - | වගා කම්කරු |
| කා.කා.ස. | - | කාර්යාල කාර්ය සහයක |

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශ 13 යටතේ පාලනය වේ.

### 1.5.1: සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශය

ජාතික මට්ටමේ වන ව්‍යාප්ති සහ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන් ම සියලු ම සහභාගිත්ව සහ සමාජ වන විද්‍යා වැඩසටහන් සංවර්ධනය සහ අධීක්ෂණය, වන ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම හා ඒ සඳහා බීජ පැළ නිෂ්පාදනය, පුහුණු හා ව්‍යාප්ති වැඩසටහන් සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම සහ ප්‍රජාව සඳහා නියමු මට්ටමේ ආදායම් උපදවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යනාදී කටයුතුවල නිරතවීම සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශයේ වගකීම් වේ. මෙම අංශයට සහභාගිත්ව වන වගා සහ සහභාගිත්ව වන කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම ද පැවරී තිබේ. ස්වාභාවික වනාන්තරවල සිදු කරන ප්‍රජා වන කළමනාකරණ කටයුතුවල වගකීම ද පැවරී තිබෙන්නේ සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය වෙතය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ප්‍රජා සහභාගීත්වයෙන් සිදු කරනු ලබන සියළු කටයුතු සඳහා මූලිකත්වය ගනු ලබන්නේ මෙම අංශය මඟිනි.

### 1.5.2: පරිසර කළමනාකරණ හා භූ සම්පත් අංශය

වන ප්‍රතිපත්තියේ මූලික අරමුණක් වන පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීමේ අරමුණ මත පිහිටමින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ පවත්නා සියලු පරිසර පද්ධතීන්හි ජෛව විවිධත්වය, පස, ජලය, ඓතිහාසික, සංස්කෘතික ආගමික හා සෞන්දර්යාත්මක අගයයන් සංරක්ෂණය කරමින් කළමනාකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. තව ද වනාන්තර කළමනාකරණ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, භූ සම්පත් සමීක්ෂණය හා තිරසාර භාවිතය සඳහා වූ සැලසුම් සකස් කිරීම ද මෙම අංශය යටතට ගැනේ.

### 1.5.3: වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීමේ අංශය

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන වගකීම වන්නේ, නීතිමය ආරක්ෂාව තහවුරු කර, ස්වභාවික වනාන්තර, වන වගා සහ එහි සිටින වන ජීවීන් ද, අනෙකුත් ජෛව විවිධත්වය සඳහා දායකවන සම්පත් ද, සුරැකීම සහ සංරක්ෂණය කිරීම සඳහා වූ නීතිමය පසුබිම සැකසීම වේ. එමඟින් වනාන්තරවලින් සැපයෙන පාරිසරික සේවාවන් සහ වනජ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට, රජයට අයත් වන සම්පත්වලට ලැබිය යුතු නීතිමය ආරක්ෂාව සැපයීම, ප්‍රාදේශීය කාර්ය මණ්ඩල හදිසි වැටලීම් අංශය සහ දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන හරහා වන නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම මෙන් ම ආරක්ෂිත ප්‍රදේශ ලෙස වනාන්තර ප්‍රකාශයට පත් කිරීම සහ වන සංරක්ෂණ අඬා පනත සඳහා නියෝග සකස්කිරීම ද මෙම අංශය සතු වගකීම් වේ.

### 1.5.4: භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය

භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය ප්‍රධාන වශයෙන් රටේ වන සම්පත් ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමේ වගකීම දරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ රටේ පවතින වනාන්තර මිනුම් කිරීම සහ සිතියම් සැකසීම, වනාන්තරවල මායිම් සලකුණු කිරීම, ස්වාභාවික සහ ස්ථාපිත වනාන්තරවල සංගණනයන් සිදු කිරීම, වන වගාවන්වල සංගණන දත්ත අඩංගු දත්ත සමුදාය පවත්වාගෙන යාම, වන ආවරණ සිතියම් සැකසීම, දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවල ක්‍රියාකාරකම්වලට අවශ්‍ය අංකිත සිතියම් සැකසීම, වනාන්තර රක්ෂිත බවට ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය උපලේඛන සැකසීම හා ඒවා පරීක්ෂා කිරීම වේ. තව ද පැරණි ගුවන් ඡායාරූප, අංකිත දත්ත, භූ සිතියම්, ගුවන් ඡායාරූප ලබාගත් රේඛාවන් දක්වන භූ සිතියම් ආරක්ෂිතව ගබඩා කර තැබීම ද මෙම අංශයේ වගකීමක් වේ.

### 1.5.5: සැලසුම් හා ප්‍රගති පාලන අංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ක්‍රියාකාරකම්වලට අදාළ වාර්ෂික සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ සැලසුම් හා ප්‍රගති පාලන අංශය වෙතයි. වාර්ෂික අයවැය සකස් කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවනු ලබන සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ නව ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම, දෙපාර්තමේන්තුව සතු සියළු සම්පත් හා වත්කම් පිළිබඳ දත්ත සමුදායක් පවත්වාගෙන යාම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම, දෙපාර්තමේන්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවීම, වාර්තා සකස් කිරීම හා බෙදා හැරීම යන ක්‍රියාකාරකම් ද සැලසුම් හා ප්‍රගති පාලන අංශය විසින් සිදු කරනු ලැබේ.

### 1.5.6: පාරිසරික සංචාරක අංශය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රමෝපායන් හි ප්‍රමුඛතම අංශයක් වන සංචාරක කර්මාන්තයට ඉහළ දායකත්වයක් ලබාදිය හැකිවන්නා වූ පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන්නා වූ ස්වභාවික වනාන්තර ආශ්‍රිතව ඉතා ඉහළ විභවයක් ඇත. තව ද පාරිසරික සංචාරක කර්මාන්තය මඟින් වනාන්තර ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ඇති ඉහළ විභවය නිසි පරිදි කළමනාකරණය කර ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම සඳහා ද පාරිසරික සංචාරක කර්මාන්තය යොදා ගැනීමට හැකියාව තිබේ.

පාරිසරික සංචාරක කර්මාන්තය සමඟ බැඳුණු අධ්‍යාපනික වැඩසටහන් සහ සංචාරකයින් සමඟ ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණය සඳහා ද යොදාගැනීමට හැකියාව ඇත. මේ සඳහා සංචාරකයින්ගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන එම අවශ්‍යතා සැපයීමට දෙස් විදෙස් සංචාරකයින් විශාල ලෙස ආකර්ශණය කර ගැනීමට හැකියාව ඇත. ඒ අනුව, පරිසර පද්ධති සංරක්ෂණය තහවුරු කර

ගනිමින්, ප්‍රජාවගේ සුභ සිද්ධිය සැලසීම සහ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා පාරිසරික සංචාරක ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ වගකීම වේ.

## 1.5.7: වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශය

දැව නිෂ්පාදන හා සේවා සැපයීම තහවුරු කරමින් තිරසාර ලෙස වන වගා කළමනාකරණය කිරීම වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශයේ ප්‍රධාන වගකීම වේ. වන වගා ස්ථාපනය කිරීම හා කළමනාකරණය, අස්වනු නෙලීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත වන වගා නිදහස් කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා මෙම අංශය දායක වේ. පයිනස් වගා බිම්වලින් පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් රෙසින් නිස්සාරණය කිරීම සහ පුද්ගලික අංශය සමග නැවත වගා කිරීමේ කටයුතුවල නිරත වීම මෙම අංශයේ අනෙකුත් වගකීම් වේ.

## 1.5.8: ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශය

ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශයේ අරමුණ වනුයේ ජෛව විවිධත්වය, පස, ජලය කෙරෙහි අවධානය යොමු කරමින් අනාගත පරපුර වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය කොට ගුණාත්මක බවින් සංවර්ධනය කිරීමය. වන ආවරණය වැඩි කිරීම හා සංරක්ෂණය කිරීම, වන ආවරණය වැඩි කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම, ඔවුන් ඒ සඳහා සම්බන්ධ කර ගනිමින් වන වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, කඩොලාන නැවත වගා කිරීම හා පවතින කඩොලාන පද්ධතිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, කැළෑ ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වැව් තාවුළු සංරක්ෂණය, ආගමික ස්ථානවල පැළ සිටුවීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම යනාදී ක්‍රියාකාරකම් මෙම අංශය මඟින් පුළුල් විෂයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී.

## 1.5.9: පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන අංශය

පර්යේෂණ, අධ්‍යාපන සහ සංවර්ධන අංශයට දෙපාර්තමේන්තු බල සීමාව තුළ, පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන කටයුතුවල වගකීම පැවරී තිබේ.මේ යටතේ පර්යේෂණ අංශය, කුරුණෑගල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වලින් ද, අධ්‍යාපන අංශය, නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනය සහ ඉනාමළුවේ පිහිටි ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය යන අංශ මඟින් ද පාලනය වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුස්තකාලයද මෙම අංශය යටතේ පවතී.

මේ වන විට පුස්තකාලය සතුව ග්‍රන්ථ 7,685ක් පමණද, වාර්තා 1,050 ක් පමණද ඇති අතර වාර්ෂිකව මුද්‍රණය කරනු ලබන විද්‍යාත්මක සඟරා 30ක පමණ එකතුවක් පවතී.

වන විද්‍යා පර්යේෂණ ආයතනය මඟින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික පර්යේෂණ වැඩසටහන, පර්යේෂණ මධ්‍යස්ථානය හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය දැව සංස්ථාවේ සහ වන වගා කටයුතු වල නිරතව සිටින පුද්ගලික අංශයේ

ගැටළු නිරාකරණය කිරීමෙහිලා සෘජුව ක්‍රියා කරයි. මෙම මධ්‍යස්ථාන විසින් සංරක්ෂණ සහ නිෂ්පාදන වන විද්‍යා සම්බන්ධ ව්‍යවහාරික සහ අනුවර්තීය පර්යේෂණ කටයුතු සිදු කරයි.

දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයේ කාර්ය මණ්ඩල හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ම වන විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත විෂයන් (NVQ 5 සහ 6 මට්ටමේ) ආශ්‍රිත පුහුණු වැඩසටහන් නුවරඑළියේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා වන විද්‍යායතනය මඟින් සිදු කරනු ලබයි. තව ද පුද්ගලික අංශයෙන් සහ රජයේ වෙනත් නියෝජිත ආයතනවලින් සිදුකරන ඉල්ලීම්වලට අනුව කෙටි කාලීන පුහුණු වැඩසටහන් සිදුකරනු ලැබේ. ඉනාමළුව පිහිටි ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය ක්ෂේත්‍ර පුහුණු කටයුතු සඳහා යොදා ගනී.

## 1.5.10: ප්‍රවාහන අංශය

මෙම අංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වාහන නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම, සංචිතයේ තිබෙන වාහනවලට සහ නිලධාරින්ට වෙන් කරන ලද වාහනවලට ඉන්ධන සැපයීම සහ රියදුරන්ගේ අතිකාල, අමතර ප්‍රවාහන ඉන්ධන ඉල්ලීම් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම යනාදී කටයුතු සඳහා වගකියනු ලැබේ. මෙයට අමතරව, ප්‍රධාන කාර්යාලයට හා අනෙකුත් ක්ෂේත්‍ර කාර්යාලවලට අයත් ගර්භිත වාහන අපහරණය කිරීම, වාහන පවරා ගැනීමේ කටයුතු සිදු කිරීම, අළුත්වැඩියා කටයුතු සඳහා සහ ඉන්ධන සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සැපයීම සම්බන්ධීකරණය කිරීම, ප්‍රධාන කාර්යාලයේ වාහන සේවා කිරීමේ කටයුතු හා රක්ෂණය කිරීමේ කටයුතු ද, සියලුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි. ප්‍රධාන කාර්යාලයේ හා ක්ෂේත්‍ර කාර්යාලවල වාහනවල සිදු වන අනතුරු සම්බන්ධව කටයුතු කිරීම ද මෙම අංශය මඟින් සිදු වේ.

## 1.5.11: මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණ, පරිපාලන හා ආයතනික සංවර්ධන අංශය වශයෙන් සමස්ථ පරිපාලන කටයුතු සිදු කිරීම සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාව වර්ධනය කරමින් මහජනයාට සහ රටට උපරිම සේවාවක් සැපයීම සඳහා සුදුසු පරිපාලන සහ කළමනාකරණ වැඩ රාමු තුළ ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල, අඩවි වන කාර්යාල වන විද්‍යාලය හා පර්යේෂණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම යන වගකීම් පැවරී තිබේ.

පිරිස් හා පාලන යන විෂයයන්ට අදාළ විවිධ කටයුතු 2025 වසරේදී මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද අතර, එහිදී ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් චක්‍රලේඛ විධි විධාන සහ සියලුම අදාළ නීති, රෙගුලාසි සහ නියෝගයන්ගේ සීමාවන් ඇතුලත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව සියලු බඳවා ගැනීම් හා උසස් වීම් හා අනෙකුත් වරප්‍රසාද ලබා දීම් සිදු කිරීම මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

## 1.5.12: මුදල් අංශය

දෙපාර්තමේන්තුවට අදාළ මූල්‍යමය කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ මුදල් අංශය මඟිනි. මෙම අංශය මහා භාණ්ඩාගාරය, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැලසුම් කිරීම, මෙහෙයවීම, පාලනය හා ගිණුම් තැබීම, මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අක් මුදල් සහ දෙපාර්තමේන්තු ආදායම් සම්බන්ධ මූල්‍ය පාලනය, මහා භාණ්ඩාගාරයට, පරිසර අමාත්‍යාංශයට සහ දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරීත්වයට අවශ්‍ය මූල්‍යමය තොරතුරු වර්ගීකරණය කර ඉදිරිපත් කිරීම, විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සහ දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවතින කැළෑ ගිණුම් සම්බන්ධ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම මුදල් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

## 1.5.13: අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන කොටසේ 40 වන වගන්තිය මෙන්ම, මුදල් රෙගුලාසි සංග්‍රහයේ වගන්ති අංක 133,134 හා අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අනුව ඉටු කරනු ලබන රාජකාරි කටයුතු පිළිබඳ තොරතුරු වන සංරක්ෂණ ජනරාල් වෙත සෘජුවම වාර්තා කරනු ලබයි.

දෙපාර්තමේන්තු කාර්යයන්, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව සිදුවේ ද යන්න පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම තුළින් දෙපාර්තමේන්තු කාර්ය සාධනය ඉහල නංවා ගැනීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන විධිවල ප්‍රමාණාත්මකභාවය ඇගයීමකට ලක් කොට එහි තත්ත්වයන් පිළිබඳ වන සංරක්ෂක ජනරාල් වෙත වාර්තා කිරීම සිදු කරයි.

# 02 පරිච්ඡේදය
# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ලබා ගන්නා ලද ප්‍රගතිය

වන සංරක්ෂණය හා සංවර්ධනය මූලික කරගත් කාර්යයන් සමුදායක් 2025 වසර තුළ දියත් කළ අතර ඒවායේ කාර්යසාධනය පහත අංශ ඔස්සේ විස්තර කෙරේ.

## 2.1.1 හානියට පත් වනාන්තර නැවත ප්‍රතිස්ථාපනය කිරීම

### 2.1.1.1 වන ආවරණය ඉහළ නැංවීම

විවිධ හේතූන් මත හායනයට පත් ස්වභාවික වනාන්තරවල ගුණාත්මය වැඩිකිරීමේ අරමුණින් ස්වභාවික පුනර්ජනනය වැඩිකිරීම මගින් පසුගිය වසර 05ක් තුළ ප්‍රතිස්ථාපනය ආරම්භ කරන ලද වනාන්තර බිම් හෙක්ටයාර 3,702.82 ක් නඩත්තු කර පවත්වාගෙන යන ලදි. තවද,වන අලි වාසස්ථාන වැඩිදියුණු කිරීමේ අරමුණින් කුරුණෑගල ගැටදිවුල හෙක්.56.9 ක ආක්‍රමණශීලී ශාක ඉවත් කර වැව් පිටි ප්‍රතිසංස්කරණය කරන ලදි.

ANR වැඩසටහන්, වනාන්තර ප්‍රතිස්ථාපන වැඩසටහන්, වැව්තාවුළු සංරක්ෂණය, ආගමික ස්ථානවල පැළ සිටුවීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, කටුපඳුරු සහිත ඉඩම් වනාන්තර බවට පත් කිරීම, අත්හැර දමන ලද ගෙවතු වනාන්තර බවට පත් කිරීම, රණවිරු රුක්රෝපණය යන විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ සිදු කරන ලදී.

**(i) ස්වභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලද වනාන්තර (Assisted natural regeneration (NEW ANR)**

ස්වභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ වැඩසටහන් යටතේ මොණරාගල,හම්බන්තොට,අම්පාර හා කිලිනොච්චි දිසාවල හෙක්.108 ප්‍රතිස්ථාපනය කර ඇත.

(ii) **ස්වභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලද වනාන්තර නඩත්තු (ANR Maintain)**

ස්වභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ වැඩසටහන් යටතේ අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව,මන්නාරම,කිලිනොච්චිය,මුලතිව් දිස්ත්‍රික්කයන්හි හෙක්. 1909ක භූමි ප්‍රදේශයක නඩත්තු කටයුතු සිදුකරන ලදී.

 

*රූපය 2.1 පුබුදුගම ANR වගාව*

**(iii) හායනයට පත් වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීම** (New Restoration)

අනුරාධපුර, මොණරාගල, හම්බන්තොට, පුත්තලම, රත්නපුර, වව්නියාව, මුලතිව් හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි හෙක්.253ක් ප්‍රතිස්ථාපනය කරන ලදි.

**(iv) ප්‍රතිස්ථාපිත කඩොලාන වනාන්තර නඩත්තු කිරීම**

පරිහානියට පත්වී ඇති කඩොලාන ප්‍රතිස්ථාපනය යටතේ පසුගිය වසරවල පුත්තලම, මුලතිව්, අම්පාර, මඩකලපුව, කළුතර, ත්‍රිකුණාමලය, ගම්පහ යන දිස්ත්‍රික්ක 07ක ආරම්භ කරන ලද ප්‍රතිස්ථාපන කටයුතුවලින් හෙක්ටයාර 250ක නඩත්තු කටයුතු සිදු කරන ලදී.



*රූපය 2.2 ප්‍රතිස්ථාපිත කඩොලාන නඩත්තුව*

**(v) ප්‍රතිස්ථාපිත වනාන්තර නඩත්තු කිරීම**

ප්‍රතිස්ථාපනය කරන ලද වනාන්තර නඩත්තු කිරීම යටතේ අනුරාධපුරය, රත්නපුරය, ත්‍රිකුණාමලය, කළුතර, මොණරාගල, වවුනියාව, මුලතිව්, මන්නාරම, කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක 09ක හෙක්ටයාර 146.5 ක වනාන්තර නඩත්තු කටයුතු සිදුකරන ලදී.

**(vi) රණවිරු රුක් රෝපණය හා නඩත්තුව**

රණවිරු රුක් රෝපණ නඩත්තු වැඩසටහන යටතේ මොණරාගල, අම්පාර, ගාල්ල දිස්ත්‍රික්කයන්හි හෙක්ටයාර 47ක භූමි ප්‍රදේශයක රණවිරු රුක් රෝපණ නඩත්තු කටයුතු සිදු කරන ලදී.

**(vii) කටු පඳුරු සහිත ඉඩම්වල ස්ථාපිත කළ වන වගා නඩත්තු කිරීම**

අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් යන දිවයිනේ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි හෙක්ටයාර 622.3ක නඩත්තු සිදුකරන ලදි

**(viii*)* වැව් තාවුලුවල වගා කරන ලද වනවගා නඩත්තු**

අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, හම්බන්තොට, මහනුවර, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව, මන්නාරම, කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක 18ක විවිධ ස්ථානවල හෙක්ටයාර 183 ක නඩත්තු කටයුතු සිදුකරන ලදි.

**(*ix*) ආගමික ස්ථානවල රුක් සිටුවීම/නඩත්තු කිරීම**

අනුරාධපුර මහමෙව්නා උයන තුළ හෙක්.04 භූමි ප්‍රදේශයක සිටුවන ලද පැළ නඩත්තු කටයුතු සිදු කරන ලදි.



රූපය 2.3: *ආගමික ස්ථානවල රුක් සිටුවීම/නඩත්තු කිරීම*

**(x) ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම.**

පුත්තලම දිසාවේ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම් නඩත්තු හෙක්.180 සිදු කිරීම.

## 2.1.1.2 කැලෑ ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ක්ෂේත්‍රයේ සියළුම නිලධාරීන්ගේ සහාය ඇතිව දිවයින පුරා කැලෑ ගිනි පාලනය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 256 ක් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 152ක් පවත්වන ලදී. දිසා වන නිලධාරීන් විසින්, ගිනි නිවීම් සඳහා අවශ්‍ය වන ගිනි පාලන උපකරණ කට්ටල 38ක් මිලදී ගෙන ඇත. තවද, ගිනි ඇතිවීම වැලැක්වීම සඳහා විවිධ වනාන්තර ආශ්‍රිත කි.මී 39.72 ක ගිනි පටි කැපීම හා කි.මී 16.15 ක නඩත්තු කටයුතු සිදු කර ඇත.

## 2.1.1.3. දෙපාර්තමේන්තු වැඩසටහන - 2025 නඩත්තු

වගුව 2.1: *දෙපාර්තමේන්තු වැඩසටහන - 2025 නඩත්තු*

| කාර්යය | ඉලක්ක 2025 භෞතික (හෙක්.) | ඉලක්ක - 2025 මූල්‍ය (රු.) මිලියන | මූල්‍ය ප්‍රගතිය (රු.) මිලියන | භෞතික ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|---|---|
| වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පැල නිෂ්පාදනය කිරීම. | පැල 62,500 | 6.25 | | පැල 62,400 |
| භායනයට පත් වනාන්තර නැවත ප්‍රතිස්ථාපනය කිරීම | 100 | 39.52 | | 100 |
| ප්‍රතිස්ථාපිත වනාන්තර නඩත්තු කිරීම | 3,458 | 138.32 | | 3,426 |
| ආගමික ස්ථානවල ස්ථාපිත වනාන්තර නඩත්තු කිරීම | 4 | 0.16 | | 4 |
| කඩොලාන ස්ථාපිත ප්‍රදේශ පිරිසිදු කිරීම. (Clean Sri Lanka) | 200 | 2.75 | 192.3 | 195 |
| ප්‍රතිස්ථාපිත වනාන්තර ආරක්ෂණය හා කළමනාකරණය සිදු කිරීම | 102 | 2.00 | | 102 |
| අලි ඇතුන් සිටින වාසස්ථාන වැඩිදියුණු කිරීම. | 56.9 | 5.30 | | 41.9 |
| <u>කැලෑ ගිනි පාලනය</u><br>i.ගිනිපටි ස්ථාපනය කිරීම | 45.75 | | | කිලෝ.මී.39.72 |
| ii.ගිනිපටි නඩත්තු කිරීම | 33.41 | | | කිලෝ.මී.16.15 |
| iii.ගිනි උපකරණ කට්ටල මිලදී ගැනීම | 46 | | | කට්ටල -38 |
| iv.කලෑ ගිනි පාලනය කිරීමේ වැඩයටහන් පැවැත්වීම | 375 | 20 | 19.67 | වැඩසටහන් - 256 |
| v.දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 200 | | | වැඩසටහන් - 152 |

## 2.1.1.4: වන ආවරණය ඉහළ නැංවීම සඳහා පුද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම

**1.1) පුද්ගලික අංශයේ දායකත්වයෙන් සිදු කරනු ලබන ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (CSR ව්‍යාපෘති)**

**2023 වර්ෂයේ, පුද්ගලික අංශය සමඟ ස්ථාපිතකර මේ දක්වා ක්‍රියාත්මක කඩොලාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘති.**

- Mas Foundation for Change ආයතනය සමඟ සිදු කරන කඩොලාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හෙක්. 5 ක් කඩොලාන භූමි ප්‍රතිස්ථාපනය කර ඇත.
- Mas capital ආයතනය සමඟ සිදු කරන කඩොලාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හෙක්. 4 ක් කඩොලාන භූමි ප්‍රතිස්ථාපනය කර ඇත.

- Hayleys (PVT) Ltd ආයතනය සමඟ සිදු කරන කඩොලාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ හෙක්. 8.9 ක් කඩොලාන භූමි ප්‍රතිස්ථාපනය කර ඇත.

**1.2) 2025 වර්ෂයේ පුද්ගලික අංශය සමඟ ආරම්භකරන ලද කඩොලාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘති.**

- Walters bay tea exports ආයතනය සමඟ සිදු කරන කඩොලාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හෙක්. 1.9 ක් කඩොලාන භූමි ප්‍රතිස්ථාපනය කර ඇත.

- Sampath Bank ආයතනය සමඟ සිදු කරන කඩොලාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හෙක්. 1 ක් කඩොලාන භූමි ප්‍රතිස්ථාපනය කර ඇත.

- ATG Hands (PVT) Ltd ආයතනය සමඟ සිදු කරන කඩොලාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හෙක්. 2 ක් කඩොලාන භූමි ප්‍රතිස්ථාපනය කර ඇත.

**1.3) 2025 වර්ෂයේ පුද්ගලික අංශය සමඟ ආරම්භ කරන ලද වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘති.**

- Hidramani International Export (PVT) Ltd ආයතනය සමඟ සිදු කරන වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් රත්නපුර දිස්ත්‍රික්කයේ හෙක්. 1 ක භූමි වපසරියකින් යුතුව වනාන්තර ප්‍රතිස්ථාපනය කර ඇත.

- TERN ආයතනය සමඟ සිදු කරන වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්. 17 ක භූමි වපසරියකින් යුතුව වනාන්තර ප්‍රතිස්ථාපනය කර ඇත.

- Lanka Pay (PVT) Ltd ආයතනය සමඟ සිදු කරන වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ හෙක්. 0.5 ක භූමි වපසරියකින් යුතුව වනාන්තර ප්‍රතිස්ථාපනය කර ඇත.

**2. 2025 වර්ෂයේ පුද්ගලික අංශය සමඟ ආරම්භ කරන ලද ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමේ ව්‍යාපෘති.**

- Gen Green Plantation ආයතනය සමඟ සිදු කරන කලපු අන්දර ඉවත් කිරීමේ ව්‍යාපෘතිය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ හෙක්. 78 ක ආක්‍රමණික ශාක ඉවත් කර ඇත.

- Gen Green Plantation ආයතනය සමඟ සිදු කරන කලපු අන්දර ඉවත් කිරීමේ ව්‍යාපෘතිය මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ හෙක්. 5 ක ආක්‍රමණික ශාක ඉවත් කර ඇත.

**3. CBD (Convention of Biological Diversity), NBSAP 2026-2030 (National Biodiversity Strategic Action Plan) යාවත්කාලින කිරිම සඳහා පරිසර අමාත්‍යාංශය වෙත අවශ්‍ය සහාය ලබාදීම.**

## 2.1.2 වන කළමනාකරණ සැලසුම් යාවත්කාලීන කිරීම, සකස් කිරීම සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය

නව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම, වනාන්තර සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම, වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම, වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂ සංරක්ෂණය කිරීම, වන සංරක්ෂණ

දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිලධාරීන් හට පහසුකම් සැපයීම, පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධව වැඩමුළු පැවැත්වීම, IUCN ආයතනය සමඟ සහයෝගිතාව වර්ධනය කර ගැනීම.

මෙහිදී 2025 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලස්මට අනුව දිස්ත්‍රික්ක 21 ක් මූලික කරගනිමින් නව වන කළමනාකරණ සැලසුම් 100 ක් සකස් කිරීමට තිබු අතර නව වන කළමනාකරණ සැලසුම් 215 ක් සකස් කර අවසන් කර ඇත. වනාන්තර සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් 03 ක් සකස් කර ඇත. තව ද වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 05 ක් පවත්වා ඇත. 2025 වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන වැඩසටහන් 07 ක් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් නකල්ස් සංරක්ෂිතය, සිංහරාජය රක්ෂිතය හා සංවේදී පරිසර පද්ධති මූලික කර ගනිමින් පවත්වා ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිලධාරීන් හට පහසුකම් සැපයීම, පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධව වැඩමුළු 03 ක් පැවැත්වීම, IUCN ආයතනය සමඟ සහයෝගීතාව වර්ධනය කර ගැනීම.

*වගුව 2.2 - පරිසර කළමනාකරණ කටයුතු*

| **අනු. අංකය** | **වැඩසටහන** | **2025.12.31 දින වන විට අවසන් කළ යුතු ප්‍රධාන සංවර්ධන වැඩසටහන් ප්‍රමාණය** | **2025.12.31 දින වන විට ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල ලබා ඇති භෞතික ප්‍රගතිය** | **%** |
|---|---|---|---|---|
| 2.1.2.1 | ස්වාභාවික වානාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම | ස්වාභාවික වානාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 100 ක් සකස් කිරීම. | ස්වාභාවික වානාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 100 ක් සකස් කර ඇත. | 100%+ |
| 2.1.2.2 | වනාන්තර සංකිර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම. | නිල්ගල රක්ෂිතය, වීරක්කොඩිචොලේ රක්ෂිතය හා පිදුරුතලාගල සංරක්ෂිතය වනාන්තර සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම | නිල්ගල රක්ෂිතය, වීරක්කොඩිචොලේ රක්ෂිතය හා පිදුරුතලාගල සංරක්ෂිතය වනාන්තර සංකීර්ණය සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කර ඇත | 100% |
| 2.1.2.3 | වන කළමණාකරණ සැලසුම් සකස් | වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් | වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 05 ක් පවත්වා ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම | කිරීම සඳහා වැඩමුළු 03 ක් පැවැත්වීම | | 100%+ |
| 2.1.2.4 | වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂ සංරක්ෂණය කිරීම (2025-2030) | වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂ 05 සංරක්ෂණය කිරීම | ශාක හඳුනාගැනීම (*Balanocarpus kitulgallensis / Stemonoporus gracilis*) / උද්භිත උද්‍යාන නිලධාරින් විසින් බහිර් සංරක්ෂණය පිළිබඳව පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි. ශාක විශේෂ හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කරන ලදි. (*Stemonoporus moonii thwaites, Mesua stylosa, Balanocarpus kitulgallensis*). තෙත් කලාපය තුළ තිබෙන වඳවී යාමේ තර්ජනයට මුහුණ පා තිබෙන ශාක පිළිබඳ ප්‍රජාව දැනුවත් කරන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් වඳවි යාමේ තර්ජනයට මුහුණ පා ඇති ශාක පිළිබඳ දැනුවත් කරන ලදී. *Balanocarpus kitulgallensis* ශාකයේ පැල 50ක් ද, *Stemonoporus gracilis* ශාකයේ පැල 50ක් ද, *Syzygium amphoraecarpus* ශාකයේ පැල 2500ක් ද, *Syzygium fergusonii* ශාකයේ පැල 100ක් ද, *Ilex knucklesensis* ශාකයේ පැල 500ක් ද, *Ceropegia lankana* ශාකයේ පැල 200ක් ද, *Dialium ovoideum* ශාකයේ පැල 100ක් ද, *Mangifera zeylanica* ශාකයේ පැල 200ක් ද, *Mesua stylosa* ශාකයේ පැල 200ක් ද, සාර්ථකව පැල කර ඇත. තර්ජනයට ලක්ව ඇති විශේෂ පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු 10ක් ප්‍රදර්ශනය කර ඇත. | 100% |
| 2.1.2.5 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 12 පැවැත්වීම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන වැඩසටහන් 07 හා දැනුවත් කිරීමේ වැඩසටහන් 10 නකල්ස් සංරක්ෂිතය, සිංහරාජය රක්ෂිතය හා සංවේදී පරිසර පද්ධති මූලික කරගනිමින් පවත්වා ඇත. | 100% + |

| | | | | |
|---|---|---|---|---|
| 2.1.2.6 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිලධාරින් හට පහසුකම් සැපයීම, පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධව වැඩමුළු පැවැත්වීම, IUCN ආයතනය සමඟ සහයෝගිතාව වර්ධනය කර ගැනීම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිලධාරින් හට පහසුකම් සැපයීම, පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධව වැඩමුළු 03 පැවැත්වීම, IUCN ආයතනයේ සාමාජික මුදල් ගෙවීම් කිරීම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිලධාරින් හට පහසුකම් සැපයීම, පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධව වැඩමුළු 03 පවත්වා ඇත. IUCN ආයතනයේ සාමාජික මුදල් ගෙවීම් කර ඇත. | 100% |

## 2.1.3 ස්ථිර වනාන්තර පද්ධතියක් ස්ථාපිත කිරීම මඟින් දැනට ඇති වනාන්තර ආරක්ෂා කිරීම

### 2.1.3. 1 වනාන්තර මායිම් සළකුණු කිරීම හා සිතියම් සකස් කිරීම

වනාන්තර මායිම් සළකුණු කිරීම හා සිතියම් සකස් කිරීම යටතේ 2025 වර්ෂයේදී වනාන්තර මායිම් වල මායිම් නිරූපණය සඳහා දිස්ත්‍රික්ක 12ක පිහිටි රක්ෂිත, සංරක්ෂිත හා අනෙකුත් කැළෑවන්හි කි.මී. 1546.08 ප්‍රමාණයක මායිම් කණු සිටුවා අවසන් කර ඇති අතර, වනාන්තර මායිම් GPS මගින් මැනුම් කිරීම, සිතියම් සකස් කිරීම සහ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම යටතේ දිස්ත්‍රික්ක 9ක වනාන්තර මායිම් කි.මී. 1071 ප්‍රමාණයක් GPS මගින් මැනුම් කර, සිතියම් සකස් කර අවසන් කර ඇත. එසේම හෙක්ටයාර් 47058.32 ක ප්‍රමාණයක් ආවරණය වන පරිදි රක්ෂිත වනාන්තර 20 ක් හා කඩොලාන වනාන්තර 9 ක් වශයෙන් වනාන්තර 29 ක් ගැසට් කරන ලදී.

### 2.1.3.2 ජාතික වන සංගණන නියැදි දත්ත ලබා ගැනීම

2025 වර්ෂයේදී ජාතික වන සංගණන දත්ත රැස් කිරීම යටතේ, නියැදි 782ක දත්ත රැස් කිරීම සිදු කරන ලදි. 2020 වර්ෂයේදී පළමු චක්‍රය යටතේ දත්ත ලබාගත් ස්ථානවලම 2025 වර්ෂයේදී දෙවන චක්‍රය යටතේ දත්ත ලබා ගැනීම සිදු කරන ලදි.

### 2.1.3.3 වාණිජ වන වගා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා සාම්පල් ලබා ගැනීම

වානිජ වන වගා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා සාම්පල් ලබා ගැනීම සිදු කළ අතර, එහිදී දිස්ත්‍රික්ක 4ක හෙක්ටයාර් 942.57ක සාම්පල් 375 ක් ලබාගෙන අවසන් කර ඇත.

## 2.1.4 වන ව්‍යාප්තිය හා දැනුවත් කිරීම

### 2.1.4.1 ගොවි වන වගා ස්ථාපනය කිරීම.

2025 වර්ෂයේ ගොවි වන වගා හෙක්ටයාර් 228.4 ස්ථාපනය සිදු කරන ලද අතර, ඒ සඳහා ගොවීන් 422ක් සහභාගී කරගනු ලැබිය.

*වගුව 2.3 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගොවි වන වගා ස්ථාපනය කිරීම*

| දිසාව | ස්ථාපිත ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.) | නිපදවූ පැළ සංඛ්‍යාව | සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| බදුල්ල | 80.00 | 8800 | 183 |
| මොණරාගල | 53.60 | 124300 | 71 |
| මාතලේ | 3.00 | 3000 | 3 |
| මහනුවර | 4.00 | 4500 | 10 |
| අනුරාධපුර | 49.80 | 46200 | 119 |
| හම්බන්තොට | 25.00 | 26000 | 18 |
| පුත්තලම | 13.00 | 13000 | 21 |
| **එකතුව** | **228.40** | **225800** | **425** |




*රූපය 2.4 : ගොවි වන වගා ස්ථාපනය කිරීම*

### 2.1.4.2 ස්ථාපිත ගොවි වන වගා පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු

2023 වර්ෂය තුළ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 386.36 ක්ද, 2024 වර්ෂය තුළ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 74.6 ක්ද විද්‍යාත්මකව කළමනාකරණය කරන ලදී.

*වගුව 2.4 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2023/2024 වසරවල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම*

| දිසාව | 2023 ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.) | 2024 ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|
| බදුල්ල | 39.76 | 15.00 |
| මොණරාගල | 38.00 | 24.00 |
| මාතලේ | 46.80 | - |
| මහනුවර | 4.00 | 6.60 |
| පොළොන්නරුව | 60.00 | - |
| අනුරාධපුර | 130.60 | - |
| මඩකලපුව | 5.00 | - |
| මුලතිව් | 40.00 | - |
| වව්නියාව | 28.00 | 9.00 |
| රත්නපුර | 15.00 | 20.00 |
| කුරුණෑගල | 20.00 | - |
| පුත්තලම | 10.00 | - |
| **එකතුව** | **437.16** | **74.60** |





*රූපය 2.5 : ගොවි වන වගා නඩත්තු කිරීම*

## 2.1.4.3 බීජ පැළ හා පැළ තවාන් නඩත්තුව

මේ යටතේ දිවයින පුරා ඇති දිසා වන කාර්යාලවලට අනුබද්ධ පැල තවාන්වල ඉතිරිව ඇති පැල 500,000 ක් නඩත්තු කිරීම සඳහා කටයුතු කර ඇත.




*රූපය 2.6 : බීජ පැළ නඩත්තුව*

### 2.1.4.4 පැළ තවාන් සංවර්ධනය කිරීම

2026 වර්ෂය තුල මහනුවර, මාතලේ, ගම්පහ, පොලොන්නරුව, හම්බන්තොට හා මාතර යන දිසාවන් තුල පිහිටි දෙපාර්තමේන්තු පැළ තවාන් 06ක් සංවර්ධනය කරන ලදි. එහිදී තවාන් භූමියේ කාණු පද්ධතිය සකස් කිරීම,තවාන් භූමි සැකසීම, ගේට්ටුව අළුත්වැඩියා කිරීම, වතුර මෝටරය පිළිසකර කිරීම, ජල නල පද්ධති අළුත්වැඩියාව හා ජල ටැංකියට බෝල්වැල් සවි කිරීම, විල්බැරෝවක් මිලදී ගැනීම, විසිරුම් ජල සම්පාදන පද්ධතිය නඩත්තුව, ටැක්ටර් ටේලරයේ හා බවුසරයේ සුළු අළුත්වැඩියා සිදු කිරීම, තවාන් ප්‍රවේශ මාර්ග අළුත්වැඩියා කිරීම, තවාන් වැට සකස් කිරීම, තවාන් උපකරණ මිලදී ගැනීම වැනි ක්‍රියාකාරකම් රැසක් සිදු කර ඇත.





*රූපය 2.7: පැළ තවාන් සංවර්ධනය කිරීම*

### 2.1.4.5 වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම

පරිසර සංරක්ෂණ, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණ, ජෛව විවිධත්වය සංරක්ෂණයෙහිලා පාසල් සිසුන් හා ප්‍රජාව නැඹුරු කිරීම, ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගිනි කළමනාකරණ වැඩසටහන්, ශ්‍රමදාන, ක්ෂේත්‍ර චාරිකා, පරිසර කඳවුරු හා වෙනත් විශේෂ වැඩසටහන් 783ක් ක්‍රියාත්මක කරන ලදි.

*වගුව 2.5: දීප ව්‍යාප්ත වන ව්‍යාප්ති වැඩසටහන්*

| වැඩසටහන් වර්ගය | සංඛ්‍යාව |
|---|---:|
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 633 |
| වැඩමුළු | 14 |
| ගිනි කළමනාකරණ වැඩසටහන් | 71 |
| ශ්‍රමදාන | 6 |
| ප්‍රදර්ශන | 1 |
| තරඟ | 25 |
| ක්ෂේත්‍ර චාරිකා | 15 |
| වෙනත් විශේෂ වැඩසටහන් | 18 |
| **එකතුව** | **783** |



*රූපය 2.8: වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම*

## 2.1.4.6 ගෙවතු සංවර්ධන  වැඩසටහන් පැවැත්වීම

ගෙවතු 5,000 ක් සඳහා සුදුසු පැළ සපයා දීමෙන් සහ තාක්ෂණික සහය ලබා දීමෙන් සංවර්ධනය කරන ලදි.

*වගුව 2.6: දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගෙවතු සංවර්ධනය කිරීම*

| දිසාව | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සංවර්ධනය කරන ලද ගෙවතු |
|---|---|
| බදුල්ල | 210 |
| මොණරාගල | 210 |
| නුවරඑළිය | 210 |
| මාතලේ | 210 |
| මහනුවර | 210 |
| පොළොන්නරුව | 220 |
| අනුරාධපුර | 220 |
| මඩකලපුව | 220 |
| අම්පාර | 220 |
| ත්‍රිකුණාමලය | 220 |
| කිලිනොච්චිය | 225 |
| මන්නාරම | 225 |
| මුලතිව් | 225 |
| වව්නියාව | 225 |
| මාතර | 210 |
| රත්නපුර | 210 |
| කෑගල්ල | 210 |
| හම්බන්තොට | 210 |
| ගාල්ල | 210 |
| කුරුණෑගල | 225 |
| කළුතර | 225 |
| පුත්තලම | 225 |
| ගම්පහ | 225 |
| **එකතුව** | **5000** |



*රූපය 2.9: ගෙවතු සංවර්ධනය කිරීම*

### 2.1.4.7 බීජ පැළ නිෂ්පාදනය කිරීම

වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන තවාන් පැළ 412,500 ක සංඛ්‍යාවක් 2025 වසර තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල නිපදවන ලදි. නිපදවන ලද සම්පූර්ණ තවාන් පැළ සංඛ්‍යාවෙන් පැළ 92,990ක් අලෙවි කරන ලද අතර 194,068ක් විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා හා රාජ්‍ය සහ වෙනත් විවිධ ආයතන වෙත නොමිලයේ ලබාදෙන ලදි. තවත් කොටසක් ජාතික රුක් රෝපණ වැඩසටහන් හා ගෙවතු සංවර්ධන වැඩසටහන් වැනි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා යොදා ගන්නා ලදි.

*වගුව 2.7 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ බීජ පැල නිෂ්පාදනය කිරීම*

| දිසාව | දෙපාර්තමේන්තු බීජ පැළ | | |
|---|---|---|---|
| | **9*6** | **8*12** | **12*18** |
| මොණරාගල | 12,500 | 3,500 | 1,000 |
| නුවරඑළිය | 5,000 | - | - |
| මහනුවර | 10,000 | 2,500 | - |
| පොළොන්නරුව | 15,000 | - | - |
| අනුරාධපුර | 30,000 | 5,000 | 5,000 |
| මඩකලපුව | 9,000 | 500 | 500 |
| අම්පාර | 10,000 | - | 2,000 |
| ත්‍රිකුණාමලය | 20,000 | - | - |
| කිලිනොච්චිය | 35,000 | - | - |
| මන්නාරම | 21,000 | 1,000 | - |
| වව්නියාව | 15,000 | 3,000 | 2,000 |
| මාතර | 40,000 | - | 1,000 |
| රත්නපුර | 30,000 | - | - |
| කෑගල්ල | 20,500 | 13,200 | 2,000 |
| හම්බන්තොට | 30,000 | - | 1,800 |
| ගාල්ල | - | 2,500 | - |
| කුරුණෑගල | 21,000 | - | - |

| | | | |
|---|---|---|---|
| පුත්තලම | 12,000 | 5,000 | 4,000 |
| කළුතර | 15,000 | 5,000 | 1,000 |
| **එකතුව** | **351,000** | **41,200** | **20,300** |



*රූපය 2.10: බීජ පැල නිෂ්පාදනය කිරීම*

## 2.1.4.8 පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් සිදු කිරීම

පාසල් හා ප්‍රජා සහභාගිත්වයෙන් මාර්ග දෙපස, ජලාධාර අවට හා ගං ඉවුරුවල, පාසැල් හා රාජ්‍ය ආයතන භූමිවල, ආගමික සිද්ධස්ථාන භූමිවල මෙන්ම වෙනත් ස්ථානවල රුක්රෝපණ වැඩසටහන් 637ක් ක්‍රියාත්මක කරන ලදි.

*වගුව 2.8: දීප ව්‍යාප්ත රුක්රෝපණ වැඩසටහන්*

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| මාර්ග දෙපස රුක් රෝපණය | 84 |
| ජලාධාර අවට හා ගං ඉවුරුවල රුක් රෝපණය | 63 |
| පාසැල්වල රුක් රෝපණය | 127 |
| රජයේ ආයතන භූමිවල රුක් රෝපණය | 216 |
| ආගමික සිද්ධස්ථාන භූමිවල රුක් රෝපණය | 64 |
| නාගරික භූමිවල රුක් රෝපණය | 6 |
| වෙනත් ස්ථානවල රුක්රෝපණ | 77 |
| **එකතුව** | **637** |





*රූපය 2.11: රුක් රෝපණ වැඩසටහන් සිදු කිරීම*

### 2.1.4.9 මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන්

මොණරාගල, ත්‍රිකුණාමලය, මන්නාරම, වවුනියාව, මාතර, රත්නපුර, කුරුණෑගල, හම්බන්තොට, ගම්පහ යන දිසාවන්හී මාර්ග දෙපස රුක් රෝපණ කිලෝමීටර් 25ක් සිදු කර ඇත. මෙය Clean Sri Lanka වැඩසටහන යටතේ සිදු කරන ලද වැඩසටහනකි.

*වගුව 2.9: මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන*

| **දිසාව** | **මුලු ඉලක්කය (කි.මී)** |
|---|---|
| බදුල්ල | 1 |
| මොණරාගල | 1 |
| නුවරඑළිය | 1 |
| මාතලේ | 2 |
| මහනුවර | 1 |
| පොළොන්නරුව | 1 |
| අනුරාධපුර | 1 |
| අම්පාර | 1 |
| ත්‍රිකුණාමලය | 1 |
| කිලිනොච්චිය | 2 |
| මන්නාරම | 1 |
| වවුනියාව | 1 |
| මාතර | 1 |
| රත්නපුර | 1 |
| කෑගල්ල | 1 |
| හම්බන්තොට | 1 |
| ගාල්ල | 1 |
| කුරුණෑගල | 1 |
| කළුතර | 2 |
| පුත්තලම | 1 |
| ගම්පහ | 2 |
| **එකතුව** | **25** |





*රූපය 2.12: මාර්ග දෙපස රුක් රෝපණය*

### 2.1.4.10 නාගරික තුරුගොමු ස්ථාපනය

මාතලේ, අම්පාර, හා රත්නපුර යන දිසාවන්හී නාගරික තුරුගොමු 5ක් ස්ථාපනයට කටයුතු කරන ලදී.

*වගුව 2.10: නාගරික තුරුගොමු ස්ථාපනය*

| දිසාව | තුරුගොමු ගණන |
|---|---|
| බදුල්ල | 2 |
| මහනුවර | 1 |
| පොළොන්නරුව | 2 |
| **එකතුව** | **5** |





*රූපය 2.13: නාගරික තුරුගොමු ස්ථාපනය*

### 2.1.4.11 වනාන්තර ආශ්‍රිත මාර්ග දෙපස කැලි කසළ ඉවත් කිරීම

මේ යටතේ දිවයින පුරා ප්‍රධාන වැඩසටහන් 50ක් පවත්වා ඇත. මෙය Clean Sri Lanka වැඩ සටහන යටතේ සිදු කරන ලද වැඩසටහනකි.

*වගුව 2.11: වනාන්තර ආශ්‍රිත මාර්ග දෙපස කැලි කසළ ඉවත් කිරීම*

| දිසාව | වැඩසටහන් ගණන |
|---|---|
| බදුල්ල | 02 |
| මොණරාගල | 02 |
| නුවරඑළිය | 02 |
| මාතලේ | 02 |
| මහනුවර | 03 |
| පොළොන්නරුව | 02 |
| අනුරාධපුර | 02 |
| මඩකලපුව | 02 |
| අම්පාර | 02 |
| ත්‍රිකුණාමලය | 02 |
| කිලිනොච්චිය | 02 |
| මන්නාරම | 02 |
| මුලතිව් | 02 |

| | |
|---|---|
| වවුනියාව | 02 |
| මාතර | 02 |
| රත්නපුර | 02 |
| කෑගල්ල | 03 |
| හම්බන්තොට | 02 |
| ගාල්ල | 03 |
| කුරුණෑගල | 03 |
| කළුතර | 02 |
| පුත්තලම | 02 |
| ගම්පහ | 02 |
| **එකතුව** | **50** |





*රූපය 2.14: වනාන්තර ආශ්‍රිත මාර්ග දෙපස කැලි කසළ ඉවත් කිරීම*

## 2.1.5 වානිජ වන වගා ස්ථාපිත කිරීම

### 2.1.5.1 වානිජ වන වගා ස්ථාපිත කිරීම (RCT)

පරිණත වූ වානිජ වනවගා හෙක්ටයාර් 798.79ක් හෙළීම් සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත භාර දී ඇත. (අනුරාධපුර, මඩකලපුව, ත්‍රිකුණාමලය, පොලොන්නරුව, මොණරාගල, මාතලේ, මහනුවර, නුවරඑළිය, බදුල්ල, වවුනියාව, මුලතිව්, කිලිනොච්චිය, කුරුණෑගල, පුත්තලම, කළුතර) ඉන් වන වගා හෙක්ටයාර් 688.31 ක් 2025 වර්ෂයේ දී රාජ්‍ය දැව සංස්ථාව විසින් හෙළීම් අවසන් කර නැවත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර, එහි වනවගා ප්‍රතිස්ථාපනය සිදුකර අවසන් කර ඇත.

### 2.1.5.2 පැළ තවාන් ස්ථාපනය හා නඩත්තු

නැවත වනවගා කිරීමේ වැඩසටහන සඳහා හෙක්ටයාර් 798.79 කට අවශ්‍ය බීජ පැල නිෂ්පාදනය කර, මාස 10කට ආසන්න කාලයක් තවාන් තුළ නඩත්තු කිරීම සිදු කරනු ලබයි. මෙහි දී තවාන් තුළ තේක්ක, ඉයුකැලිප්ටස්, කායා, හල්මිල්ල හා දේශීය විශේෂ නිෂ්පාදනය කර ඇත.

### 2.1.5.3 නොමේරූ වනවගා නඩත්තු

රාජ්‍ය දැව සංස්ථාව විසින් පූර්ණ හෙළීම් සිදුකර නැවත වනවගා සිදු කරන ලද පසුගිය වසර 03 ක නොමේරූ වනවගා හෙක්ටයාර් 2,202.69 කින් හෙක්ටයාර් 2,191.69 ක් නඩත්තු කටයුතු 2025 වර්ෂයේ දී සිදුකර ඇත. එහි දී වල් නෙලීම, පොහොර යෙදීම, ගිනි වැලැක්වීම හා පාළු පැළ සිටුවීම යන

ප්‍රධාන ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. ඒ අනුව 2024 වර්ෂයේ දී ස්ථාපිත වනවගා නඩත්තුව වාර 03 ක් ද, 2023 වර්ෂයේ දී ස්ථාපිත වනවගා නඩත්තුව වාර 02 ක් ද හා 2022 වර්ෂයේ ස්ථාපිත වනවගා වාර 01 ක් ද නඩත්තු කරන ලදී.

### 2.1.5.4 පූර්ණ වානිජ තුනී කිරීම්

මොණරාගල, බදුල්ල, මාතලේ, කුරුණෑගල, වවුනියාව, හම්බන්තොට, පුත්තලම යන දිස්ත්‍රික්කවල හෙක්ටයාර් 305 ක් පූර්ණ වානිජ තුනී කිරීම් කර ඇත.

### 2.1.5.5 වානිජ තුනී කිරීම්.

රත්නපුර, හම්බන්තොට, බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, කුරුණෑගල යන දිස්ත්‍රික්කවල හෙක්ටයාර් 522.20 ක වානිජ තුනී කිරීම් කර ඇත.

### 2.1.5.6 පසුහෙලීම් සංගණනය

බදුල්ල, මාතලේ , නුවරඑළිය, මහනුවර, කුරුණෑගල, හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුළ පසු හෙලීම් සංගණන හෙක්ටයාර් 569.80 ක් කර ඇත.

### 2.1.5.7 කඳුමුදුන් වනවගා සඳහා බීජ පැල නිෂ්පාදනය

කඳුමුදුන් වනවගා ස්ථාපිත කිරීම සඳහා බීජ පැළ 21,000ක් නිෂ්පාදනය කර ඇත.

### 2.1.5.8 කඳුමුදුන් සංරක්ෂණය

කඳුමුදුන් සංරක්ෂණ වනවගා ස්ථාපිත කිරීම යටතේ නුවරඑළිය, බදුල්ල යන දිස්ත්‍රික්ක තුළ කඳුමුදුන් වනවගා හෙක්ටයාර් 20 ක් සිදුකර ඇත.

### 2.1.5.9 පයිනස් වන වගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම.

පුද්ගලික අංශයේ සමාගම් 05 ක පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම, සාලිය බණ්ඩාර මහතා, වානක සමරවීර මහතා, ඔරියන්ටල් රෙසින් (පුද්.) සමාගම සහ විලව් මොබයිල් ආයතනය සිය වානිජ මට්ටමේ රෙසින් නිස්සාරණ කටයුතුවලට අදාළ ගිවිසුම් දීර්ඝ කරන ලද අතර එම වනවගාවල රෙසින් නිස්සාරණ කටයුතු 2025 වර්ෂය පුරා සිදු කරන ලදී. හෙක්.217.2 ක ඉඩම් ප්‍රමාණයක් රෙසින් නිස්සාරණ කටයුතු සඳහා පුද්ගලික අංශය වෙත බදු දී ඇති අතර, 2025 වර්ෂයේදී ඉන් ලද ආදායම රුපියල් මිලියන 5.83 කි.

*වගුව 2.12: පයිනස් වන වගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම*

| සංවිධානයේ නම | බදු දුන් ඉඩම් ප්‍රමාණය (හෙක්.) | බදු ආදායම (රුපියල්) |
|---|---|---|
| 1. පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම | 66.5 | 1,010,477.00 |
| 2. සාලිය බණ්ඩාර | 14.6 | 2,296,579.99 |
| 3.වානක සමරවීර | 41.8 | 505,780.00 |
| 4. ඔරියන්ටල් රෙසින් (පුද්.) සමාගම | 7.8 | 163,062.90 |
| 5. විලව් මොබයිල් | 86.5 | 1,860,271.27 |
| **එකතුව** | **217.2** | **5,836,171.16** |

### 2.1.5.10 2025 වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය.

රාජ්‍ය දැව සංස්ථාව විසින් 2025 වර්ෂය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ ස්කන්ධ භාගය රුපියල් මිලියන 1,497.00 කි. මෙයට පූර්ණ හෙළීම් මගින් ලබා ගන්නා දැවවල වටිනාකම වන රුපියල් මිලියන 1,405.20 ක් ද, පරිණත වනවගා කළමනාකරණය මගින් ලබා ගන්නා දැවවල වටිනාකම වන රුපියල් මිලියන 82.30 ක් ද, වන අපරාධවලින් අත්පත් කරගෙන රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් දැවවල වටිනාකම වන රුපියල් මිලියන 9.40 ද ඇතුලත් වේ.

### 2.1.5.11 පුද්ගලික අංශයේ නැවත වනවගා කිරීමේ වැඩසටහන 2025

පුද්ගලික අංශය සතු සම්පත් වනවගා සංවර්ධනය සඳහා උපයෝගී කර ගැනීමේ අරමුණින් පුද්ගලික අංශයේ නැවත වනවගා කිරීමේ වැඩසටහන නිර්මාණය කර තිබේ. මෙම වැඩසටහනේ අදියර දෙකක් වසර 2000 දී 2002 දී දියත් කරන ලදී. 2019 වර්ෂයේ දී පුද්ගලික අංශය සමඟ ඇති කර ගත් ගිවිසුම් අනුව හෙක්. 323.12 ක වනවගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ.

*වගුව 2.13: පුද්ගලික අංශයේ නැවත වනවගා කිරීමේ වැඩසටහන 2025*

| දිස්ත්‍රික්කය | අඩවිය | ගිවිසුම් අංකය | විශේෂය | අදියර | | ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | | I | II | (හෙක්.) |
| කුරුණෑගල | ගල්ගමුව | 1108 | තේක්ක | ✓ | | 11.142 |
| | ගල්ගමුව | 1091 | තේක්ක | ✓ | | 6.244 |
| අනුරාධපුරය | අනුරාධපුරය | 2002/01 | තේක්ක | | ✓ | 40.00 |
| | අනුරාධපුරය | 2002/09 | තේක්ක | | ✓ | 83.00 |
| | අනුරාධපුරය | 2002/12 | තේක්ක | | ✓ | 4.00 |
| | අනුරාධපුරය | 17 | තේක්ක | ✓ | | 20.234 |
| පොළොන්නරුව | හබරණ | 2002/26 | මිශ්‍ර විශේෂ | | ✓ | 47.00 |
| මාතලේ | නාඋල | 1180 | තේක්ක | ✓ | | 9.50 |
| | නාඋල | 2002/15 | තේක්ක | | ✓ | 3.00 |
| | නාඋල | 2002/20 | තේක්ක / කායා | | ✓ | 90.00 |
| | නාඋල | 2002/18 | තේක්ක | | ✓ | 5.00 |
| | නාඋල | 2002/16 | තේක්ක | | ✓ | 4.00 |
| **එකතුව** | | | | **04** | **08** | **323.12** |

## 2.1.6 පරිසර සංචාරක කටයුතු

2025 වර්ෂය සඳහා පාරිසරික සංචාරක අංශය වෙත වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.109 කි. එම ප්‍රතිපාදන මගින් පහත සඳහන් පාරිසරික සංචාරක ගමනාන්තවල අත්‍යවශ්‍ය සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීම, පවත්වාගෙන යාම ආදී කටයුතු සිදු කර ඇත.

*වගුව 2.14: පාරිසරික සංචාරක ගමනාන්ත*

| | පාරිසරික සංචාරක ගමනාන්තය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 1 | සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය, කුඩව | රත්නපුර |
| 2 | සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය, පිටදෙනිය | මාතර |
| 3 | කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානය | ගාල්ල |
| 4 | අඬාහැලෙන ඇල්ල | ගාල්ල |
| 5 | කොට්ටව රක්ෂිතය | ගාල්ල |
| 6 | ඔලියගන් කැලේ | මාතර |
| 7 | කුරුළු කැලේ | කෑගල්ල |
| 8 | මාකන්දාව | කෑගල්ල |
| 9 | උඩවත්ත කැලේ | මහනුවර |
| 10 | නකල්ස් සංරක්ෂිතය, ඩීන්ස්ටන් | මහනුවර |
| 11 | නකල්ස් සංරක්ෂිතය, රිවර්ස්ටන් | මාතලේ |
| 12 | කන්දේ ඇල | නුවරඑලිය |
| 13 | කොලපතන ඇල්ල/ මන්දාරම් නුවර | නුවරඑලිය |
| 14 | ඇල්ල රොක් | බදුල්ල |
| 15 | ඔහිය | බදුල්ල |
| 16 | ගල්ඔය පාරිසරික උද්‍යානය | පොළොන්නරුව |
| 17 | හුරුළු පාරිසරික උද්‍යානය | පොළොන්නරුව |
| 18 | එක්ගල්ඔය | අම්පාර |
| 19 | නුවරගල | අම්පාර |
| 20 | ගල්විල පාරිසරික උද්‍යානය | පුත්තලම |

මීට අමතරව සංචාරක ගමනාන්තවල ප්‍රවර්ධන කටයුතු, මාර්ගෝපදේශකයන් පුහුණු කිරීම, පාරිසරික සංචාරක ගමනාන්ත සඳහා ඇතුළු වීමට අවශ්‍ය ප්‍රවේශ පත්‍ර මුද්‍රණ කටයුතු සිදු කර ඇත.




*රූපය 2.15 : සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයට අදාළ නව මාර්ග පුවරු සකස් කිරීම*

සිංහරාජ රක්ෂිතය තුළ ඇති මුලාවැල්ල මංපෙත, හල්මන්දිය දොළ මංපෙත, ගල්ලෙන්යාය මංපෙත, සිංහගල මංපෙත වැනි ස්වාභාවික මංපෙත් නඩත්තු කිරීම





රූපය 2.16 : සිංහරාජ රක්ෂිතය තුළ ඇති ස්වාභාවික මංපෙත් නඩත්තු කිරීම





රූපය 2.17 : සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ පිටදෙනිය ප්‍රවේශ පාලම ප්‍රතිසංස්කරණය කිරීම

සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි පිටදෙණිය ප්‍රවේශ පාලම ප්‍රතිසංස්කරණය කිරීම, විදුලිබල පද්ධතිය සහ භූමි අලංකරණය වැඩිදියුණු කිරීම, අනියම් කම්කරුවන් යොදවා අවශ්‍ය නඩත්තු කටයුතු සහ මෙහෙයුම් කටයුතු සිදු කිරීම හා සිංහරාජ රක්ෂිතය තුළ ව්‍යාප්තව ඇති වතුගල මංපෙත, කැකුණ ඇල්ල මංපෙත, පතන ඇල්ල මංපෙත, කුරුළුගල මංපෙත, ලංකාගම මංපෙත වැනි ස්වභාවික මංපෙත් වසරකට තුන්වතාවක් නඩත්තු කිරීම







රූපය 2.18 : භූමි අලංකරණය වැඩිදියුණු කිරීම





රූපය 2.19 : අනියම් කම්කරුවන් යොදවා අවශ්‍ය නඩත්තු කටයුතු සහ මෙහෙයුම් කටයුතු සිදු කිරීම





රූපය 2.20 : ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම






රූපය 2.21: ඔලියගන් කැලේ ජෛව විවිධත්ව මධ්‍යස්ථානයේ දේශන ශාලාව ප්‍රතිසංස්කරණය

**ගාල්ල දිසාවේ කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි,**

- කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ සංචාරක මඟපෙන්වන්නන් පුහුණුව
- කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ ප්‍රවර්ධන කටයුතු සඳහා සිහිවටන ලෙස අලෙවිය සඳහා ටී ෂර්ට් සහ තොප්පි සකස් කිරීම
- කන්නෙලිය රක්ෂිතයේ අනගිමල ඇල්ල මංපෙත, නවද ගස මංපෙත, නාරංගස් ඇල්ල මංපෙත, කබ්බලේ කන්ද මංපෙත වැනි ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම



*රූපය 2.22: කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ සංචාරක මඟපෙන්වන්නන් පුහුණුව*




*රූපය 2.23 කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ ප්‍රවර්ධන කටයුතු සඳහා සිහිවටන ලෙස අලෙවිය සඳහා ටී ෂර්ට් සහ තොප්පි සකස් කිරීම*



*රූපය 2.24: කන්නෙලිය රක්ෂිතයේ ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම*

**ගාල්ල දිසාවෙහි කොට්ටව රක්ෂිතයේ,**

- කුරුළු යාය මංපෙත, හොරගස් මංපෙත, කකිල්ලගල මංපෙත වැනි ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම

**ගාල්ල දිසාවෙහි අඩාහැලෙන ඇල්ල,**

- අඩාහැලෙන ඇල්ල ආසන්නයේ නාන තොටුපල අසල ඇඳුම් මාරුකරන ස්ථානය ගොඩ නැගීම,
- අඩාහැලෙන ඇල්ල ප්‍රවේශ පත්‍ර කවුළුව අසල සිමෙන්ති බංකු දෙකක් ස්ථාපිත කිරීම සහ නාම පුවරු දෙකක් ස්ථාපිත කිරීම



*රූපය 2.25: කොට්ටව රක්ෂිතයේ ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම*




*රූපය 2.26: අඩාහැලෙන ඇල්ල ප්‍රවේශ පත්‍ර කවුළුව අසල නාම පුවරු ස්ථාපිත කිරීම*

**මාතලේ දිසාවෙහි නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි,**

- පාසල් ළමුන් සඳහා සොබා උයන ප්‍රදේශයේ පහසුකම් වැඩිදියුණු කිරීම
- නකල්ස් සංරක්ෂිතය තුළ ඇති ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම
- සේර ඇල්ල ප්‍රවේශ පත්‍ර කවුළුව ආශ්‍රිත භූමි අලංකරණය කිරීම



*රූපය 2.27: නකල්ස් සංරක්ෂිතය තුළ ඇති ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම*

**මහනුවර දිසාවේ උඩවත්තකැලේ රාජකීය උද්‍යානයෙහි,**

- උඩවත්ත කැලේ රාජකීය උද්‍යානය තුල නාම පුවරු ස්ථාපනය කිරීම
- කොඩිමලේ නාම පුවරු සැකසීම හා මංපෙත නඩත්තු කිරීම
- සංඝමිත්තා මාවත සිට උඩවත්ත කැලේ සංචාරක බංගලාව දක්වා මාර්ගය අළුත්වැඩියා කිරීම
- ශ්‍රී දළඳා මාලිගාවේ සිට උඩවත්ත කැලේ වෙත ඇතුල් වන සංචාරකයින් සඳහා නව ප්‍රවේශපත්‍ර කවුළුවක් ඉදි කිරීම





*රූපය 2.28: උඩවත්ත කැලේ රාජකීය උද්‍යානය තුල පුවරු සැකසීම හා මංපෙත් නඩත්තු කිරීම*

**මහනුවර දිසාවේ නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානය, ඩීන්ස්ටන්හි,**

- නකල්ස් සංරක්ෂිතයේ ඇති දෝතළුගල කි.මී 04 ක මංපෙත නඩත්තු කිරීම
- නකල්ස් සංරක්ෂිතයේ රත්න ඇල්ල නව ස්වභාවික මංපෙත ස්ථාපිත කිරීම
- නකල්ස් සංරක්ෂිතයේ අවිධිමත් ඇතුළු වීම් පාලනය සඳහා සහ සංචාරකයන් දැනුවත් කිරීම සඳහා නාම පුවරු ස්ථාපිත කිරීම





*රූපය 2.29: නකල්ස් සංරක්ෂිතය තුල නාම පුවරු සැකසීම හා මංපෙත් නඩත්තු කිරීම*

**පොළොන්නරුව දිසාවෙහි හුරුළු පාරිසරික උද්‍යානය,**

- මයිලන්කුලම වැව් බැම්මෙ 300m ක් දිග ඇතුලත මීටර් 5ක්, පිටත මීටර් 15ක් වන සේ හෙක්. 0.6 ක ප්‍රමාණයක අනවශ්‍ය මානා කටු පඳුරු ඉවත් කර පිඩැලි ඇල්ලීම

- හුරුළු පාරිසරික උද්‍යානය තුල පවතින වැසිකිලි පද්ධතිය නඩත්තු කිරීම
- හුරුළු පාරිසරික වන උද්‍යානයේ සෆාරි ජීප් රථ මාර්ගයේ අවශ්‍ය ස්ථානවල කානු සකසා බොරළු යොදා අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කිරීම
- හුරුළු පාරිසරික වන උද්‍යානයේ සෆාරි ජීප් රථ මාර්ගයේ ඇති බෝක්කු (culverts) අලුතින් ඉදි කිරීම
- හුරුළු පාරිසරික වන උද්‍යානයේ ප්‍රධාන සෆාරි ජීප් රථ මාර්ගයේ අත්‍යවශ්‍ය ස්ථානවල Coursway අලුතින් ඉදි කිරීම
- හුරුළු පාරිසරික වන උද්‍යානයේ ප්‍රධාන සෆාරි ජීප් රථ මාර්ගයේ එක් පසකට මීටර් 10 බැගින් වන සේ ලන්ටානා ඇතුළු ආක්‍රමණික ශාක ඉවත් කිරීම



*රූපය 2.30: හුරුළු පාරිසරික වන උද්‍යානයේ ප්‍රධාන සෆාරි ජීප් රථ මාර්ගයේ අළුත්වැඩියා කිරීම*



*රූපය 2.31: හුරුළු පාරිසරික වන උද්‍යානයේ ප්‍රධාන සෆාරි ජීප් රථ මාර්ගයේ ලන්ටානා ඇතුළු ආක්‍රමණික ශාක ඉවත් කිරීම*

**පොළොන්නරුව දිසාවේ ගල්ඔය පාරිසරික උද්‍යානය,**

- ගල්ඔය පාරිසරික වන උද්‍යානයේ ඉහලකන්ද වැවෙහි වැව් බැම්මේ තෘණ සිටුවීමේ කටයුතු සිදු කිරීම
- ගල්ඔය පාරිසරික වන උද්‍යානයේ වට රවුම් පාර මාර්ගයට ආසන්නව වන සතුන්ට ඇල වෙත ප්‍රවේශ වීම සඳහා ස්ථානයක් සකස් කිරීම
- ගල්ඔය පාරිසරික වන උද්‍යානයේ ඉහලකන්ද වැව ධාරිතාවය වැඩි කිරීම සඳහා වැව ඉස්මත්ත කොටස් පස් කපා ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීම



*රූපය 2.32: ඉහලකන්ද වැවෙහි වැව් බැම්මේ තෘණ සිටුවීම*



*රූපය 2.33: ඉහලකන්ද වැව ධාරිතාවය වැඩි කිරීම සඳහා පස් කපා ඉවත් කිරීම*

**නුවර එළිය කන්දේ ඇල අධ්‍යාපනික වනෝද්‍යානය,**

- කන්දේ ඇල පැළ තවාන නාමකරණය
- රුක් කලා ආදර්ශන කුටිය ස්ථාපිත කිරීම හා සහ ගැමි ගෙදර ආදර්ශනය අලුත්වැඩියාව
- විසිතුරු දැවමය නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම

**නුවර එළිය දිසාවේ මන්දාරම් නුවර පාරිසරික සංචාරක ගමනාන්තය,**

- කොළපතනඇල්ල නැරඹීම සඳහා වූ ස්වභාවික මාර්ග නඩත්තු කිරීම
- සංචාරකයන්ට විවේක ගැනීම සඳහා කොළපතනඇල්ල ප්‍රවේශපත්‍ර කාර්යාලය අසල ගිමන් හලක් ඉදි කිරීම



*රූපය 2.34 : කොළපතනඇල්ල ප්‍රවේශපත්‍ර කාර්යාලය අසල ගිමන් හලක් ඉදි කිරීම*

**පුත්තලම දිසාව ගල්විල පාරිසරික උද්‍යානය,**

- ගල්විල පාරිසරික උද්‍යානයේ ඇති කඳවුරු භූමිය නඩත්තු කර පවත්වාගෙන යාම
- ගල්විල පාරිසරික උද්‍යානයේ පවතින කි.මී.16 කින් යුතු සෆාරි මාවත් සහ කි.මී. 2ක ස්වභාවික මංපෙත නඩත්තු කිරීම



*රූපය 2.35: ගල්විල පාරිසරික උද්‍යානයේ ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම*

**අම්පාර දිසාව,**

- එක්ගල්ඔය කඳවුරු භූමියේ වැසිකිළි පද්ධතිය සහ මුළුතැන්ගෙය නඩත්තු කටයුතු සිදු කිරීම
- නුවරගල පාරිසරික සංචාරක ගමනාන්තයෙහි නුවරගල සඳහා ප්‍රවේශ වීමට ඇති පොල්ලේබැද්ද ප්‍රවේශ පත්‍ර කවුළුව නඩත්තු කර පවත්වාගෙන යාම
- නුවරගල සහ අකුල්ඔබ ප්‍රවේශ ස්ථාන නාම පුවරු සවි කර නඩත්තු කර පවත්වාගෙන යාම
- Elephant Rock පාරිසරික සංචාරක ගමනාන්තයෙහි නව සංචාරක ගමනාන්තයක් ලෙස Elephant Rock නාම පුවරු ස්ථාපිත කිරීම සහ අනෙකුත් නඩත්තු කටයුතු සිදු කිරීම




*රූපය 2.36 : Elephant Rockහි නාම පුවරු ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම*

### 2.1.7 පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන

2025 ක්‍රියාකාරි සැලැස්මට අනුව අත්‍යවශ්‍ය පුහුණු වලට ප්‍රතිපාදන හා අත්තිකාරම් ලබාදී පුහුණු සිදුකර ඇත. ඒ අනුව සේවක පුහුණු යටතේ පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා පවත්වා ඇත. ප්‍රධාන කාර්යාලයේ පර්යේෂණ අංශය මඟින් සැලසුම් කල පුහුණු යටතේ නවක සහකාර වන සංරක්ෂකවරුන් 14 ක් සඳහා ගස් හඳුනාගැනීම් පුහුණු වැඩසටහන් 2ක් ලබා දී ඇත.බීට්ටු වන නිලධාරි හා වන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන් 27කට තර්ජනයට ලක්වී ඇති ශාක හඳුනාගැනීම හා සංරක්ෂණ කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වා ඇත . තවාන් පාලන පුහුණුව ප්‍රධාන කලාප කාර්යාල 5ට අයත් හා ප්‍රධාන කාර්යාලයෙහි වන ක්ෂේත්‍ර සහකාරවරුන් 140 ක් සඳහා ලබා දී ඇත.

මෙම දේශීය පාඨමාලාවන්ට අමතරව නිලධාරින්ගේ දැනුම හා තාක්ෂණික කුසලතාවයන් වර්ධනය උදෙසා දෙපාර්තමේන්තු නිලධාරීන් 40 ක් විදෙස් සම්මන්ත්‍රණ/වැඩසටහන් 21 ක් සඳහා හා පුහුණු වැඩසටහනක් සඳහා එක් නිලධාරියෙක් යොමුකිරීම සිදුකරන ලදි.

මෙම අංශය මඟින් සිදුකරන ලද අනිකුත් ප්‍රධාන කාර්යයන් යටතේ, Sri Lanka Forester විද්‍යාත්මක සඟරාවේ 42 කලාපය ප්‍රකාශයට පත් කර ඇත. භාෂා පරිවර්තන කටයුතු යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එදිනෙදා රාජකාරි සඳහා අවශ්‍ය ලිපි ලේඛන/වාර්තා වලට අදාලව භාෂා පරිවර්තන කටයුතු 137 ක් පමණ අවසන් කර ඇත. තවද ජාතික වන පර්යේෂණ කමිටුවට අදාලව කමිටු රැස්වීම් 4ක් පවත්වා එමඟින් පර්යේෂණ යෝජනා 60 ක් සමාලෝචනය කර පර්යේෂණ 57 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

### 2.1.8 වන විද්‍යා පර්යේෂණ ආයතනය

1. **පවත්නා වනවගා ආශ්‍රිත පර්යේෂණවල නඩත්තු කිරීම** - පහත සඳහන් පර්යේෂණ වලට අදාලව නඩත්තු කටයුතු සිදු කර ඇත.
   - I. Liyan (*Homelium zeylanicum*) Block Planting-2022- Hatharaliyadda - යටිපෙළ කැපීම
   - II. Liyan (*Homelium zeylanicum*) Block Planting-2022- Wiharakanda - යටිපෙළ කැපීම, වල් පැල ඉවත් කිරීම හා පොහොර යෙදීම
   - III. Evaluation of Myanmar teak and improved local teak seeds for germplasm conservation-2021- Ethgala - යටිපෙළ කැපීම, වල් පැල ඉවත් කිරීම හා පොහොර යෙදීම
   - IV. Teak clonal seed orchard- 2020-Ethgala - වල් පැල ඉවත් කිරීම
   - V. Teak progeny trial-2017-Ethgala (යටිපෙළ කැපීම - 1 ha)
   - VI. Fuelwood species trial – Kumbalpola - 2016

VII. Comparative study on tissue culture teak clones & teak seedlings – Ethgala - 2023

VIII. Study of seedling growth and survival of native tree species in intermediate/dry zone – 2024 - Irudeniyaya

IX. Study of seedling growth and survival of native tree species in intermediate/dry zone – 2024 – Pampemadu, Vavuniya

X. Evaluation of energy Properties of 08 Tree species Planted in Fuelwood Species

XI. Local Species Trial Conical Hill - 2013

XII. Local Species Trial Welanhinna

**2. නව පර්යේෂණ සිදුකිරීම**

I. තේක්ක වන වගාවන්හි ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ කෘෂි වන වගාවන්හි අධ්‍යනය කිරීම (.Application of different agroforestry models for productivity improvement of teak plantations )

- සුදුසු ඉඩමක් තෝරා ගැනීම සහ මැනීම් කිරීම
- මුල් උදුරා දැමීම සහ ඉවත් කිරීම
- තේක්ක තවාන් පිහිටුවීම සහ කළමනාකරණය
- පැල සිටුවීම

II. රෝග ප්‍රතිරෝධී දැව විශේෂ හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයට අදාල බීජ රැස් කිරීම සිදුකර ඒවා බඳුන්ගත කර තවාන් නඩත්තුව සිදු කෙරේ. (Identification of disease resistant timber species for upper montane humid forest areas (Conical hill) in Sri Lanka)

- බීජ ප්‍රතිකාර (ප්‍රරෝහණය පිළිබඳ අධ්‍යයනය)
- මව් පාත්ති සකස් කිරීම
- බැග් පිරවීම / බඳුන් කිරීම
- තවාන් ස්ථාපිත කිරීම සහ තවාන් නඩත්තුව

III. තේක්ක රිකිළි කළමනාකරණ වගාවන්හි වන අලි හානිය වැළැක්වීමට ජීවී අලි වැට ස්ථාපනය කිරීමේ අධ්‍යයනය - මහ ඔය ප්‍රදේශයේ හණ, දෙහි, තල් (Establishment of live fences to Control Elephant Damages in Teak Plantation – Hana, Lime, Thal in Mahaoya )

- ස්ථාන තෝරා ගැනීම (අංශ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීම)
- තවාන් ස්ථාපිත කිරීම

- තවාන් කළමනාකරණය
- බීජ පැල ප්‍රවාහනය
- පැල සිටුවීම

IV. කජු, කොස් හා අනෝදා අතුරු වගාවක් ලෙස යොදා ගෙන තේක්ක බීජ වගාවක් ස්ථාපනය කිරීම. (Establishment of a new teak seed orchard (clonal seed orchard) intercropping with cashew, Jak and sour sop (Anoda) -3ha)

- ග්‍රාහකය සඳහා බීජ පැල නිපදවීම
- බද්ධ කිරීම සඳහා අංකුර Progeny Trial මගින් ලබා ගැනීම
- බද්ධ කරන ලද බීජ පැල දැඩි කිරීම
- බීජ පැළ සකස් කිරීම (වානිජ බෝග) - තවාන් කළමනාකරණය
- ක්ෂේත්‍රය තෝරා ගැනීම සහ මායිම් නිර්ණය කිරීම (හෙක්ටයාර 4.5)
- ක්ෂේත්‍රය සකස් කිරීම
- පැල සිටුවීම

V. පයිනස් වන වගාවන්හි යටි වගාවන් ලෙස කරදමුංගු වගා කිරීමේ යෝග්‍යතාව මැනීම. (Establishment and selection of suitable models for Cardamom under planting in pinus plantations (Malate) )

- භූමි තෝරා ගැනීම සහ මායිම් නිර්ණය කිරීම
- තවානක් ස්ථාපිත කිරීම (වල් කරදමුංගු මොරෙයියන් එකතු කිරීම)
- ක්ෂේත්‍රය සකස් කිරීම (ක්ෂේත්‍රය පිරිසිදු කිරීම)
- බීජ පැල ප්‍රවාහනය, වලවල් කැපීම සහ සිටුවීම
- පොහොර යෙදීම

VI. විදේශීය දැව විශේෂ වෙනුවට භාවිත කළ හැකි තරඟකාරී විකල්ප දේශීය දැව ශාක හඳුනා ගැනීම. - හල් මිල්ල, ගම්මාළු, මී, කැටකැල (Establishment of Native Tree Species as an Alternative to Exotic species for Timber Production (Halmilla, gammalu, Mee, ketakela))

- බීජ එකතු කිරීම සහ බීජ පැල සකස් කිරීම
- තවාන් ස්ථානගත කිරීම සහ කළමනාකරණය
- ක්ෂේත්‍රය සකස් කිරීම
- පැල සිටුවීම

VII. රිකිලි වගාවන් සමඟ අතුරු වගාවක් ලෙස කායා සිටුවීමෙන් වන අලි හානි සඳහා ඇති බලපෑම අධ්‍යනය කිරීම.(Planting Kaya seedlings inside the existing coppice teak plantation.) (5 ha)

- ස්ථාන තෝරා ගැනීම (අංශ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීම)
- තවාන් ස්ථාපිත කිරීම (ඇමුණුම)
- තවාන් කළමනාකරණය
- බීජ පැල ප්‍රවාහනය
- පැල සිටුවීම

VIII. ආක්‍රමණශීලි ශාක භාවිතයෙන් දැව අඟුරු කුට්ටි නිපදවීම - පළමු අදියර සම්පූර්ණ කර ඇත ("Charcoal briquette production using invasive plants -Phase 1 work completed)

- සාහිත්‍ය සමීක්ෂණය සහ යෝජනා ලිවීම
- IAS අස්වනු නෙලීම සඳහා අවශ්‍ය අවසර ලබා ගැනීම
- පරීක්ෂණාත්මක නියැදිය සකස් කිරීම
- නිෂ්පාදන ප්‍රශස්තිකරණය සහ තත්ත්ව පරීක්ෂාව

IX. පයිනස් වන වගා සුපෝෂණ ව්‍යාපෘතිය - මෙහි සැලැස්ම වෙනස් වී ඇත. (Pine Plantation Enrichment Project-The plan has been changed. )

මෙම ව්‍යාපෘතිය වෙනුවට අමාත්‍යංශයේ උපදෙස් පරිදි උණපැල සිටුවීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

X. පහත රට වියලි කලාපීය වන වගාවන් සඳහා ගැලපෙන වල් මර්ධන ක්‍රම හඳුනා ගැනීමේ අධ්‍යනය. (Identification of climate specific weed control system for plantations established in Low country dry zone of Sri Lanka ) (වල් පැළ ඉවත් කිරීම)

XI. ඩිප්ටෙරෝකාපේසියේ ශාක පවුලට අයත් අතිශයින් අන්තරායට ලක් වූ ශාක සංරක්ෂණය කිරීම හා නැවත ස්ථාපනය. (Field Survey on critically endangered species in Dipterocarpaceae family )

ඉහත පර්යේෂණයට අදාල ශාක හඳුනා ගැනීම සඳහා සහය ලබා දීමට ජාතික ශාකාගාරය තුළ සම්පත්දායකයන් නොමැති බව දැන්වූ බැවින් ශාක නිසි පරිදි හඳුනා නොගෙන පර්යේෂණය සිදු කිරීමට නොහැකි වී ඇත

XII පර්යේෂණ ආයතනයේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම

3. **පර්යේෂණ වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම (පුවත් ලිපිය)**
   - Research article on 'Evaluating Growth Performance and Volume of Teak Coppice management systems- Case of Intermediate zone, Sri Lanka'-2025 ඔක්තොම්බර් මස ඉන්දියාවේදී ලෝක තේක්ක සමුළුවේදී ඉදිරිපත් කරන ලදි.
   - Selecting native tree species reforestation in the intermediate zone in Sri Lanka
   - A case study on selecting native tree species for re-forestation in the Low Country Intermediate zone in Sri Lanka
   - Growth dynamic of *Gyrinops walla* grown in moist monsoon forests in Sri Lanka: case study in Barigoda Natural Forest
   - Reintroducing the critically endangered *Polyspora dassanayakei* -(මිහිරිය) and restoring the associated habitat
4. **බීජ ප්‍රභව සංවර්ධනය සහ බීජ එකතු කිරීම (තේක්ක, කායා සහ යුකැලිප්ටස්)**
   - Teak seed orchard (i  යටි කැලය කැපීම, ii.  අල්ළි ශුද්ධ කිරීම, අරය මීටර් 2 වන පරිදි ගස් වටා ශුද්ධ කිරීම හා පොහොර යෙදීම)
   - Teak CSO, Khaya CSO (iයටි කැලය කැපීම(තේක්ක), ii. පොහොර යෙදීම)iii.බීජ එකතු කිරීම(කායා)- කි.ග්‍රෑ 6
5. **කුඹල්පොළ සහ බදුල්ල පර්යේෂණ මධ්‍යස්ථාන නඩත්තු කිරීම සිදුකිරීම**

## 2.1.9 ශ්‍රී ලංකා වන විද්‍යාතනය

ශ්‍රී ලංකා වන විද්‍යායතනය මඟින් පවත්වනු ලබන NVQ 5 වන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2025 වසරට අභ්‍යාසලාභීන් 35 දෙනෙකු බඳවා ගන්නා ලද අතර මේ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු බීට්ටු වන නිලධාරීන් 31ක් හා  වන ව්‍යාප්ති නිලධාරීන් 2 ක් හා රාජ්‍ය දැව සංස්ථාවේ වැඩබිම් කළමනාකරුවන් 2 ක් ඇතුලත් විය. එසේම  පළමු අධ්‍යන වාරයට අදාල විභාගය  අවසන් කර ඇත. 2021/2022/2023 වර්ෂයන්හි වන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවන්හි සිසුන් 52ක් සඳහා වාචික පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත.  දෙවන අධ්‍යන වාරයට අදාල අධ්‍යන කටයුතු අවසන් කර ඇත.

කාර්යක්ෂමතා කඩයිම් විභාග අතරින් වන ක්ෂේත්‍ර සහකාර වරුන්ගේ ගස් හඳුනා ගැනීම (ප්‍රාථමික) , කාර්යක්ෂමතා කඩයිම් විභාග( පළමු හා තෙවන) පවත්වා අවසන් කර ඇත. ඒ අනුව නිලධාරීන් 336 ක් සඳහා කාර්යක්ෂමතා විභාග පවත්වා ඇත. කණ්ඩායම් වැඩ පුහුණුව ශ්‍රී ලංකා වන විද්‍යායතනයෙහි නිලධාරීන් 29 ක් සඳහා පවත්වා ඇත.

## 2.1.10 සම්පත් කළමනාකරණය

2025 වසරේදී, කාර්යාල, නිල නිවාස, පර්යේෂණ මධ්‍යස්ථාන ඇතුළු ගොඩනැගිලි ව්‍යුහයන් 42ක් හා සංචාරක බංගලා හා තවත් ගොඩනැගිලි 46ක් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වැඩි දියුණු කර ඇත.එමෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ තිබෙන වාහන යන්ත්‍රෝපකරණ හා උපකරණ අවශ්‍යතාවය අනුව නඩත්තු කර ඇති අතර,දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ, උපකරණ හා යන්ත්‍ර අවශ්‍යතාවය අනුව මිලදී ගෙන ඇත.

## 2.1.11 සංචාරක කර්මාන්තයෙන් ලද ආදායම - 2025

*වගුව 2.15: සංචාරක පැමිණීම - 2025*

| අනු අංකය | පාරිසරික සංචාරක ගමනාන්තය | සංචාරකයන් පැමිණීම | | |
|---|---|---|---|---|
| | | **දේශීය** | **විදේශීය** | **එකතුව** |
| 1 | මාකන්දාව | 2324 | 969 | 3293 |
| 2 | කුරුළු කැලේ ( කෑගල්ල) | 4619 | 2 | 4621 |
| 3 | නුවරගල (අම්පාර) | 1247 | 219 | 1466 |
| 4 | කොට්ටව (ගාල්ල) | 1270 | 136 | 1406 |
| 5 | කන්නෙලිය (ගාල්ල) | 37361 | 2626 | 39987 |
| 6 | අඩාහැලෙන ඇල්ල (ගාල්ල) | 12005 | 2342 | 14347 |
| 7 | හුරුළු පාරිසරික උද්‍යානය | 75360 | 221434 | 296794 |
| 8 | ගල් ඔය පාරිසරික උද්‍යානය | 414 | 674 | 1088 |
| 9 | සිංහරාජය (මාතර) | 31802 | 16929 | 48731 |
| 10 | සිංහරාජය (රත්නපුර) | 15864 | 8575 | 24439 |
| 11 | නකල්ස් (මහනුවර) | 9214 | 3593 | 12807 |
| 12 | නකල්ස් (මාතලේ) | 236840 | 4000 | 240840 |
| 13 | උඩවත්ත කැලේ (මහනුවර) | 29121 | 12772 | 41893 |
| 14 | රත්න ඇල්ල (මහනුවර) | 9384 | 1196 | 10580 |
| 15 | යහන් ගල (මහනුවර) | 207 | 5 | 212 |
| 16 | ගැරඩි ඇල්ල (මහනුවර) | - | - | - |
| 17 | පිදුරුතලාගල (නුවරඑළිය) | 66965 | 1305 | 68270 |
| 18 | මන්දාරම් නුවර කොළපතන ඇල්ල | 28267 | 25 | 28292 |
| 19 | බඩගමුව පාරිසරික මධ්‍යස්ථානය | 11674 | 1427 | 13101 |
| 20 | ගල්විල පාරිසරික උද්‍යානය | 151 | 13 | 164 |
| 21 | දොළුකන්ද සංරක්ෂිත වනාන්තරය | - | - | - |
| 22 | බදුල්ල (ඇල්ල ගල) | 13300 | 23368 | 36668 |
| 23 | කන්දේඇළ | 1773 | 5 | 1778 |
| ප්‍රධාන ගමනාන්ත 23හි සංචාරකයින් සංඛ්‍යාව | | 589,162 | 301,615 | 890,777 |
| උප ගමනාන්ත සංචාරක සංඛ්‍යාව | | 3037 | | |
| **සමස්ත සංචාරකයින් සංඛ්‍යාව** | | **592,199** | **301,615** | **893,814** |

## 2.1.12 සංචාරක කර්මාන්තයෙන් ලද මුළු ආදායම

*වගුව 2.16: සංචාරක කර්මාන්තයෙන් ලද මුළු ආදායම*

| ආදායම් විස්තරය | | ආදායම (රුපියල්) |
|---|---|---|
| පාරිසරික සංචාරක ගමනාන්ත සඳහා සංචාරකයන් පැමිණීමෙන් ලද ආදායම | දේශීය | 52,633,247.84 |
| | විදේශීය | 451,399,063.89 |
| සංචාරක බංගලා වෙන්කිරීම්වලින් ලද ආදායම | | 18,772,083.91 |
| වෙනත් ආදායම් | රූපගත කිරීම් වලින් ලැබූ අදායම | 740,430.00 |
| | තාවකාලික කඳවුරු බැඳීමෙන් ලැබූ අදායම | 266,101.00 |
| | සිහිවටන අලෙවියෙන් ලද අදායම | 395,800.00 |
| | වනාන්තර සඳහා වාහන ඇතුළු කිරීමෙන් ලැබූ අදායම (සෆාරි ජීප් ආදායම) | 55,949,836.05 |
| **සමස්ත ආදායම** | | **580,156,562.69** |

## 2.2 වසරේ ක්‍රියාත්මක විශේෂ වැඩසටහන්/අමතර ක්‍රියාකාරකම්

- රාජ්‍ය දැව සංස්ථාවේ හෙලීම් ප්‍රමාදය මත පූර්ණ හෙලීම් ඉලක්කය අඩු වූ බැවින් එම ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය යොදා ගනිමින් වන වගාවල අස්වැන්න ඉහල නැංවීමේ අරමුණින් අමතර ක්‍රියාකාරකම් වශයෙන් මාතර, හම්බන්තොට, වවුනියා, කිලිනොච්චිය, බදුල්ල, කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුළ හෙක්ටයාර් 292.04 ක වල් නෙලීම, පොහොර යෙදීම, ගිනි වැලැක්වීම හා පාළු පැළ සිටුවීම සිදු කරන ලදී.
- "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ විශේෂ අවශ්‍යතා සහිත අබාධිත සංචාරකයන් සඳහා සිංහරාජ, කුඩව සහ කන්නෙලිය යන රක්ෂිත වනාන්තර වෙත බගී කාර්ට්(Buggy cart) මඟින් වනාන්තර තුළට ඇතුළු වීමට පහසුකම් සැලසීමේ වැඩසටහනට අදාළ කටයුතු ආරම්භ කිරීම . මේ සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය ප්‍රතිපාදන ලබා දෙන අතර ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු 2025 වර්ෂයේ සිදු කල අතර 2026 අප්‍රේල් මාසය වන විට මිලදී ගැනීම් සිදු කර මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිතය.
- සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය, පිටදෙනිය/ කන්නෙලිය රක්ෂිත වනාන්තරය, හුරුළු පාරිසරික උද්‍යානය සහ නකල්ස් සංරක්ෂිත මධ්‍යස්ථානය, ඕන්සටන් යන පාරිසරික සංචාරක ගමනාන්ත දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් එම සංචාරක ගමනාන්ත වෙත පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට සිහිවටන ලෙස අලෙවිය  කිරීම සඳහා ටී ෂර්ට් සහ තොප්පි සකස් කිරීම සිදු කිරීම.

- කන්නෙලිය රක්ෂිත වනාන්තරයට අනුයුක්තව සේවය කරන මාර්ගෝපදේශකයන් සඳහා මාර්ගෝපදේශක පුහුණුව ලබා දීම.
- සංචාරක සංවර්ධන මණ්ඩලයේ අනුග්‍රාහකත්වයෙන් කුඩව සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයට අනුයුක්ත මාර්ගෝපදේශකයන් සඳහා මාර්ගෝපදේශක පුහුණුව ලබා දීම.
- රක්ෂිත/ සංරක්ෂිත වනාන්තර සඳහා අවිධිමත් සංචාරක ඇතුළුවීම් පාලනය කිරීම සඳහා නකල්ස් ඉලුක්කුඹුර, නකල්ස් ඩීන්ස්ටන් සහ වංගෙඩිගල, ගැරඬිඇල්ල ආදී වනාන්තරවල හඳුනාගත් ස්ථානවල නාම පුවරු ස්ථාපිත කිරීම.

## 2.3 2025 වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවූ අභියෝග

- ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීමේ කාර්යයේදී රාජ්‍ය අංශය ක්‍රියාත්මක වීම පමණක් ප්‍රමාණවත් නොවේ. එබැවින් ඒ සඳහා පෞද්ගලික අංශයේ හා විදේශයන් හි දායකත්වය ලබා ගැනීම වඩා ඵලදායී වනු ඇත. මේ වෙනුවෙන් දේශීය පෞද්ගලික අංශයන්ගේත් විදේශයන්හි මූල්‍ය දායකත්වයක් ලබාගතහැකි පරිදි රාජ්‍ය හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සිදු කලයුතු අතර ඒ තුලින් අපේක්ෂිත, වන ආවරණය 32% දක්වා ඉහළ නැංවීමේ ඉලක්කයට ළඟා වීම වඩා කාර්යක්ෂමව සිදු කිරීමේ හැකියාව ඇත.
- වනාන්තර මායිම් නිරූපණයේදී හා ගැසට් කිරීමේදී විවිධ ආයතනයන්ගෙන් හා ප්‍රජාවන්ගෙන් නිසි සහයෝගයක් නොලැබීම හා ජාතික වශයෙන් වැදගත් වන කටයුත්තක් සේ නොසලකමින් එම කාර්ය කෙරෙහි ඇතිවන ප්‍රතිරෝධතා.
- වනාන්තර මායිම් මැනුම් කිරීම හා මායිම් කණු මගින් සලකුණු කිරීම දුෂ්කර කටයුත්තක් වන අතර එම කාර්ය සාර්ථකව ඉටු කිරීම සඳහා දැනට සේවයේ යෙදී සිටින සේවක මණ්ඩලයේ ඌණතාවය.
- වනාන්තර මායිම් නිරූපණය හා ගැසට් කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන නිසි කලට හා නිසි ප්‍රමාණයෙන් නොලැබීම.
- පාරිසරික සංචාරක කටයුතු සිදු කරගෙන යාම සඳහා ප්‍රධාන කාර්යාලය, සංචාරක ගමනාන්ත වල ප්‍රමාණවත් සහ සුදුසු කාර්ය මණ්ඩලයක් නොමැති වීම.
- සංචාරක විභවයන් සහිත නව සංචාරක ස්ථාන ඇති කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම.
- තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම සහිත කාර්ය මණ්ඩලයක් නොමැති වීම.
- බාහිර පාර්ශව විසින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන යෝජනාවලි බොහොමයක් ඉහළ සංචාරක විභාවතාවයන්ගේ යුතු යෝජනාවලි නොවීම.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සංචාරක කටයුතු සඳහා මූලිකව මහා වන සැලැස්මක් (Master Plan) සකස් කර නොතිබීම හා සංචාරක ගමනාන්ත සියල්ල සඳහා එවැනිසැලසුමක් නොතිබීම.

- සංචාරක ආකර්ෂණ සහිත ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනා නොගැනීම මත සංචාරක තෘප්තිය නිවැරදිව හඳුනා නොගැනීම.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සංරක්ෂිත අරමුණු වලට පටහැනි වන අයුරින් පාරිසරික සංචාරක කටයුතු සිදු කිරීමේ හැකියාව පැවතීම.
- තිරසාර පාරිසරික සංචාරක කර්මාන්තය පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අවබෝධය අඩු වීම මත පාරිසරික ගැටළු ඇති වීම .
- මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රවේශ පත්‍ර වෙන් කරවා ගැනීම, ඇතුළු අනෙකුත් සේවාවන් සිදු කර ගත නොහැකි වීම.
- නිලධාරීන් සඳහා දිරි දීමනා විශේෂ දීමනා නොමැති වීම මත නිලධාරී අතෘප්තිමත් වීම හේතුවෙන් ගුණාත්මක සේවයක් ලබා ගැනීමට නොහැකිවීම මත සේවා අඩාල වීම හා සතුටු දායක සේවයක් සංචාරකයන්ට නොලැබීම.
- ප්‍රජා මූල ධාරිතාව අඩු වීම මත සේවාවන් සැපයීමේදී ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ගැටළු ඇති වීම.
- සංචාරක ගමනාන්ත සඳහා අවශ්‍ය ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පීන් සහ තාක්ෂණික නිලධාරී සේවය ලබා ගැනීමට ඇති අපහසුතාවය.
- ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම.
- අධීක්ෂණ නිලධාරීන් සඳහා ක්ෂේත්‍රයට යාමට ඉන්ධන නොමැති වීම හා ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් තොර තීරණ ගැනීමට නොහැකි වීම.
- වන විද්‍යාව හා පරිසර කටයුතු පිළිබඳ අත්දැකීම් හා දැනුම ඇති ප්‍රමාණවත් සුදුසුකම් සහිත මාණ්ඩලික නිලධාරීන් ප්‍රධාන කාර්යාලයේ අඩු වීම.
- අවශ්‍යතාවයට සරිලන නිළධාරීන් ප්‍රමාණවත් නොවීම නිසා වන කළමණාකරණ සැලසුම් සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ගැටළු සහගත තත්වයන් ඇති වීම.
- ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වන කළමනාකරණ සැලසුම් සකස් කිරීමේදී දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය නියමාකාරයෙන් සිදු කර ගැනීමට නොහැකිවීම නිසා වන කළමනාකරණ සැලසුම් නිමැයුමෙහි ගුණාත්මය අඩු වීම.

## 2.4 අනාගත දැක්ම

1) වන ආරක්ෂණ කලාප කළමනාකරණය කිරීම.
2) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම.
3) ඉහළ සංචාරක විභාවතාවයෙන් යුතු පාරිසරික සංචාරක කර්මාන්තයක් ඇති කිරීම
4) නව සංචාරක ක්‍රියාකාරකම් හඳුන්වා දීම.
5) පවතින සංචාරක ගමනාන්ත වල පවතින අවිධිමත් සංචාරක කර්මාන්ත වැලැක්වීම සහ පාරිසරික සංචාරක කර්මාන්තය විධිමත් කිරීම.

# 03 පරිච්ඡේදය

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශය

*වගුව 3.1: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය*

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | තත්‍ය 2025 | 2024 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | 2,368,038,290 | 1,085,716,097 | |
| - | ආදායම් බදු | 1 | | - | ඒසීඒ-1 |
| 122,000,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 150,494,109 | 112,137,869 | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 2,100,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 2,217,544,180 | 973,578,228 | ඒසීඒ-1 |
| 2,222,000,000 | මුළු ආදායම් ලැබීම් (අ) | | 2,368,038,290 | 1,085,716,097 | |
| 80,000,000 | ආදායම් නොවන ලැබීම් | | 5,167,654,218 | 3,638,012,306 | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 3,581,233,988 | 2,676,806,700 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 1,501,816,087 | 878,142,666 | ඒසීඒ-4 |
| 80,000,000 | අත්තිකාරම් ගිණුම් | | 84,604,144 | 83,062,940 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 5,167,654,218 | 3,638,012,306 | |
| 80,000,000 | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 7,535,692,508 | 4,723,728,403 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 1,341,246,707 | 827,006,380 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 6,194,445,802 | 3,896,722,023 | |
| | අඩු කළා : වියදම් | | | | |
| 2,500,000,000 | පුනරාවර්තන වියදම් | | 2,353,056,919 | 2,064,889,196 | ඒසීඒ-2(ii) |
| 2,154,491,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,017,909,767 | 1,771,452,184 | ඒසීඒ-2(ii) |
| 338,779,800 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 328,752,466 | 284,660,318 | ඒසීඒ-2(ii) |
| 6,609,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 6,274,511 | 7,612,408 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 120,200 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 120,175 | 1,164,285 | ඒසීඒ-2(ii) |
| 2,500,000,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 2,353,056,919 | 2,064,889,196 | |
| 1,280,000,000 | මූලධන වියදම් | | | | |
| 160,600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 158,585,996 | 60,571,356 | ඒසීඒ-2(ii) |
| 63,700,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 63,591,634 | 643,416,713 | ඒසීඒ-2(ii) |
| | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 9,500,000 | හැකියා වර්ධනය | 14 | 6,426,454 | 9,684,662 | ඒසීඒ-2(ii) |
| 1,046,200,000 | වෙනත් මූලධන වියදම් | 15 | 1,032,700,873 | 2,879,233 | ඒසීඒ-2(ii) |
| 1,280,000,000 | මුළු මූලධන වියදම් (උ) | | 1,261,304,956 | 716,551,964 | |
| | තැන්පතු ගෙවීම් | | 1,592,033,456 | 849,975,478 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 93,652,072 | 83,370,722 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 1,685,685,528 | 933,346,200 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 5,300,047,403 | 3,714,787,360 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 894,398,398 | 181,934,664 | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | 832,471,843 | 152,557,368 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 61,926,555 | 29,377,296 | ඒසීඒ-3 |
| | | | 894,398,398 | 181,934,664 | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

*වගුව 3.2: මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය*

ඒසීඒ-පී

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,905,151,941 | 10,303,181,000 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 220,327,147 | 211,279,219 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 61,926,555 | 29,377,296 |
| **මුළු වත්කම්** | | **2,187,405,643** | **10,543,837,516** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (428,304,668) | (527,570,140) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,905,151,941 | 10,303,181,000 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 648,631,815 | 738,849,359 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 61,926,555 | 29,377,296 |
| **මුළු වගකීම්** | | **2,187,405,643** | **10,543,837,516** |

පිටු අංක 6 සිට 31දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 64 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාගෙර්පදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්ාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ...................... | ...................... | ...................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : 2026·02·26 | නම : | නම : |
| තනතුර : ඉක්.ආර්. උඩුවාවල ලේකම් පරිසර අමාත්‍යාංශය | තනතුර : 2026·02·25 | දිනය : 2026·02·26 |
| දිනය : | දිනය : | |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශ

*වගුව 3.3: මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශ*

ජිසිජ්-සී

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

*** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සතා 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 1,376,432,662 | 948,913,352 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 317,387,481 | 121,563,959 |
| අග්‍රිම ලැබීම් | 3,581,233,988 | 2,676,806,700 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 84,134,140 | 86,324,131 |
| තැන්පතු ලැබීම් | 1,501,816,087 | 876,916,902 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **6,861,004,358** | **4,710,525,045** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,343,404,297 | 2,052,280,053 |
| සහනාධාර සහ මාරුකිරීම් | 6,274,511 | 7,612,408 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 120,175 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 161,086,222 | 145,528,747 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 1,341,246,707 | 825,808,591 |
| අත්තිකාරම් ගෙවීම් | 93,607,478 | 83,390,507 |
| තැන්පතු ගෙවීම් | 1,592,033,456 | 849,975,478 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **5,537,772,846** | **3,964,595,784** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **1,323,231,512** | 745,929,260 |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 1,261,304,957 | 716,551,964 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **1,261,304,957** | **716,551,964** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(1,261,304,957)** | **(716,551,964)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **61,926,555** | **29,377,296** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | 61,926,555 | 29,377,296 |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

### 1. වාර්තාකරණ කාල පරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාල වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

### 2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

### 3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

### 4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

### 5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

### 6. මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම් ශිර්ෂ දෙකක් (2) යටතේ පහත පරිදි රැස් කරන ලදී.

*වගුව 3.4: ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය*

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසන් ඇස්ත-මේන්තු වේ % ලෙස |
| 1003:07:03 | පුද්ගලික දැව ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු | 121,500,000.00 | 122,000,000.00 | 150,494,109.00 | 123.35% |
| 2002:01:02 | රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම | 1,000,000,000.00 | 2,100,000,000.00 | 2,217,544,180.00 | 105.59% |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

*වගුව 3.5: වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය*

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 2,500,000,000.00 | 2,500,000,000.00 | 2,356,314,854.00 | 94.12 |
| ප්‍රාග්ධන | 1,280,000,000.00 | 1,280,000,000.00 | 1,261,304,957.07 | 98.54 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

*වගුව 3.6 මු.රෙ. 208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන*

රු. ,000

| වැය ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගීකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 020 | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කාර්යය මණ්ඩල ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ලබාදීම. | 5,109,162 | 5,109,162 | 5,104,282 | 100 |
| 130 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රජයේ ආයතන සතු සංචාරක බංගලා හා නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ලබාදීම. | 67,509,896 | 67,509,896 | 49,695,733 | 26 |
| 160 | පරිසර අමාත්‍යාංශය | AFOLU ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දීම. | 14,740,000 | 14,740,000 | 7,380,320 | 50 |
| 160 | පරිසර අමාත්‍යාංශය | කාබන් පරිසර පද්ධති තිරසර භාවිතය හා සංරක්ෂණය | 642,538 | 642,538 | 630,175 | 98 |
| 160 | පරිසර අමාත්‍යාංශය | වාණිජ වන වගා හා කඩොලාන ප්‍රතිශ්ඨාපනය කිරීමේ ව්‍යාපෘතිය | 16,967,824 | 16,967,824 | 12,982,899 | 77 |
| 001 | ජනාධිපති කාර්යාලය | ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය | 18,600,000 | 18,600,000 | 231,280 | 1 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් ණයශේෂ නිරවුල් කිරීමට ලබාදීම. | 943,101,000 | 943,101,000 | 943,101,000 | 100 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | පහල මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදීම. | 116,000,000 | 116,000,000 | 116,000,000 | 100 |

## 3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

*වගුව 3.7 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම*

| වත්කම් කේතය | කේත විස්තරය | **31.12.2025** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **31.12.2025** දිනට මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | ඉදිරියේදී ගිණුම්ගත කිරීම සඳහා තක්සේරු කිරීමට යොමු කර ඇත. | | - |
| 9152 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,901,545,376.69 | 1,901,545,376.69 | - | - |
| 9153 | ඉඩම් | - | ඉදිරියේදී ගිණුම්ගත කිරීම සඳහා තක්සේරු කිරීමට යොමු කර ඇත. | | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 3,606,564.11 | 3,606,564.11 | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FWL/E/DFC/02/FA/2025/25 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 31 දින

වන සංරක්ෂක ජනරාල් කාර්යාලය
12 JUN 2026
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වන සංරක්ෂක ජනරාල්
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

රජයේ කැලෑවලින් ලැබෙන ආදායම් සංකේත 2002-01-02 යටතේ සමාලෝචිත වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවල එකතු කරන ලද පිළිවෙලින් රු. 12,340,000 ක් හා රු.

1,246,300 ක් වූ මුළු එකතුව රු.13,586,300 ක ආදායම මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්ගත කර නොතිබුණි.

### 1.6.2 පුනරාවර්තන වියදම්

සමාලෝචිත වර්ෂයේ වියදම් ප්‍රකාශනය ඒසීඒ-2(ii) ප්‍රකාරව වැය විෂයය 283-1-1-0-1003 හි සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු. 651,223,472 ක් වුවද, වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය ඒසීඒ-2(i) හි එම වැය විෂයයේ වර්ෂයේ වියදම ලෙස රු. 647,965,537 ක් දක්වා තිබීම හේතුවෙන් එම වැය විෂයයට අදාලව ඒසීඒ-2(i) ප්‍රකාශනය තුල මුළු වියදම රු.3,257,935 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

භාණ්ඩාගාර මුද්‍රිත SA 21-1 අනුව වෙනත් ආයතන විසින් වාර්තාකරන ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම රු. 1,005,178,154 ක් වු අතර,එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට නිවැරදිව ගෙන තිබුණද අග්‍රිම සැසඳුම් ප්‍රකාශනය ඒසීඒ-07 හි රු. 991,605,628 ක් ලෙස දක්වා තිබුණි.

### 1.6.4 මූල්‍ය නොවන වත්කම්

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.6.5 අග්‍රිම ශේෂය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.37,620,906 ක මුදලක් භාණ්ඩාගාරයට පියවා තිබුණද, එදිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA-70 අනුව අග්‍රිම ශේෂය ලෙස රු. 61,926,555 ක් පැවතීම හේතුවෙන් අග්‍රිම ශේෂයේ පැවති රු.24,305,649 ක වෙනස සඳහා හේතුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වර්ෂය අවසානයට ශේෂය රු. 894,398,398 ක් වූ අතර අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය රු. 832,471,843 ක් වීමෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය රු.61,926,555 කින් සැසදී නොතිබුණි.

### 1.6.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) මුදල් රෙගුලාසි 225 ප්‍රකාරව නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා පිලියෙල කරන ලද වවුවර සියලුම ගෙවීම් සඳහා ඉදිරිපත් කල යුතු බව හා මුදල් රෙගුලාසි 272(1) ප්‍රකාරව ගෙවූ සියළුම වවුවර ඒවායේ අනුක්‍රමික අංක අනුව පිලියෙල කොට ආරක්ෂා සහිතව තබාගත යුතු බව දක්වා තිබුණත්, නුවරඑළිය, ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ 2023 වර්ෂයේදී රු. 8,728,538 ක මුදල් චෙක්පත් හා රු. 3,175,340 ක හුවමාරු චෙක්පත් මඟින් සිදුකල මුළු එකතුව රු. 11,903,878 ක් වූ ගෙවීම්වලට අදාල වවුචර්පත් 148 ක් විගණනය සඳහා ඉදිරිපත් නොවිය.

(ආ) ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ 2023 වර්ෂයේ ගෙවීම් සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී, අවස්ථා 32 කදී නිශ්කාශණය වී තිබූ එකතුව රු. 1,222,278 ක ගෙවීම් සඳහා ඉදිරිපත් වූ ගෙවීම් වවුචරවල ගෙවීම තහවුරු කෙරෙන සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවිය.

(ඇ) ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ 2023 වර්ෂයේ ගෙවීම් සම්බන්ධයෙන් කල නියැදි පරීක්ෂාවේදී අවස්ථා 13 කදී නිශ්කාෂණය වී තිබූ එකතුව රු. 1,886,160 ක චෙක් පිලිපතෙහි සඳහන් වටිනාකම රු. 390,127 ක් වූ අතර, අවස්ථා 02 කදී මුදල් පොතෙහි ලියා තිබූ රු. 6,375 ක වටිනාකම් කපා රු. 386,206 ක් නැවත ලියා තිබුණි. එසේම මෙම සියලුම ගනුදෙනු සඳහා අදාල වවුචර්පත් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ඇ) චෙක්පත් වලින් ගෙවීම් කිරීමේදී චෙක්පත් දිනය, වවුචර්පත් අංකය, ආදායකයා හා ශේෂය ආදී තොරතුරු චෙක්පත් උප පත්‍රිකාවේ (චෙක් පිළිපතෙහි) සඳහන් කල යුතු වුවද ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ 2023 වර්ෂයේ චෙක් පොත්වල උප පත්‍රිකා පරීක්ෂා කිරීමේදී අදාල විස්තර කිසිවක් නොමැති චෙක්පත් උප පත්‍රිකා පැවතුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ආදායම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 85(1)(ඇ) ප්‍රකාරව හැකිතාක් තාත්විකව හා නිවැරදි ලෙස තම ඇස්තමේන්තු පිළියෙල කිරීමට රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීන් උත්සාහ දැරිය යුතු වුවත්, ආදායම් සංකේතාංක 2002-01-02 රජයේ කැලෑවලින් ලැබෙන ආදායම සඳහා මූලික ආදායම් ඇස්තමේන්තුව රු. 1,000,000,000 ක් වූ අතර එය රු. 2,100,000,000 ක් ලෙස සංශෝධනය කර තිබීමෙන් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව මූලික ආදායම් ඇස්තමේන්තුවට වඩා සියයට 110 ක වැඩි වීමක් විය. එසේම තත්‍ය ආදායම රු.2,217,908,134 ක් විය.

(ආ) දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල කුඩා පරිමාණ ජල විදුලි බලාගාර පවත්වාගෙන යන ආයතන 02 කින් 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගාස්තු නොගෙවීම මත 2026 මැයි 08 දිනට අයවිය යුතු හිඟ ගාස්තුව රු. 12,110,055 ක් වූ අතර වර්ෂ 05 සිට වර්ෂ 11 දක්වා කාලයක් අය නොවී පවතින එම ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන ලිපි ගොනු අනුව දුරකථන සන්නිවේදන ආයතන 03 ක් විසින් භාවිතා කරන දුරකථන කුළුණු 04 කට අදාලව 2012 වර්ෂයේ සිට පැවත එන හිඟ ශේෂය රු. 30,498,453 ක් 2026 මැයි 08 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බලපත්‍ර අංක H7/405/2009 යටතේ බදුල්ල දිසාවේ ඌව මාවෙලගම රජයේ කැලය තුල පුද්ගලික සමාගමක් විසින් ඉදිකර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණ වෙත ගමන්කිරීම සඳහා දෙපාර්තමේන්තුව පාලනයේ ඇති රක්ෂිතයේ පර්චස් 72 ක බිම් ප්‍රමාණයක් 2009 වර්ෂයේ සිට භාවිතා කර ඇති බවත්, ඒ සඳහා ගාස්තු අය නොකරන බවත්, ගාස්තු අය කිරීම සුදුසු බවත් බදුල්ල දිසා වන නිළධාරී විසින් දන්වා තිබුණද, 2025 අගෝස්තු 30 දින වන විටත් ඒ සඳහා ගාස්තු අය කර නොතිබුණි. තවද 2009 වර්ෂයේ සිට වර්ෂ 16 ක් පුරාවට මෙම භූමිය භාවිතයට අදාල ගාස්තු නොගෙවා අනවසරයෙන් පරිහරණය කිරීම සම්බන්ධයෙන් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා බදු මුදල් ගෙවීම පැහැර හැරීමේ දී දඩ මුදල් අය කරන ආකාරය (රේටය, කාල සීමාව) පිළිබඳව කොන්දේසි කැලෑ දෙපාර්තමේන්තු 195 විවිධ අවසර පත්‍රයේ දක්වා නොතිබුණු අතර ඒ සඳහා අනුමත රේටයන්ද නොතිබුණි.

## 3.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන්දීමේ නිලධාරියා විසින් වගබලා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 13 ක මූලික වියදම් ඇස්තමේන්තු සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 25 සිට සියයට 134 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

## 3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | **1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනත**<br>224 වගන්තිය | - | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් මැනීම් සිදුකර විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බීට්ටු වන කාර්යාල හා අඩවි වන කාර්යාල 17 කට අයත් හෙක්ටයාර් 10,0861 ක් විධිමත්ව පවරාගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| i. | මුදල් රෙගුලාසි 571 | 12,892,412 | සමාලෝචිත වර්ෂය අවසානයට ඇප තැන්පතු හා තෙවන පාර්ශවීය රැඳවුම් තැන්පතු ගිණුම්වල පවතින වසර 02 ඉක්මවූ එකතුව රු.12,892,412 ක ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| ii. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) | - | වන විද්‍යායතනයේ 2019, 2020, 2021 හා 2022 වර්ෂ සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු කර නොතිබුණු අතර 2024 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ සිදු කර තිබුණද එය මුදල් රෙගුලාසි වල දක්වා ඇති කාල රාමුව තුල සිදුකර නොතිබුණි. |
| iii. | මුදල් රෙගුලාසි 770 (4) | - | වර්ෂ 03 කට වැඩි කාලයක් තිස්සේ ගර්හිත තත්ත්වයේ පවතින ප්‍රධාන කාර්යාලයේ සහ කලාප කාර්යාල හා දිසා වන කාර්යාල 20 කට අයත් වාහන 119 ක් 2026 මාර්තු 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | **2022 දෙසැම්බර් 20 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය** | - | 2020 සිට 2022 දක්වා සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු ඉහල නංවා නොමැති සියලුම රජයේ ආයතන විසින් අදාල රේඛීය අමාත්‍යංශයේ ලේකම් ගේ අනුමැතිය ලබාගෙන ගාස්තු ඉහල නැංවීමට කටයුතු කල යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා අය කරනු ලබන ගාස්තු 2019 වර්ෂයෙන් පසු නැවත සංශෝධනය කර නොතිබුණු අතර වනජ ද්‍රව්‍ය එකතු කිරීමේ ගාස්තු 2009 වර්ෂයෙන් පසු සංශෝධනය කර නොතිබුණි. |
| (ඇ) | **2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරණ ජාතික අයවැය චක්‍රලේඛය 4.2 වගන්තිය** | - | නිල වාහන හිමිකම් ලබන නිලධාරීන්ට එක් වාහනයක් පමණක් අනුයුක්ත කල යුතු අතර, නිල වාහන අනුයුක්ත කර ඇති සහ නිල වාහන වෙනුවට මාසික ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධාරීන් කිසිදු අවස්ථාවක සංචිත වාහන භාවිතා නොකල යුතු වුවද, වාහන 04 ක ධාවන සටහන් පරීක්ෂාවේදී නිල වාහන අනුයුක්ත කර ඇති නිලධාරීන් 04 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ අවස්ථා 15 කදී එකතුව කි.මී. 8179 ක් වන ගමන් සඳහා සංචිත වාහන භාවිතා කර තිබුණි. |

## 3.5 අවිධිමත් ගනුදෙනු

(අ) 2023 වර්ෂයේ ගිණුම් පියවීමෙන් පසු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පුහුණු වැඩසටහන් සඳහා රු. 264,333 ක් 2023 දෙසැම්බර් 29 දින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නුවරඑළිය, ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයට ගෙවා තිබුණු අතර එම මුදල ප්‍රධාන කාර්යාලය වෙත එවීම මැයෙන් අංක 12/27/65 දරන වවුචර්පතට මුදල් චෙක්පතක් බැංකුවට ඉදිරිපත් කර 2024 ජනවාරි 04 දින එම මුදල් චෙක්පත නිශ්කාශනය වී තිබුණද, අදාල රු. 264,333 ක මුදල ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුමට බැර වීමක් හෝ මුදලින් සරප් අංශය වෙත ලැබීමක් සිදුව නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ ජල පාරිභෝගික ගිණුම් අංක 47031 හි 2023 ජනවාරි හා මාර්තු මාසයන්වල ජල බිල්පත් වෙනුවෙන් නුවරඑළිය මහ නගර සභාවට ගෙවීමට අදාල 2023 දෙසැම්බර් 04 දින මුදල් චෙක්පතක් මඟින් රු.250,302.50 ක මුදලක් නිශ්කාශනය කර තිබුණද, 2023 වර්ෂයේ ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ ජල බිල්පත් ගෙවීම පිළිබඳව නුවරඑළිය මහනගර සභාවෙන් විගණනය වෙත ලද තොරතුරු අනුව එවැනි ගෙවීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ ලංකා බැංකු ගිණුමෙන් නිශ්කාශනය වී තිබූ රු. 250,302.50 ක මුදල උපයෝජනය කිරීම පිළිබඳ විගණනයේ දී තහවුරු කරගත නොහැකි විය.

(ඇ) මුදල් රෙගුලාසි 261(2) ප්‍රකාරව චෙක්පතක් මඟින් ගෙවීම් කරන කල චෙක්පත් අංකය වවුචරයේ මෙන්ම මුදල් පොතේ නියමිත සටහන ඉදිරියෙන් සඳහන් කල යුතු වුවද, ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ 2023 වර්ෂයේදී චෙක්පත් මඟින් සිදුකල ගෙවීම් සම්බන්ධ නියැදි පරීක්ෂාවේදී චෙක්පතෙහි අංකය වවුචරයේ සඳහන් කර නොමැති අවස්ථා 30 ක් පැවතිණි.

(ඇ) මුදල් රෙගුලාසි 262 (1) ප්‍රකාරව ගෙවීම් කල දිනය යටතේ සියලුම ගෙවීම් මුදල් පොතෙහි සටහන් කර ගිණුම්ගත කල යුතු වුවද , ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ 2023 වර්ෂයේ අවස්ථා 47 කදී එකතුව රු. 4,134,980 ක ගෙවීම් මුදල් පොතෙහි සටහන් කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ ගබඩා සංකීර්ණය පිහිටි දෙපානම ඉඩම මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක් බැවින් එම ඉඩමෙහි පිහිටි ගොඩනැගිල්ලක් අළුත්වැඩියා හා වැඩිදියුණු කිරිම සඳහා ප්‍රාග්ධන වියදම් දැරිමට බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම් මුදල් රෙගුලාසි 135 (5) (අ) වගන්තියට පටහැනි වීමක් විය. තවද මෙම ගොඩනැගිල්ලේ කොටසක නේවාසිකව සිටින නිලධාරියකුගෙන් එම කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix හි 1.1 සහ 5. 3.1 ට පටහැනිව උපලේඛනගත නිවසක් සේ සලකා නිවාස කුලී අය කිරීමද සිදුකර තිබුණි.

## 3.6 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) දෙපාර්තමේන්තුවේ එක් බැංකු ජංගම ගිණුමකට අදාළව 2025 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් 31 දක්වා තැන්පත් කරන ලද එකතුව රු. 38,018,275 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයේ දී අවසන් වූ පරිසර පද්ධති සංරක්ෂණ කලමනාකරණ ව්‍යාපෘතියට අයත් නිල බැංකු ගිණුම් 18 ක් අක්‍රියව පැවතියද, 2025 දෙසැම්බර් 31 දිනට ඒවා මුල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණු අතර එම ගිණුම් වසා දැමීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ 2023 වර්ෂයේ බැංකු සැසඳුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොවුන අතර, 2024 ජනවාරි සිට 2024 සැප්තැම්බර් දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන වර්ෂයක් ගත වූ පසු 2025 සැප්තැම්බර් මාසයේදී, 2024 ඔක්තෝබර් සිට 2025 නොවැම්බර් දක්වා මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන මාස 02 ත් වර්ෂ 01 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව 2025 නොවැම්බර් 05 දින හා 2026 පෙබරවාරි 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ඈ) එසේ ඉදිරිපත් කර තිබූ 2024 ජනවාරි සිට 2025 නොවැම්බර් දක්වා එක් එක් මාසවල බැංකු සැසඳුම් ප්‍රකාශන මුදල් පොතේ ආරම්භක ශේෂයට ගැලපීම් කර අදාල මාසයේ අවසාන දිනට මුදල් පොතේ ශේෂය දක්වා තිබුණද මුදල් පොතේ ශේෂයට බැංකු ප්‍රකාශනයේ ශේෂය සැසඳීමක් කර නොතිබුණි. ඒ අනුව ඒවා බැංකු සැසඳුම් ප්‍රකාශ ලෙස පිළිගත නොහැකි විය.එසේම එම බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීම සඳහා සිගාස් මෘදුකාංගය භාවිතා කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

හලාවත බීට්ටුවට අයත් වගා බිම් අංක 01/008 හි හෙක්ටයාර 20 ක 2022 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු කායා වගාවේ අපේක්ෂිත ආයු කාලය අවුරුදු 20 ක් වන අතර මෙම වගාව සඳහා විගණිත දිනය වූ 2025 අගෝස්තු 29 දින වන විට රු. 4,313,305 වැය කර තිබුණි. විගණනයට ලද තොරතුරු අනුව මෙම වන වගාව වර්තමානය වන විට අහිතකර පාරිසරික තත්ත්වයන් සහ කෘමි හානි හේතුකොට ගෙන අසාර්ථක වන වගාවක් බවට පත්ව තිබීමෙන් වගාවන් සඳහා දැරූ වියදම නිෂ්කාර්ය වී තිබුණි.

### 4.2 ප්‍රසම්පාදනයන්

(අ) වන සංරක්ෂණ කටයුතුවලදී වනාන්තරවල මායිම් නිරූපනය, වන අපරාධ සිදු වූ ස්ථාන පිළිබඳව අධිකරණයට වාර්තා සැපයීම, වන කළමණාකරන කටයුතු, ජාතික වන සංගණනය හා වෙනත් වන සංරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා ස්ථානීය දත්ත ලබා ගැනීමට වැදගත් වන GPS උපකරණ 20 ක් 2024 වර්ෂයේදී රු. 3,221,400 කට (බදු සහිත) මිලදී ගැනිමේදී 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අදාල ලංසුකරු වෙත ව්ධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කිරීමට හා 8.9.1(ආ) ප්‍රකාරව ලිඛිත ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ට පටහැනිව විශේෂිත පිරිවිතයන් අඩංගු වූ මෙම GPS උපකරණ මිලදී ගැනිමේ දී වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි.

(ආ) 2024 නොවැම්බර් 25 දිනැති භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සමඟ කියවිය යුතු ප්‍රසම්පාදන අත්පොතෙහි 2.6 (ඇ) (VI) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සමාජිකයෙකු

ලෙස අදාල විෂය කරුණු පිළිබඳ දැනුමක් සහිත සමාජිකයෙකු පත් කල යුතු වුවද, දෙපානම ගබඩාවේ නවීකරණ කටයුතු සිදු කිරීමේදී එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2024 නොවැම්බර් 25 දිනැති භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රසම්පාදන අත්පොතෙහි 3.1.5 ප්‍රකාරව පිරිවැය සහ කාර්යක්ෂමතාවය සලකා බලන විට වඩා තරහකාරී ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීම ඵලදායි නොවන අවස්ථාවන් හි දී හා අඩු වටිනාකමකින් යුත් නොපමාව ලබාගත හැකි භාණ්ඩ, සම්මත පිරිවිතර සහිත අඩු වටිනාකමින් යුත් අයිතමයන් හා නිරන්තරයෙන් ප්‍රසම්පාදන කෙරෙන අඩු වටිනාකමින් යුත් වැඩ සහ උපදේශනාත්මක නොවන සේවා සඳහා වෙළඳපල මිල සැදැහුම් භාවිතා කල හැකි වුවද රු. 14,079,170 ක් (බදු සහිත) වටිනා ලැප්ටොප් පරිගණක 49 ක් මිලදී ගැනීමේදී රේන්බෝ පිටුවල ලියාපදිංචි සැපයුම්කරුවන් මගින් සැපයුම්කරු තෝරා ගැනීම හේතුවෙන් සහ වන විද්‍යා ආයතනයට ආරක්ෂක සේවාව සපයා ගැනීමේ දී 2022 නොවැම්බර් සිට 2026 මාර්තු 31 දක්වා කාල සීමාව සඳහා වාර්ෂිකව එකම ආයතන 03 ක් මගින් මිල ගණන් කැඳවා තිබීමෙන් වඩාත් තරහකාරිත්වයක් ඇතිකර පිරිවැය සඵලදායීතාවය වැඩි කර ගැනීම පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණි.

(ඈ) 2024 ප්‍රසම්පාදන අත්පොතෙහි 5.13 ප්‍රකාරව ප්‍රසම්පාදන ලේඛනවල ලංසුකරුවන්ගේ වැට් බදු ලියාපදිංචි අංකය සමහ වැට් බදු සංරචකය වෙන් වශයෙන් සඳහන් කරන ලෙස ලංසුකරුවන්ට උපදෙස් දිය යුතුවීම හා ඇගයීම් ක්‍රියාවලියේදී, සියළුම ලංසු සමාන මට්ටමකට ගෙන සැසඳීමේ අරමුණින් වැට් බද්ද අතහැර ඇගයීමට ලක් කල යුතු වුවද ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 4.3 වත්කම් කළමනාකරණය

(අ) ශ්‍රී ලංකා වන විද්‍යායතනය තුළ 1994 හා 2022 වර්ෂවල ඉදිකරන ලද වර්ග අඩි. 2823.62 කින් යුත් රජයේ නිවාස 22 ක්, වර්ග අඩි 853 කින් යුත් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් හා වර්ග අඩි. 555.38 කින් යුත් ක්‍රීඩාගාරයක් 2022 වර්ෂයේ සිට එනම් වසර 3 ක් පුරා ඒවා ඉදිකළ කාර්යයන් සඳහා භාවිතා නොකර 2025 අගෝස්තු 01 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. ඉන් රජයේ නිවාස 9 ක් අලුත්වැඩියා කල යුතු තත්ත්වයට පත්ව ඇති අතර, ද්විතියික මට්ටමේ නිලධාරීන් සඳහා වූ රජයේ නිවාස 06 ක වැසිකිළි නිවාසය තුල පිහිටා නොතිබුණි.

(ආ) වෙනත් රජයේ ආයතන සතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 81 ක අයිතිය 2026 මාර්තු 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.4 පාඩු හා හානි

(අ) මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත ඒ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ 1996 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුල සිදුව තිබූ රු. 8,970,311 ක්වූ අලාභහානි සිද්ධි 41 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට 2026 මාර්තු 27 දින වන විටත් කටයුතු කර නොතිබුණි. සිද්ධි 30 කට අදාල මු.රෙ. 104 (4) ප්‍රකාරව පූර්ණ

පරික්ෂණ මණ්ඩලය පත් කිරීම 2026 වර්ෂයේදී වර්ෂ 01 ත් වර්ෂ 29 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව සිදුකර තිබුණි. ඉන් සිද්ධි 21 ක් සම්බන්ධයෙන් මු.රෙ. 104 (3) ප්‍රකාර වාර්තා ලැබුණු දිනයන් පිළිබඳව විස්තර විගණනයට ඉදිරිපත් නොවිය.

(ආ) මුදල් රෙගුලාසි 109(1) ප්‍රකාරව පරික්ෂණ කටයුතු අවසන් වූ රු. 8,574,713 ක්වූ අලාභ හානි සිද්ධි 06 ක් පොතෙන් අස් කිරීමේ නියෝගය ලබා ගැනීම වෙනුවෙන් මු.රෙ. 108 හි දැක්වෙන බලය පැවරී ඇති අමාත්‍යාංශ ලේකම් හා වන සංරක්ෂක ජනරාල් වෙත යොමු කර තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විටත් එම නියෝග ලැබී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශයේ වන සංරක්ෂක භාරයේ තිබූ 2024 වර්ෂයේ රු.1,610,700 කට මිලදී ගත් GPS 10 ක් අස්ථාන ගත වී ඇති බවට 2025 ජූනි 02 දින අංක FD/IG/05/99/2025 දරන ලිපිය මගින් වන සංරක්ෂක ජනරාල් වෙත වාර්තාවී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභ හානි අයකර ගැනීමට විගණිත දිනය වූ 2025 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිවරිය ලෙස සේවය කල නිලධාරිනිය 2023 පෙබරවාරි 12 දින වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ආඥා පනතේ 2(17) යටතේ විශ්‍රාම ගන්වා තිබූ අතර නිලධාරිනිය විසින් භාවිතා කර තිබූ ලැප්ටොප් පරිගණක යන්ත්‍රය, මූසිකය (Mouse) සහ ගණක යන්ත්‍රය නිලධාරිනිය විශ්‍රාම යෑමට පෙර දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරවරයාට ලිඛිතව භාර දුන් බවට ලිපියක් ලිපිගොනුව තුල තිබුණද එම පරිගණකය දෙපාර්තමේන්තුවේ නොතිබීම නිසා රජයට සිදුවී තිබූ රු. 336,061 ක අලාභය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 4.5 අනාර්ථික ගනුදෙනු

(අ) 2020 පෙබරවාරි 24 දින රු. 12,417,573 ක ඇස්තමේන්තු ගත මුදලකට ගිවිසුම් ගතවී වාහන 15 ක් නැවැත්වීම සඳහා ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ ඉදි කර තිබූ වාහන නැවතුම්පලේ වාහන ගාල් කරන කුටීර 04 ක පවතින අසාමාන්‍ය ආනතිය හේතුවෙන් වාහන ගාල් කිරීමට නොහැකි වී ඇති බව 2025 ජූලි 30 දින කරන ලද භෞතික පරික්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ආ) පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරන ව්‍යාපෘතිය (ESCAMP) මගින් නුවරඑළිය වන විද්‍යායතනයේ මහල් 05 කින් යුත් පරිපාලන ගොඩනැගිල්ලක් අළුතින් ඉදි කිරීම සඳහා රු.136,271,348 ක ඇස්තමේන්තු ගත වටිනාකමකට 2021 මැයි 11 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2025 ජූලි 30 දින සිදුකල භෞතික පරික්ෂාවේ දී ගොඩනැගිල්ලේ පළමු මහලේ කොටසක් පමණක් ඉදිකර තිබුණ අතර, මෙම ඉදිකිරීම අවසන් කිරීමට කටයුතු නොකිරීම නිසා ඉදිකිරීම සඳහා වැය කර ඇති පිරිවැය නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) එසේම නව පරිපාලන ගොඩනැගිල්ල සඳහා යෝජිත විදුලි සෝපාන ක්‍රියාත්මක කිරීමට 2022 වර්ෂයේ මිලදී ගෙන තිබූ කිලෝ වොට් 90 ක විදුලි ජනන යන්ත්‍රයද නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ අංක 04 නේවාසිකාගාරය වැඩි දියුණු කිරීම සඳහා රු. 50,995,040 ක ඇස්තමේන්තු ගත වටිනාකමකට 2019 දෙසැම්බර් 02 දින කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹ තිබුණි. 2025 ජූලි 30 දින ස්ථානිය පරික්ෂාව සිදු කරනු ලබන අවස්ථාව වන විටත් අදාල වැඩි දියුණු කිරීමේ කටයුතු අවසන්ව නොතිබුණු අතර ගොඩනැගිල්ලේ වහලය වෙනත් ගොඩනැගිල්ලකින් ඉවත් කල තැන තැන සිදුරු සහිත තහඩු

වලින් ආවරණය කර තිබුණි. ගොඩනැගිල්ලේ නවීකරණය අවසන් නොවීම නිසා අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා නොකිරීමෙන් මේ සඳහා දරනු ලැබූ පිරිවැය ද නිශ්කාර්ය වී තිබුණි.

(ඉ) පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරන ව්‍යාපෘතිය යටතේ රු. 23,901,590 ක ඇස්තමේන්තුගත වටිනාකමකට 2020 පෙබරවාරි 24 දින ගිවිසුම්ගතවී ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ ඉදිකර තිබූ වැසි ජල කළමණාකරන පද්ධතිය ආරම්භයේ සිටම ක්‍රියාත්මකවී නොතිබීම නිසා ඒ සඳහා වැය කළ මුදල නිශ්කාර්ය වී තිබුණු අතර ඒ වෙනුවෙන් මිලදී ගත් ජල මෝටර් පද්ධතියේ වගකීම් කාලයද ඉකුත් වී තිබූ බව 2025 ජුලි 30 දින සිදුකරනු ලැබූ ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

### 4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2025 ගිණුම් වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන විමසුම් 06 ක් සඳහා මාස 01 ත් 07 ත් අතර කාලයක් ගතවී තිබුණ ද පිළිතුරු ලබා දී නොතිබුණි.

### 4.7 කළමනාකරණ දුර්වලතා

(අ) 2021 වර්ෂයේ දි රු. 2,424,697 (බදු සහිතව) කට මිලදී ගෙන තිබූ 12"×18" ප්‍රමාණයේ පොලිතින් මළු 280000 කින් රු. 2,264,850ක වටිනාකමකින් යුත් පොලිතින් මළු 261530 ක් එනම් මිලදී ගත් ප්‍රමාණයෙන් සියයට 93 ක් 2025 මැයි මස වන විටත් වසර 3 කටත් අධික කාලයක් හා 2023 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දි රු. 2,121,034 කට (බදු සහිතව) මිලදී ගෙන තිබූ 12" × 8" ප්‍රමාණයේ පොලිතින් මළු 200000 කින් රු. 1,375,880 ක වටිනාකමකින් යුත් පොලිතින් මළු 129800 ක් වසර දෙකකට ආසන්න කාලයක් තිස්සේ නිශ්කාර්යව දෙපානම ගබඩාව තුල පැවතුණි. තවද 2016 හා 2018 වර්ෂවලදී ශ්‍රී ලංකා වන විද්‍යායතනය විසින් මිලදී ගෙන තිබූ ප්‍රමාණ 02 කට අයත් පොලිතීන් මළු 154000 ක් වර්ෂ 09 කට ආසන්න කාලයක් තිස්සේ භාවිතා නොකර ගබඩාවේ පැවතුණි.

(ආ) සියෙරා පවර් (පුද්) සමාගමට බලපත්‍ර අංක H7/566/201 යටතේ 2012 වර්ෂයේ දි පර්චස් 102 ක් තුල පරගහඅරාව කන්දේයාය රජයේ කැලය තුල කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දි තිබුණ අතර, මෙම ආයතනය විසින් දෙපාර්තමේන්තුවට අයත් භූමියෙන් පර්චස් 174.44 ක් එනම් වැඩිපුර පර්චස් 72.44 ක් ගාස්තු නොගෙවා භාවිතා කළද අනවසරයෙන් භූමිය භාවිතා කිරීම බලපත්‍රයේ කොන්දේසි කඩකිරීමක් වන බැවින් බලපත්‍රය අවලංගු කිරීමට සහ භූමිය වැඩිපුර පරිහරණය සඳහා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේ දි කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යාමට ලොග්ගල්ඔය රජයේ කැලයෙන් පර්චස් 391 ක් වාර්ෂික ගාස්තුව රු. 1,955,000 කට බලපත්‍රයක් ලබා දි තිබූ අතර, ඒ සඳහා 2019 වර්ෂය දක්වා බලපත්‍ර ගාස්තු අයකර තිබුණද භූමි ප්‍රමාණය තිරණය කිරිමේ ගැටළු පැන නැඟිම හේතුවෙන් අදාල ආයතනය විසින් 2020 හා 2021 වර්ෂ සඳහා ගාස්තු ගෙවා නොතිබූ අතර, භූමිය පිළිබඳ ගැටළුව නිරාකරණය කර හිඟ ගාස්තු අය කිරීමට 2026 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) වන සංරක්ෂණ අඥාපනතේ 3(2)(3) වගන්තිය අනුව රක්ෂිත හා සංරක්ෂිත වනාන්තරවල ජෛව විවිධත්වය පස හා ජලය සංරක්ෂණය හා අනන්‍ය පරිසර පද්ධතින්, ජාන සම්පත්, දුර්ලභ ශාක, වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ව හා වෘක්ෂලතා විශේෂ සුරක්ෂිත කිරිම සඳහා කළමණාකරන සැලසුම් සකස් කර අනුමත කර ක්‍රියාත්මක කල යුතු වුවද, දිසාවන කාර්යාල 3ක් විසින් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සංරක්ෂිත 01 ක් හා රක්ෂිත 64 ක්

සඳහා රු.844,375 ක් වැයකර කළමණාකරන සැලසුම් 65 ක් සකස් කර තිබුණ ද 2025 අගෝස්තු 31 දින වන විටත් ඒවා අනුමත කර ක්‍රියාත්මක කර නොතිබුණි.එසේම පුත්තලම දිසාවන කාර්යාලයට අයත් හෙක්ටයාර 49,848 වපසරියකින් යුත් රක්ෂිත වනාන්තර 35 ක් සහ හෙක්ටයාර 1206 ක වපසරියකින් යුත් සංරක්ෂිත වනාන්තර 18 ක් 2025 වර්ෂය වන විට ගැසට් කර තිබුණද එම වනාන්තර සඳහා කළමණාකරන සැලසුම් සකස් කිරීමට 2026 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන සංචිතය යටතේ පවතින CAZ – 9856 දරන ජීප් රථයේ මාසික ධාවන සටහන් අනුව 2025 ජනවාරි සිට 2025 අගෝස්තු දක්වා ධාවනය කර තිබූ කි.මී. 9234 න් කි.මී. 405 ක ධාවනයන් පමණක් රාජකාරි ගමන් ලෙස අනුමත කර තිබූ අතර ඉතිරි කි.මී. 8829 ක ගමන් සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඊ) 2023 ජූලි 02 දින සිදු කරන ලද ඉන්ධන දහන පරීක්ෂාව අනුව CAZ – 9856 දරන ජීප් රථයේ ඉන්ධන ලීටරයකින් ධාවනය කරන දුර කි.මී 05 ක් ලෙස ගණනය කර තිබුණ අතර, දෙපාර්තමේන්තුව සතුව හා ප්‍රවාහන සංචිතයේ ඉන්ධන භාවිතය කාර්යක්ෂම වාහන තිබිය දී, නුවරඑළිය, අනුරාධපුර, දෙනියාය, රත්නපුර, මුලතිව්, තණමල්විල, මොනරාගල, කෑගල්ල හා ගල්ගමුව ආදී දුර ගමන් සඳහා මෙම ජීප් රථය භාවිතා කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂයේ රු. 1,308,821 ක් හා 2025 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ මාස 08 හි රු.563,878 ක ඉන්ධන වියදමක් දරා තිබුණි.

(උ) 2000 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුල ආරම්භ කර පවත්වාගෙන යනු ලබන විනය ලිපිගොනු 126 ක් පැවති අතර, 2025 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 01 ත් 25 ත් අතර කාලයක් ගත වී තිබුණද, ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන එම විනය කටයුතු අවසන් කර නොතිබුණි.

5. **මානව සම්පත් කළමනාකරණය**

(අ) දෙපාර්තමේන්තුවේ කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම වෙනුවෙන් මානව සම්පත් අවශ්‍යතා සුදුසු අවස්ථාවේ හඳුනා ගනිමින් අවශ්‍ය බඳවා ගැනීම් සිදු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 45 ක්, තෘතීය මට්ටමේ පුරප්පාඩු 43 ක්, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 383 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 294 ක් වශයෙන් මුළු පුරප්පාඩු 765 ක් විය.

(ආ) දෙපාර්තමේන්තු දිසාවන කාර්යාල කටයුතු කරගෙන යාමේදි මානව සම්පත සුවිශේෂි සාධකයක් වුව ද නුවරඑළිය අඩවියේ සේවය කරන බිට්ටු හා වන ක්ෂේත්‍ර කොට්ඨාශ සඳහා අනුයුක්ත කළ නිලධාරින් 28 කට තම නිත්‍ය සේවා ස්ථානයේ රාජකාරියට අමතරව එම අඩවියේ බිට්ටු 3 ක සහ නුවරඑළිය, හල්ග්‍රන්ඔය හා හැටන් යන අඩවිවල වන ක්ෂේත්‍ර කොට්ඨාශ 27 ක පුරප්පාඩු පවතින නිලධාරින් 30 කගේ රාජකාරිද, මන්නාරම දිසාවන කාර්යාලයට අයත් බිට්ටු හා වන ක්ෂේත්‍ර කොට්ඨාශ සඳහා අනුයුක්ත කළ නිලධාරින් 4 කට එම කොට්ඨාශයේ පුරප්පාඩු 09 ක රාජකාරි ඉටුකිරිමටද සිදු වී තිබුණි.

කේ.එච්.යූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# 04 පරිච්ඡේදය
# කාර්ය සාධන දර්ශකය

## 4.1 කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධක දර්ශක පහත පරිදි වේ)

*වගුව 4.1 :කාර්යසාධන දර්ශක*

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස (%) නිමැවුම් තත්‍ය | | |
|---|---|---|---|---|
| | | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| **1** | ගොඩනැගිලි සහ ව්‍යුහයන් යටතේ ගොඩනැගිලි 42ක නඩත්තු කිරීම (200 A) | 100% | - | - |
| **2** | සංචාරක බංගලා,මාර්ග, වැටවල් සහ වහලවල් ඇතුළු මුළු නිවාස 46ක නඩත්තු කටයුතු කර ඇත (200 B) | 100% | - | - |
| **3** | වාහන නඩත්තු කිරීම (203) | 96% | - | - |
| **4.** | උපකරණ හා යන්ත්‍ර මිලදී ගැනීම (210) | 100% | - | - |
| **5** | කාර්යාල හා විද්‍යුත් උපකරණ නඩත්තු කිරීම (211) | 98% | - | - |
| **6** | මෘදුකාංග සංවර්ධනය (250) | 97% | - | - |
| **7** | වාණිජ වන වගා ස්ථාපිත කිරීම (RCT) හා නඩත්තු කිරීම සඳහා 1,352,663ක් පැළ නිෂ්පාදනය | 117% | - | - |
| **8** | හෙක්ටයාර 688.31ක ප්‍රමාණයක නැවත වන වගා කිරීම | 98% | - | - |
| **9** | හෙක්ටයාර 2,191.69ක නොමේරූ වන වගා නඩත්තු කිරීම (Young plantation Maintenance) (1,2,3,4,5,6) | 99.7% | - | - |
| **10** | හෙක්ටයාර 305.60ක පූර්ව වාණිජ තුනී කිරීම් සිදු කිරීම | 97% | - | - |
| **11** | හෙක්ටයාර 522.4ක වාණිජ තුනී කිරීම් සිදු කිරීම | 99% | - | - |
| **12** | හෙක්ටයාර 569.8ක ගස් සලකුණු කිරීම | 86% | - | - |
| **13** | කඳුමුදුන් මත වන වගා සිදු කිරීම සඳහා බීජ පැළ 21,000ක් නිෂ්පාදනය | 100% | - | - |
| **14** | කඳුමුදුන් මත ඇති වන වගා හෙක්ටයාර 20ක නඩත්තු සිදු කිරීම | 100% | - | - |
| **15** | හෙක්ටයාර 756.18ක ස්කන්ධ භාග ගණනය කිරීම | 100% | - | - |
| **16** | පොලිතීන් බෑග් 1,402,840ක් මිලදී ගැනීම | 100% | - | - |
| **17** | හෙක්ටයාර 292.04 ක අමතර නඩත්තු කටයුතු සිදු කිරීම | 100% | - | - |
| **18** | තිරසාර වන කළමනාකරණය හරහා ඉඩම් ගැටළු විසඳීමේ වැඩසටහන් 02ක් පැවැත්වීම | 50% | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 19 | GPS බණ්ඩාංක භාවිතා කරමින් කිලෝමීටර 1546.08 ක වනාන්තර මායිම් මැනීම සහ ප්‍රකාශ කිරීම සඳහා සිතියම් සකස් කිරීම | 107.1% | - | - |
| 20 | කිලෝමීටර 1546.08 ක වනාන්තර සීමා නිර්ණය කිරීම | 181.8% | - | - |
| 21 | ජාතික වන සංගණන නියැදි 782ක දත්ත ලබාගැනීම (NFI) | 100% | - | - |
| 22 | හෙක්ටයාර 942.57ක වන වගා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා තොරතුරු රැස් කිරීම. | 94.2% | - | - |
| 23 | වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පැළ 62,400ක් නිෂ්පාදනය කිරීම | 99% | - | - |
| 24 | හායනයට පත් වනාන්තර හෙක්ටයාර 100ක් නැවත ප්‍රතිස්ථාපනය කිරීම. | 99% | - | - |
| 25 | ප්‍රතිස්ථාපිත වනාන්තර හෙක්ටයාර 3,426ක් නඩත්තු කිරීම | 99% | - | - |
| 26 | ආගමික ස්ථානවල ස්ථාපිත වනාන්තර හෙක්ටයාර 4ක් නඩත්තු කිරීම. | 99% | - | - |
| 27 | කඩොලාන ස්ථාපිත ප්‍රදේශ හෙක්ටයාර 195ක් පිරිසිදු කිරීම. (Clean Sri Lanka) | 98% | - | - |
| 28 | ප්‍රතිස්ථාපිත වනාන්තර හෙක්ටයාර 102ක වනාන්තර ආරක්ෂණය හා කළමනාකරණය සිදු කිරීම | 100% | - | - |
| 29 | අලි ඇතුන් සිටින වාසස්ථාන හෙක්ටයාර 56.9ක් වැඩිදියුණු කිරීම. | 99% | - | - |
| 30 | ගෙවතු 5000ක් ස්ථාපිත කිරීම | 100% | - | - |
| 31 | බීජ පැළ 412,500ක් නිෂ්පාදනය කිරීම. | 100% | - | - |
| 32 | හෙක්ටයාර 228.4ක නව ගොවි වන වගා ස්ථාපනය කිරීම | 100% | - | - |
| 33 | හෙක්ටයාර 511.76ක ගොවි වන වගා නඩත්තු කිරීම | 100% | - | - |
| 34 | බීජ පැළ තවාන් නඩත්තු කිරීම | 100% | - | - |
| 35 | පැළ තවාන් 06ක් සංවර්ධනය කිරීම | 100% | - | - |
| 36 | වන ව්‍යාප්ති වැඩසටහන් 1420ක් පැවැත්වීම | 160% | - | - |
| 37 | නාගරික තුරු ගොමු ස්ථාපනය කිරීමේ වැඩසටහන් 05ක් පැවැත්වීම | 100% | - | - |
| 38 | මාර්ග දෙපස කිලෝමීටර 25ක රුක් රෝපණ වැඩසටහන් සිදු කිරීම | 100% | - | - |
| 39 | වනාන්තර ආශ්‍රිත මාර්ග දෙපස කැළි කසළ ඉවත් කිරීමේ වැඩසටහන් 50ක් පැවැත්වීම | 100% | - | - |
| 40 | පොලිතින් බෑග් 700,000.00ක් මිලදී ගැනිම | 100% | - | - |
| 41 | වනාන්තර දින රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම | 100% | - | - |
| 42 | සංචාරක නිකේතන සහ ගමනාන්ත 58ක් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම | 100% | - | - |
| 43 | කිලෝමීටර 168 ක ස්වභාවික මංපෙත් සහ කිලෝමීටර 112ක සෆාරි ජීප් ධාවන පථ නඩත්තු කිරීම | 100% | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **44** | ටිකට් පත් 1,076,250ක් මුද්‍රණය කිරීම | 100% | **-** | **-** |
| **45** | වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව මත ගමනාන්ත 18ක අනෙකුත් නඩත්තු කටයුතු සිදු කිරීම | 100% | **-** | **-** |
| **46** | සංචාරක ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම යටතේ කැප් හා ටී-ෂර්ට් මුද්‍රණය කිරීම හා කන්නෙලිය සඳහා සංචාරක මාර්ගෝපදේශක පුහුණු වැඩසටහනක් පැවැත්වීම | 100% | **-** | **-** |
| **47** | වන කළමණාකරන සැලසුම් සකස් කිරීම | 100% | | |
| **48** | පිදුරුතලාගල, වීරක්කොඩිචෝලේ හා නිල්ගල රක්ෂිත සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුමක් සකස් කිරීම | 100% | **-** | **-** |
| **49** | වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා අදාළ වැඩමුළු 05ක් මාතලේ, කුරුණෑගල, නුවරඑළිය, බදුල්ල, මොනරාගල, ගම්පහ, පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, වවුනියාව,කිලිනොච්චිය,මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පැවැත්වීම | 100% | **-** | **-** |
| **50** | ශ්‍රී ලංකාවේ වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂ 5 ක් සංරක්ෂණය කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම | 100% | **-** | **-** |
| **51** | කලාප වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම්07ක් සහ අත්පත් කර ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පැවැත්වීම. | 100% | **-** | **-** |
| **52** | ඉඩම් සංරක්ෂණය හා අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට අදාලව IUCN ආයතනයට ගාස්තු ගෙවීම් සහ මෙහෙයුම් නඩත්තුව සිදු කිරීම | 100% | **-** | **-** |
| **53** | පර්යේෂණ අත්හදා බැලීම් නඩත්තු කිරීමේ ක්‍රියාකාරකම් 45ක් සිදු කිරීම | 98% | **-** | **-** |
| **54** | විශ්වවිද්‍යාල සමඟ නව පර්යේෂණ සහ සහයෝගී පර්යේෂණ 135ක් සිදු කිරීම | 100% | - | - |
| **55** | පර්යේෂණ වාර්තාවන් 05ක් ප්‍රකාශයට පත් කිරීම | 100% | - | - |
| **56** | වන වගා සඳහා බීජ උද්‍යාන නඩත්තුව හා ගුණාත්මක බීජ නිෂ්පාදනය යටතේ ක්‍රියාකාරකම් 09ක් සිදු කිරීම | 100% | - | - |
| **57** | පර්යේෂණ මධ්‍යස්ථාන දෙකෙහි නඩත්තු කටයුතු සිදු කිරීම | 100% | - | - |
| **58** | සිසුන් ලෙස නිලධාරීන් 35ක් බඳවා ගැනීම | 100% | - | - |
| **59** | පැය 1017ක් සඳහා පාඨමාලා පැවැත්වීම (Theory and Practical) | - | 79% | - |
| **60** | විභාග 1ක් පැවැත්වීම | - | 75% | - |
| **61** | නිලධාරීන් 30ක් සඳහා NVQ 5/6 සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය (මෙය නොපැවැත්විණි) | - | - | 0% |
| **62** | කාර්යාල කාර්යය මණ්ඩල නිලධාරීන් 546ක් සඳහා සේවාස්ථ පුහුණුව | - | 82% | - |

| | | | | |
|---|---|---|---|---|
| **63** | කාර්ය මණ්ඩල පුහුණුව වැඩි දියුණු කිරීමට පුහුණු වැඩමුළු 05කින් පුහුණු 80%ක් සම්පූර්ණ කිරීම | - | 80% | - |
| **64** | කිලෝමීටර 39.72ක ගිනි පටි ස්ථාපනය කිරීම | - | 87% | - |
| **65** | කිලෝමීටර 16.15ක ස්ථාපිත ගිනි පටි නඩත්තු කිරීම | - | - | 48% |
| **66** | ගිනි නිවන උපකරණ මිලදී ගැනීම (උපකරණ කට්ටල 38ක්) | - | 83% | - |
| **67** | ගිනි පාලන වැඩසටහන් 256 ක් පැවැත්වීම | - | - | 68% |
| **68** | දැනුවත් කිරීමේ වැඩසටහන් 152ක් පැවැත්වීම | - | 76% | - |
| **69** | වන ආරක්ෂණය සඳහා වන අපරාධ මැඩලීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අවශ්‍ය වන වියදම් පියවීම | 100% | - | - |

# 05 පරිච්ඡේදය
# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

*වගුව 5.1: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය*

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක | දෙපාර්තමේන්තු ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය,තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | 15.1. 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරය පවත්නා මිරිදිය පරිසර පද්ධතිය සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන් විශේෂ වනාන්තර කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නඟා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම. | 2030 දී 32% දක්වා වන ආවරණය වැඩි කිරීම | | | | |
| | | 2025 ඉලක්ක | | | | |
| | | වනාන්තර මායිම් කිලෝමීටර 850 ක් නිරූපණය | කිලෝමීටර් 1546.08 | | | 100% |
| | | GPS ඛණ්ඩාංක භාවිතා කරමින් කිලෝමීටර 1000 ක වනාන්තර මායිම් මැනීම සහ ප්‍රකාශ කිරීම සඳහා සිතියම් සකස් කිරීම | කිලෝමීටර් 1546.08 | | | 100% |
| | | පවත්නා පර්යේෂණ නඩත්තු කිරීම (ක්‍රියාකාරකම් 46) | ක්‍රියාකාරකම් 45 | | | 98% |
| | | නව අත්හදා බැලීම් පර්යේෂණ ස්ථාපනය හා සංවර්ධනය (පර්යේෂණ 11) | පර්යේෂණ 11 සිදුකර ඇත. | | | 100% |
| | | බීජ මූලාශ්‍ර සංවර්ධනය කිරීම හෙක්ටයාර 13 හා බීජ එකතු කිරීම | හෙක්ටයාර 13ක බීජ එකතු කර ඇත. | | | 100% |
| | | ස්වභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 100 ක් සකස් කිරීම. | ස්වභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 100 ක් සකස් කර ඇත. | | | 100% |
| | | නිල්ගල රක්ෂිතය, වීරක්කොඩිචෝලේ රක්ෂිතය හා පිදුරුතලාගල සංරක්ෂිතය වනාන්තර සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම. | නිල්ගල රක්ෂිතය, වීරක්කොඩිචෝලේ රක්ෂිතය හා පිදුරුතලාගල සංරක්ෂිතය වනාන්තර සංකීර්ණය සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කර ඇත. | | | 100% |
| | | වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 03 ක් පැවැත්වීම. | වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 05 ක් පවත්වා ඇත. | | | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | වඳවියාමේ තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂ 05 සංරක්ෂණය කිරිම. | උද්භිද උද්‍යාන නිලධාරින් විසින් බාහිර සංරක්ෂණය පිළිබඳව පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී. ශාක විශේෂ හඳුනාගැනිම සඳහා ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කරන ලදි. තෙත් කලාපය තුල තිබෙන වඳවීයාමේ තර්ජනයට මුහුණපා තිබෙන ශාක පිළිබඳ ප්‍රජාව දැනුවත් කරන ලදි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වඳවියාමේ තර්ජනයට මුහුණ පා ඇති ශාක පිළිබද දැනුවත් කරන ලදී. *Balanocarpus kitulgallensis* ශාකයේ පැළ 50ක් ද, *Stemonoporus gracilis* ශාකයේ පැළ 50ක් ද, *Syzygium amphoraecarpus* ශාකයේ පැළ 2500ක් ද, *Syzygium fergusonii* ශාකයේ පැළ 100ක් ද, *Ilex knucklesensis* ශාකයේ පැළ 500ක් ද, *Ceropegia lankana* ශාකයේ පැළ 200ක් ද, *Dialium ovoideum* ශාකයේ පැළ 100ක් ද, *Mangifera zeylanica* ශාකයේ පැළ 200ක් ද, *Mesua stylosa* ශාකයේ පැළ 200ක් ද, සාර්ථකව පැළ කර ඇත. තර්ජනයට ලක්ව ඇති විශේෂ පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු 10ක් ප්‍රදර්ශනය කර ඇත. | | | 100% |
| | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන වැඩසටහන් හා දැනුවත් කිරිමේ වැඩසටහන් 12 පැවැත්වීම | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන වැඩසටහන් 07 හා දැනුවත් කිරිමේ වැඩසටහන් 10 නකල්ස් සංරක්ෂිතය, සිංහරාජය රක්ෂිතය හා සංවේදි පරිසර පද්ධති මූලික කර ගනිමින් පවත්වා ඇත. | | | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිලධාරීන් හට පහසුකම් සැපයීම, පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධව වැඩමුළු 03 පැවැත්වීම | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිලධාරීන් හට පහසුකම් සැපයීම, පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධව වැඩමුළු 03 පවත්වා ඇත | | | 100% |
| | **15.2.** 2020 වන විට සියළුම වර්ග වල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම, ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්ත්වයට පත් කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගා වර්ධනය කිරීම | ස්වභාවික පුනර්ජනනීය වනාන්තර ස්ථාපනය හෙක්.178 | වනාන්තර ප්‍රතිස්ථාපිත භූමි වපසරිය හෙක්.178 | | | 75%-100% |
| | | ස්වභාවික පුනර්ජනනීය වනාන්තර නඩත්තු හෙක්ටයාර් 1939 | වනාන්තර ප්‍රතිස්ථාපිත භූමි හෙක්ටයාර් 1939 | | | 75%-100% |
| | | නැවත වන වගා ස්ථාපනය හෙක්ටයාර් 183 | නැවත වන වගා කරන ලද භූමි වපසරිය හෙක්ටයාර් 183 | | | 75%-100% |
| | | නැවත වන වගා නඩත්තු හෙක්ටයාර් 146.5 | නැවත වන වගා නඩත්තු කරන ලද භූමි වපසරිය හෙක්ටයාර් 146.5 | | | 75%-100% |
| | | කඩොලාන සංරක්ෂණය යටතේ හෙක්. 250 ක කඩොලාන වනාන්තර නඩත්තු කටයුතු සිදු කිරීම. | කඩොලාන සංරක්ෂණය කරන ලද භූමි වපසරිය (හෙක්. 250) | | | 75%-100% |
| | | වැව් තාවුළු සංරක්ෂණය යටතේ පෙර වසරවලදී ස්ථාපිත වැව් තාවුළු ආශ්‍රිත වන භූමි නඩත්තු සිදු කිරීම. හෙක්. 183 | සංරක්ෂණය කරන ලද වැව් තාවුළු ප්‍රමාණය හා භූමි වපසරිය (හෙක්. 183) | | | 75%-100% |
| | | රණවිරු රුක් රෝපණය හෙක්. 47 | වගා කරන ලද භූමි වපසරිය (හෙක්. 47) | | | 75%-100% |
| | | අත්හැර දමන ලද ගෙවතු වනාන්තර බවට පත් කිරීම. නඩත්තු හෙක්.130 | වනාන්තර බවට පත් කරන ලද භූමි වපසරිය (හෙක්. 130) | | | 75%-100% |
| | | කටු පඳුරු ලඳු කැලෑ බවට පත් කිරීම්. නඩත්තු හෙක්.622.32 | වනාන්තර බවට පත්කල භූමි වපසරිය (හෙක්. 622.32 ) | | | 75%-100% |
| | | ආගමික ස්ථානවල රුක් රෝපණය කිරීම. හෙක්.04 (අනුරාධපුර) | ප්‍රතිස්ථාපිත භූමි වපසරිය (හෙක්. 4) | | | 75%-100% |
| | | වන අලි වාසස්ථාන වැඩිදියුණු කිරීම සඳහා වැව් ප්‍රතිසංස්කරණය කිරීම හා ආක්‍රමණික ශාක ඉවත් කිරීම (කුරුණෑගල - | වන අලි වාසස්ථාන වැඩිදියුණු කරන ලද භූමි වපසරිය (හෙක්. 56.9 ) | | | 75%-100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ගැටදිවුල, පුත්තලම) හෙක්.56.9 | | | | |
| | | හෙක්.703.79 වාණිජ වන වගා ස්ථාපිත කිරීම. (RCT) | හෙක්ටයාර් 688.31ක් වාණිජ වන වගා ස්ථාපිත කිරීම. | | | 98% |
| | | හෙක්.2202.69 වාණිජ වන වගා නඩත්තු (1/2/3/4/5/6) | හෙක්.2191.69 වාණිජ වන වගා ස්ථාපිත කිරීම. | | | 99.7 % |
| | | හෙක්. 315.80 පූර්ව වාණිජ තුනී කිරීම්. | හෙක්.305.60 ක පූර්ව වාණිජ තුනී කිරීම. | | | 97% |
| | | හෙක්.529.40 වාණිජ තුනී කිරීම. | හෙක්.522.20 වාණිජ තුනී කිරීම් කිරීම. | | | 99% |
| | | හෙක්. 662.10 ක පසු හෙළීම් සංගණන කිරීම. | හෙක්. 569.80 පසු හෙළීම් කිරීම. | | | 86% |
| | | පාරිසරික සංචාරක ගමනාන්ත 58 නඩත්තු කර පවත්වාගෙන යාම. | පාරිසරික සංචාරක ගමනාන්ත 58 නඩත්තු කර පවත්වාගෙන යාම. | | | 100% |
| | | ස්වභාවික මංපෙත් කි.මී.168 ක් සහ සෆාරි මාවත් කි.මී. 112ක් නඩත්තු කර අවශ්‍ය වැඩි දියුණු කිරීම් සිදු කිරීම. | ස්වභාවික මංපෙත් කි.මී.168 ක් සහ සෆාරි මාවත් කි.මී. 112ක් නඩත්තු කර අවශ්‍ය වැඩි දියුණු කිරීම් සිදු කිරීම. | | | 100% |
| | | ප්‍රවේශ පත්‍ර මුද්‍රණ කටයුතු සිදු කිරීම. | ප්‍රවේශ පත්‍ර 1,076,250 මුද්‍රණ කටයුතු සිදු කිරීම. | | | 100% |
| | **15.4.** 2030 වන විට තිරසර සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය ප්‍රතිලාභ ගෙන දීමට ඒවායේ ධාරිතාව නැංවීම සඳහා ජෛව විවිධත්වයද සමඟින් කඳුකර පරිසර පද්ධති සංරක්ෂණය කිරීම තහවුරු කිරීම | කඳුමුදුන් වන වගා ස්ථාපිත කිරීම සඳහා බීජ පැල නිෂ්පාදනය සහ නඩත්තු කිරීම බීජ පැල 21,000 නිෂ්පාදනය කිරීම. | බීජ පැළ 21,000 නිෂ්පාදනය කිරීම. | | | 100% |
| | | හෙක්.20 කඳුමුදුන් වන වගා ස්ථාපිත කිරීම. | හෙක්.20 කඳුමුදුන් සංරක්ෂණ වන වගා | | | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **15.8.** 2020 වන විට ගොඩබිම සහ ජලයේ පරිසර පද්ධති වල වෙසෙන ආක්‍රමණික පිටස්තර ජීව විශේෂයන් අලුතින් හඳුන්වාදීම සහ ඔවුන්ගෙන් සිදු වන බලපෑම කැපී පෙනෙන ලෙස අඩු කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දීම සහ මෙම විශේෂයන් පාලනය හෝ තුරන් කිරීම. | ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, නඩත්තු 180 ha | ආක්‍රමණශීලී ශාක ඉවත් කරන ලද භූමි වපසරිය(හෙක්. 180) | | | 75%-100% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

### 5.2.1 ජයග්‍රහණ

1. පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් වලින් 2024 වර්ෂයට වඩා වැඩි ආදායමක් 2025 වර්ෂයේ ඉපයීමට හැකිවීම. ඒ අනුව, 2024 වර්ෂයේ උපයා ඇති ආදායම රු. මි. 452 ක් වන අතර එය 2025 වර්ෂය වන විට රු.මි. 580ක් දක්වා වැඩි වී ඇත. එය 2024 වර්ෂයට වඩා 23% ක වැඩි වීමකි.

(2025 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට බලපෑ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් නකල්ස් සංරක්ෂිත වනාන්තරයට බලපෑම් ඇති වූ හෙයින් එම සංචාරක ගමනාන්තය වෙත සංචාරකයන්ගේ පැමිණීම අඩු වීමට හේතු වී ඇත)

2. පාරිසරික සංචාරක ගමනාන්ත පවත්වාගෙන යාම සඳහා ප්‍රජාමූල සංවිධාන සමඟ සම්බන්ධ වී අදාළ සේවාවන් ලබා ගැනීම තුලින් වනාන්තර ආශ්‍රිතව ජීවත් වන ජනතාවට ජීවන තත්ත්වය ඉහළ නැංවීමට දායකත්වය සැපයීම.

3. රාජ්‍ය දැව සංස්ථාවේ හෙලීම් ප්‍රමාදය මත පූර්ණ හෙලීම් ඉලක්කය අඩු වූ බැවින් එම ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය යොදා ගනිමින් වන වගාවල අස්වැන්න ඉහළ නැංවීමේ අරමුණින් අමතර ක්‍රියාකාරකම් වශයෙන් මාතර, හම්බන්තොට, වවුනියා, කිලිනොච්චිය, බදුල්ල, කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුළ

හෙක්ටයාර් 292.04 ක වල් නෙලීම, පොහොර යෙදීම, ගිනි වැළැක්වීම හා පාළු පැළ සිටුවීම සිදු කරන ලදී.

4. කන්නෙලිය රක්ෂිත වනාන්තරයට අනුයුක්තව සේවය කරන මාර්ගෝපදේශකයන් සඳහා මාර්ගෝපදේශක පුහුණුව ලබා දීම.

5. සංචාරක සංවර්ධන මණ්ඩලයේ අනුග්‍රාහකත්වයෙන් කුඩව සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයට අනුයුක්ත මාර්ගෝපදේශකයන් සඳහා මාර්ගෝපදේශක පුහුණුව ලබා දීම.

### 5.2.2 අභියෝග

1. වන ආවරණය වැඩි කිරීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවීම.

2. වනාන්තර මායිම් නිරූපණයේදී හා ගැසට් කිරීමේදී විවිධ ආයතනයන්ගෙන් හා ප්‍රජාවන්ගෙන් නිසි සහයෝගයක් නොලැබීම හා ජාතික වශයෙන් වැදගත් වන කටයුත්තක් සේ නොසලකමින් එම කාර්යය කෙරෙහි ඇතිවන ප්‍රතිරෝධතා.

3. වනාන්තර මායිම් මැනුම් කිරීම හා මායිම් කණු මගින් සලකුණු කිරීම දුෂ්කර කටයුත්තක් වන අතර, එම කාර්යය සාර්ථකව ඉටු කිරීම සඳහා දැනට සේවයේ යෙදී සිටින සේවක මණ්ඩලයේ ඌණතාවය.

4. වනාන්තර මායිම් නිරූපණය හා ගැසට් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන නිසි කලට හා නිසි ප්‍රමාණයෙන් නොලැබීම.

5. මානව හා භෞතික සම්පත් වල හිඟතාවයන් මත වනාන්තර පරිසර පද්ධති සංරක්ෂණය හා ඒවායේ සේවාවන් තිරසරව පවත්වා ගනිමින් සංචාරක කටයුතු සිදු කිරීමේ අසීරුතාවය හා අවිධිමත් සංචාරක ඇතුළුවීම් සීමා කිරීමට අසීරු වීම.

6. ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීමේ කාර්යයේදී රාජ්‍ය අංශය ක්‍රියාත්මක වීම පමණක් ප්‍රමාණවත් නොවේ. එබැවින් ඒ සඳහා පෞද්ගලික අංශයේ හා විදේශයන් හි දායකත්වය ලබා ගැනීම වඩා ඵලදායී වනු ඇත.

7. මේ වෙනුවෙන් දේශීය පෞද්ගලික අංශයන්ගේත් විදේශීය අංශයේත් මූල්‍ය දායකත්වයක් ලබා ගත හැකි පරිදි රාජ්‍ය හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සිදු කළ යුතු අතර ඒ තුළින් අපේක්ෂිත වන ආවරණය 32%ක් දක්වා ඉහළ නැංවීමේ ඉලක්කයට ළඟා වීම වඩා කාර්යක්ෂමව සිදු කිරීමේ හැකියාව ඇත.

# 06 පරිච්ඡේදය
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

*වගුව 6.1: සේවක සංඛ්‍යා කළමනාකරණය*

| | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 88 | 45 | 43 |
| තෘතීයික මට්ටම | 50 | 07 | 43 |
| ද්විතීයික මට්ටම | 1486 | 1103 | 383 |
| ප්‍රාථමික මට්ටම | 1634 | 1340 | 294 |
| එකතුව | **3258** | **2495** | **763** |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

- ජ්‍යෙෂ්ඨ - දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති සැකසීම, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය හා පවත්වා ගැනීමේ හැකියාව කෙරෙහි දැඩි ලෙස බලපා ඇත.
- තෘතීයික - දෙපාර්තමේන්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන කණ්ඩායම මෙහෙයවීම හා අධීක්ෂණය කෙරෙහි බලපෑම් ඇති කරයි.
- ද්විතීයික - වන ආරක්ෂණ හා සංවර්ධන කටයුතු ඵලදායී ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීමට නොහැකි වීම.
- ප්‍රාථමික - සුළු සේවක කාර්ය මණ්ඩලයක් නොමැතිකම හේතුවෙන් කාර්යාලීය කටයුතු කාර්යක්ෂමව කිරීමට නොහැක. වනාන්තර සහ නැවත වගා කරන වනාන්තරවල ආරක්ෂාවට මෙන්ම තවාන් කටයුතු හා සංරක්ෂණ මධ්‍යස්ථානවල මෙම කාර්යාල කටයුතු මනා ලෙස පවත්වාගෙන යාමට ගැටලු සහගත වීම.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

*වගුව 6.2 : 2025 වසරේ බඳවා ගැනීම්*

| | |
|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | 13 |
| ගණකාධිකාරි | 03 |

## 6.4 2025 වසරේ විශ්‍රාම ගැනීම්

අදාළ කාල වකවානුව තුළ පහත සඳහන් තනතුරු දරන ලද නිලධාරීන් විශ්‍රාම ගන්නා ලදී.

වගුව 6.3: 2025 වර්ෂයේ විශ්‍රාම ගැනීම්

| | |
|---|---|
| වන සංරක්ෂක ජනරාල් | 01 |
| සහකාර වන සංරක්ෂක | 04 |
| විශේෂ වන පාලක | 01 |

| | |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා නිලධාරී | 01 |
| වන පාලක | 05 |
| අඩවි වන නිලධාරි | 03 |
| කළමනාකරණ සේවා නිලධාරි | 06 |
| සැලැසුම් ශිල්පී | 01 |
| වන ව්‍යාප්ති නිලධාරි | 03 |
| බීට්ටු වන නිලධාරි | 08 |
| රියදුරු | 02 |
| වන ක්ෂේත්‍ර සහකාර | 20 |
| කාර්යාල සේවක සේවය | 03 |
| වගා කම්කරු | 07 |

## 6.5 සේවයෙන් ඉල්ලා අස්වීම්/ තනතුරු වලින් නිදහස් වීම

*වගුව 6.4 සේවයෙන් ඉල්ලා අස්වීම් / තනතුරුවලින් නිදහස් වීම*

| | |
|---|---|
| සහකාර වන සංරක්ෂක | 07 |
| සංවර්ධන නිලධාරි | 03 |
| අඩවි වන නිලධාරි | 01 |
| කළමනාකරණ සේවා නිලධාරි | 02 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 |
| වන ව්‍යාප්ති නිලධාරි | 01 |
| වන ක්ෂේත්‍ර සහකාර | 15 |

## 6.6 මියගිය නිලධාරීන් පිළිබඳ විස්තරය

වගුව 6.5 මියගිය නිලධාරීන් පිළිබඳ විස්තර

| | |
|---|---|
| වන ව්‍යාප්ති නිලධාරි | 01 |
| රියදුරු | 01 |
| වන ක්ෂේත්‍ර සහකාර | 03 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |

## 6.7 විනය කටයුතු

*වගුව 6.6 විනය කටයුතු*

| | |
|---|---|
| වැඩ තහනම් කිරීම් | 2 |
| නැවත සේවයේ පිහිටුවීම් | 1 |
| වර්ෂය තුල ආරම්භ කළ විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ | 21 |

## 6.8 සේවය අත්හැර යාම

*වගුව 6.7 සේවය අත්හැර යාම්*

| | |
|---|---|
| සංවර්ධන නිලධාරි | 01 |
| වන ක්ෂේත්‍ර සහකාර | 02 |

## 6.9 දේශීය/ විදේශීය පුහුණු

*වගුව 6.8 දේශීය පුහුණු*

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව (දින) | සමස්ත ආයෝජනය (Rs'000) | වැඩසටනේ ස්වභාවය (දේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| නවක සහකාර වන සංරක්ෂකවරුන් සඳහා ගස් හඳුනාගැනීම් පුහුණුව (වියළි /තෙත් කලාපය) | 14 | 04 | 248.815 | දේශීය | තෙත් කලාපය හා වියළි කලාපයෙහි පවතින ශාක හඳුනාගැනීමේ මූලික පුහුණුව ලබාගැනීම |
| බීට්ටු වන නිලධාරි හා වන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන් සඳහා තර්ජනයට ලක්වී ඇති ශාක හඳුනාගැනීම හා සංරක්ෂණ කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන | 27 | 02 | 164.950 | දේශීය | ක්ෂේත්‍රයේ පවතින තර්ජිත ශාක හඳුනාගැනීමට සහ කළමනාකරණයට අවශ්‍ය මූලික පුහුණුව ලබාගැනීම |
| තවාන් පාලනය පුහුණුව ( ප්‍රධාන කලාප කාර්යාල 5ට අයත් හා ප්‍රධාන කාර්යාලයෙහි වන ක්ෂේත්‍ර සහකාරවරුන් සඳහා ) | 140 | 12 | 651.48669 | දේශීය | තවාන් පාලනයට අවශ්‍ය යාවත්කාලීන දැනුම ලබාගැනීම |
| තිරසර වනාන්තර කළමනාකරණය තුළින් ඉඩම් ගැටලු නිරාකරණය කිරීමේ පුහුණු වැඩසටහන | 66 | 02 | 673,940.00 | දේශීය | වනාන්තර මායිම් ගැටලු නිරාකරණය කිරීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳ පුහුණුව |
| අධිකරණ කටයුතු පුහුණුව I | 39 | 02 | - | දේශීය | අධිකරණ කටයුතු සම්බන්ධ දැනුම |
| අධිකරණ කටයුතු පුහුණුව I | 42 | 02 | - | දේශීය | අධිකරණ කටයුතු සම්බන්ධ දැනුම |

**විදේශීය සම්මන්ත්‍රණ හා පුහුණු**

*වගුව 6.9 විදේශීය පුහුණු*

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව (දින) | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|
| Seminar on Forestry International Cooperation for BRI Countries | 3 | 14 | විදේශීය | වන විද්‍යා ක්ෂේත්‍රයේ සහයෝගීතාව ප්‍රවර්ධනය පිළිබඳ දැනුම |
| Seminar on Natural Heritage Protection and Management for BRI Countries | 2 | 14 | විදේශීය | ස්වභාවික උරුමයන් කළමනාකරණය සහ ප්‍රවර්ධනය පිළිබඳ දැනුම |
| Seminar on Climate Change and Sustainable Development for BRI Countries | 1 | 14 | විදේශීය | ගෝලීය කාලගුණ විපර්යාස වලට මුහුණ දීමට හා තිරසර සංවර්ධනය පිළිබඳ දැනුම |
| Seminar on Eco - City Construction for Development BRI Countries | 1 | 14 | විදේශීය | පරිසර හිතකාමී සංවර්ධනය පිළිබඳ දැනුම |
| Seminar on The Implementation of United Nations Forest Instruments and Sustainable Forest Management for Developing Countries | 3 | 14 | විදේශීය | තිරසර වන කළමනාකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ උපාය මාර්ගික පියවරයන් පිළිබඳ අවබෝධ කරගැනීම |
| Invitation to the Ninth Meetings of the APFNet Council and Board of Directors | 1 | 3 | විදේශීය | - |
| APFORGEN Annual Meeting and International Symposium Los Baños, Philippines | 2 | 5 | විදේශීය | වාර්ෂික සමුළුවට සහභාගී වීම සහ වන විද්‍යා පර්යේෂණ එළිදැක්වීම |
| Regional Marine Protected Areas (MPA) and IUCN Green List Training for BOBLME Implementing Partners | 1 | 5 | විදේශීය | IUCN green list හි ප්‍රමිතීන්ට අනුකූලව කලාපීය සමුද්‍රීය ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණය පිළිබඳ දැනුම |

| | | | | |
|---|---|---|---|---|
| Seminar on Biodiversity Sustainability for Developing Countries | 3 | 14 | විදේශීය | තිරසාර ජෛව විවිධත්වය පිළිබඳ දැනුම හුවමාරුව |
| Capacity Building Workshop on the Management of Internationally Designated Areas | 1 | 4 | විදේශීය | |
| Pre- Conference Workshop on Forest Landscape Restoration (FLR) 2025 | 1 | 7 | විදේශීය | |
| 5th World Teak Conference 2025, India. | 1 | 7 | විදේශීය | වන විද්‍යා පර්යේෂණ ප්‍රතිඵල එළි දැක්වීම |
| Nomination for Participation in IUFRO-SPDC Workshop on Upscaling Forest Landscape Restoration – Paraguay, August 2025 | 1 | 4 | විදේශීය | වන භූමි ප්‍රතිස්ථාපනය පිළිබඳ පුහුණුව |
| Seminar on Wetland Conservation & Management for Parties to Ramsar Conservation | 1 | 14 | විදේශීය | තෙත් බිම් සංරක්ෂණය පිළිබඳ දැනුම |
| JICA Knowledge Co-Creation Program: Ecosystem – Based Solutions for Disaster Risk Reduction (Eco-DRR) (Online and in Japan), Online and in Japan | 1 | 14 | විදේශීය | ස්වභාවික ආපදා කළමනාකරණයට පරිසර පද්ධති භාවිතය පිළිබඳ දැනුම |
| Seminar for Officials on the Development and Management of Forestry Carbon Sequestration Project in Developing Countries | 4 | 14 | විදේශීය | සංවර්ධනය වෙමින් පවතින රටවල වන වගා ආශ්‍රිත කාබන් තිර කිරීම කළමනාකරණය පිළිබඳ පුහුණුව |
| Seminar on Synergy Between Biodiversity Conservation and Climate Change for Developing Countries | 3 | 14 | විදේශීය | සංවර්ධනය වෙමින් පවතින රටවල ජෛව විවිධත්වය සංරක්ෂණය සහ කාලගුණ විපර්යාස සමග ඇති අනුකූලතාව අවබෝධය |

| | | | | |
|---|---|---|---|---|
| The Second Pu'er Forum on Asia-Pacific Forests | 3 | 3 | විදේශීය | ආසියා ශාන්තිකර කලාපයේ වනාන්තර පිළිබඳ දැනුම හුවමාරුව |
| Seminar on Forestry Addressing Climate Change for BRI Countries | 3 | 14 | විදේශීය | කාලගුණ විපර්යාස කළමනාකරණය උදෙසා වන වගා කළමනාකරණ දැනුම හුවමාරුව |
| Ministerial Workshop on Comprehensive Sustainable Forest Management under South - South Cooperation for Developing Countries | 2 | 7 | විදේශීය | දකුණු සහ අග්නිදිග කලාපයේ තිරසාර වන කළමනාකරණය පිළිබඳ දැනුම ලබාගැනීම |
| JICA Knowledge Co-Creation Program: Developing Policy - Making Abilities for Sustainable Forest Management 2025 | 1 | 38 | විදේශීය | තිරසාර වන කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම |
| International Conference on Development and Environment Economics: SANDEE@25 | 2 | 3 | විදේශීය | පරිසර ආර්ථික ගණනය කිරීම් ගැන දැනුම ලබාගැනීම |

## 6.10 පුහුණු වැඩසටහන්

*වගුව 6.10 දේශීය පාඨමාලා*

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව (දින) | සමස්ත ආයෝජනය (රු '000) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|
| 1. සිවිල් විශ්‍රාම වැටුප් ගණනය කිරීම | නිලධාරීන් 03 | දිනකට පැය 07 බැගින් වැඩසටහන් 02ක් | - | දේශීය | අදාළ ක්ෂේත්‍රයට අයත් දැනුම |
| 2. වැටුප් පරිවර්තනය කිරීම | නිලධාරීන් 03 | දිනකට පැය 07 බැගින් වැඩසටහන් 02ක් | - | දේශීය | |
| 3. සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | නිලධාරීන් 40 | දිනකට පැය 07 බැගින් වැඩසටහන් 02ක් | - | දේශීය | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම | නිලධාරින් 14 | දිනකට පැය 08 බැගින් වැඩසටහන් 02ක් | - | **දේශීය** | |
| 5. ගිනි නිවීමේ වැඩසටහන | නිලධාරින් 13 | දින 01 | - | **දේශීය** | |
| 6. දෙමළ භාෂා පාඨමාලාව | නිලධාරින් 76 | පැය 150 | - | **දේශීය** | |

## 6.11 ණය ලබාදීම

දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයට අයත් නිලධාරීන්ට රජයේ සේවකයින්ට හිමි ණය යටතේ පහත සඳහන් ණය ලබා දී ඇත.

01. ආපදා ණය 162 ක්
02. දේපල ණය ලබා දී නැත.

## 6.12 තොරතුරු අයිතිවාසිකම් ඒකකය

**1.** මෙම දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලුම්කරන ලද ඉල්ලුම්කරුවන් පහත පරිදි වර්ග කළ හැක.

| | | |
|---|---|---|
| ❖ පුරවැසියන් | - | 72 |
| ❖ රාජ්‍ය සංවිධාන | - | 11 |
| ❖ රාජ්‍ය නොවන සංවිධාන | - | 10 |
| | | 93 |

**2.** ඉල්ලුම් කළ තොරතුරු පහත පරිදි වර්ගීකරණය කළ හැක.

| | | |
|---|---|---|
| ❖ ව.සං.දෙ. ඉඩම් පිළිබඳ ගැටලු | - | 54 |
| ❖ වන රක්ෂිත පිළිබඳ ගැටලු | - | 20 |
| ❖ කාර්යය මණ්ඩල ආයතන අංශයේ ගැටලු | - | 08 |
| ❖ වන ආරක්ෂණය, නීති සම්බන්ධ ගැටලු | - | 07 |
| ❖ විවිධ තොරතුරු ලබා ගැනීම | - | 04 |
| | | 93 |

# 07 පරිච්ඡේදය
# අනුකූලතා වාර්තාව

## 7.1 අනුකූලතා වාර්තාව

*වගුව 7.1 අනුකූලතා වාර්තාව*

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම්/ ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අනුකූල වේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.9 | හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| **03** | **මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.2 | මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ .134 (2)DMA/1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | ඇතැම් අවස්ථාවන්හිදී මසක කාලයක් තුළ පිළිතුරු නොලැබීම | නියමිත කාලය තුළ පිළිතුරු ඉදිරිපත් කරන ලෙස අංශ දැනුවත් කිරීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව ,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු04 ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ. | - | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්හිතවී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | තක්සේරු වාර්තා කමිටුව මඟින් ලැබීම ප්‍රමාද වීම | තක්සේරු වාර්තා ගර්හිත වාහන තක්සේරු කරන අවස්ථාවේදීම ලබා ගැනීමට අපේක්ෂා කිරීම |
| 9.3 | වාහන ලොග්පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව,වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකුගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | අක්‍රීය බැංකු ගිණුම් 33කින් 15ක් නිරවුල් කර ඇත. තවත් ගිණුම් 14ක් නිරවුල් කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යවා ඇති අතර ඉතිරි ගිණුම් 04 නිරවුල් කිරීමට අදාල ලියකියවිලි වල අඩු පාඩු ඇත. | ව්‍යාපෘතීන් ආරම්භ කරන අවස්ථාවේදීම ක්‍රමවත් ලියකියවිලි පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබා දීම |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ණය හිමියන් සහ ඇපකරුවන් සොයා ගැනීම දුෂ්කර විය. සමහර නිලධාරින් මරණයට පත්වීම,වැඩ තහනමට ලක් වීම,සේවය අත්හිටුවීම ආදී කරුණු හේතුවිය. | ණය හිමියන් හෝ ගනුදෙනුකරුවන් සොයා ගැනීම සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීම. |
| **13** | **පොදුතැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ571 . ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අනුමත කාර්යය මණ්ඩලය වන.සං.දෙ. වෙත නොලැබීම | පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර අවශ්‍ය අනුමැතිය ඉල්ලුම් කර ඇත. |
| 16.2 | කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල නොවේ | වෙබ් අඩවිය යාවත්කාලීන කර නොමැත | තොරතුරු තාක්ෂණ ඒකකය හරහා අදාල කටයුතු සිදු කරමින් පවතී. |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | සියළුම වන සංරක්ෂකවරුන් සහ දිසා වන නිලධාරීවරුන් තොරතුරු නිලධාරීන් වන බැවින් සියළුම තොරතුරු ඉල්ලීම් සඳහා ආයතන අංශය මගින් පිළිතුරු සැපයීම සිදු කරනු නොලැබේ. | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | වාර්ෂික කාර්යසාධන වාර්තා ලබාගන්නා අතර ගිවිසුම් අත්සන් කිරීම සිදු නොකරයි | - |
| 19.4 | ඉහත චක්‍රලේඛ 6.5ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | - | - |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම | අනුකූල වේ | - | - |

# 08 පරිච්ඡේදය
# කැලෑ දෙපාර්තමේන්තු අරමුදල

## 8.1 කැලෑ දෙපාර්තමේන්තු අරමුදල පිළිබඳ හැඳින්වීම

**01. කැලෑ දෙපාර්තමේන්තු අරමුදල පිහිටුවීම.**

2009 අංක 65 1995 අංක 23 1998 අංක 84 1982 අංක 13 හා 1979 අංක 56 දරන සංශෝධන පනත් වලින් සංශෝධනය කරන ලද 1966 අංක 13 දරණ 451 වන අධිකාරිය වන සංරක්ෂණ ආඥා පනතේ 64 වන වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාට ලැබී ඇති බලතල ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදල පිහිටුවා ඇති අතර එහි 64 හා 64(ආ) අරමුදල මඟින් ගෙවියයුතු කාර්යයන් සඳහා නියෝග පැනවීමට අමාත්‍යවරයා වෙත බලය ලබාදී ඇත.

**02. ආඥා පනතේ 64(ඇ) වගන්තිය යටතේ,**

I මෙම ආඥා පනත යටතේ සිදුකරන ලද වැරදි සඳහා වන්දි මුදල් වශයෙන් ලැබුණු මුදල් ද අධිකරණය විසින් පනවන දඩ මුදල්වලින් ලැබුණු මුදල් හා රාජසන්තක කරන ලද වාහන විකිණීමෙන් ලැබෙන මුදල්,

II වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් භාරගනු ලබන ක්‍රියාකාරකම් හරහා ලැබෙන මුදල්

III ආණ්ඩුව, යම් රාජ්‍ය හෝ පෞද්ගලික සංස්ථා හෝ යම් යම් පුද්ගලයන් විසින් ආධාර වශයෙන් අරමුදලට දෙනු ලබන මුදල්.

සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් එකී අරමුදලට ගෙවීම විධිවිධාන සලස්වා ඇත.

**03. නියෝගවල නිශ්චිතව දක්නට ලැබිය හැකි කොන්දේසි වලට යටත්ව අරමුදලින්**

I. වන අපරාධ පිළිබඳව තොරතුරු දැනුම් දෙන්නාට හා වන නිලධාරීන්ට ත්‍යාග ලබාදීම.
II. මෙම ආඥා පනතේ බලතල කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීමේදී වන නිලධාරීන්ට,පොලිස් නිලධාරීන්ට සිදුවන හානී හා ශාරීරික තුවාල සඳහා වන්දි ගෙවීම.
III. මරණය සිදුවන අවස්ථාවක උරුමක්කාරයින්ට වන්දිගෙවීම.
IV. මෙම ආඥා පනතේ කාර්යයන් සඳහා නිලධාරීන්ට අධිකරණවලට පැමිණීමට දරන ගමන් වියදම් ගෙවීමට
V. වන අපරාධ වැලැක්වීම සඳහා වැටලීම් කිරීමේදී හා වන ආරක්ෂණ කටයුතු වලදී දැරීමට සිදුවන වියදම් ගෙවීම.
VI. වන ආරක්ෂණ කටයුතු ඵලදායි ලෙස සිදුකිරීම සඳහා නිලධාරින් පුහුණු කිරීම සඳහා ඇතුළු වන ආරක්ෂණ කටයුතු වලදී දැරීමට සිදුවන වියදම් ගෙවීම.

යන වියදම් සඳහා ගෙවීම සිදුකිරීමට විධිවිධාන සලස්වා ඇත.

**04 . උක්ත ආඥා පනතේ වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු ඇමතිතුමා විසින් 1979.12.26 දින අංක 68/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත හා 1993.04.26 දින අංක 764/4 දරන නියෝගය මඟින් සංශෝධනය කරන ලද 1979 අංක 05 දරන කැලෑ නියෝග මාලාව මඟින් අදාල නියෝග ප්‍රකාශයට පත් කර ඇත.**

## 8.2 අපේක්ෂිත අරමුණු හා නිමැවුම්

### 8.2.1 අරමුණු

**කැලෑ දෙපාර්තමේන්තු අරමුදල පිහිටුවීමේ අරමුණු**

1. වන සංරක්ෂණ ආඥා පනතේ බලතල හා කාර්යයන් ඉටු කරන වන නිලධාරීන් දිරිගැන්වීම.
2. වන නිලධාරීන්ගේ උරුමක්කාරයින්ට සහන සැලසීම.
3. වන සංරක්ෂණ ආඥා පනත යටතේ පවරන ලද නඩුවල සාක්ෂි ලබාදෙන විවිධ ආයතනවල නිලධාරීන් දිරිගැන්වීම තුලින් වන සංරක්ෂණ ක්‍රියාවලිය තහවුරු කිරීම.
4. වන අපරාධ වැටලීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම තුලින් වන සංරක්ෂණ ක්‍රියාවලිය තහවුරු කිරීම.
5. වන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය තුලින් වන ආරක්ෂණ කටයුතු වල ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩි කිරීම.
6. වන සංරක්ෂණ හා ආරක්ෂණ කටයුතු සඳහා වන නිලධාරීන් හෝ වෙනත් පාර්ශව දායක කර ගැනීම.

### 8.2.2 නිමැවුම්

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය හා සංවර්ධනයේදී ප්‍රශස්ත වන ආවරණයක් පවත්වාගෙන යාමට හැකිවන පරිදි වන ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම.

## 8.3 කැලෑ දෙපාර්තමේන්තු අරමුදලට අදාලව ක්‍රියාකාරී සැලැස්ම

### 8.3.1 504 A -තෑගි මුදල් ගෙවීම

*වගුව 8.1 තෑගි මුදල් ගෙවීම*

| ක්‍රියාකාරකම | කාර්තුව | මූල්‍ය ඉලක්ක | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|
| තෑගි මුදල් හා වන්දි මුදල් ගෙවීම සඳහා | 1 කාර්තුව | 3,000,000.00 | 250,000.00 |
| | 2 කාර්තුව | 5,000,000.00 | 3,717,806.85 |
| | 3 කාර්තුව | 6,000,000.00 | 1,719,708.16 |
| | 4 කාර්තුව | 4,000,000.00 | 7,142,606.47 |

### 8.3.2 504 B - උසාවි ගමන් වියදම් ගෙවීම

*වගුව 8.2 උසාවි ගමන් වියදම් ගෙවීම*

| ක්‍රියාකාරකම | කාර්තුව | මූල්‍ය ඉලක්ක | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|
| උසාවි ගමන් වියදම් ගෙවීම | 1 කාර්තුව | 3,000,000.00 | 286,452.00 |
| | 2 කාර්තුව | 5,000,000.00 | 2,443,548.89 |
| | 3 කාර්තුව | 5,000,000.00 | 1,779,693.61 |
| | 4 කාර්තුව | 4,000,000.00 | 3,576,624.40 |

### 8.3.3 504 C - වන ආරක්ෂණ කටයුතු සඳහා ගෙවීම්

*වගුව 8.3 වන ආරක්ෂණ කටයුතු සඳහා ගෙවීම්*

| ක්‍රියාකාරකම | කාර්තුව | මූල්‍ය ඉලක්ක | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|
| වන ආරක්ෂණ කටයුතු සඳහා ගෙවීම් | 1 කාර්තුව | 10,000,000.00 | 85,800.00 |
| | 2 කාර්තුව | 11,000,000.00 | 1,613,096.30 |
| | 3 කාර්තුව | 11,000,000.00 | 2,812,826.94 |
| | 4 කාර්තුව | 10,000,000.00 | 2,111,697.07 |

### 8.3.4 504 D - පුහුණු හා සම්මන්ත්‍රණ

*වගුව 8.4 පුහුණු හා සම්මන්ත්‍රණ*

| ක්‍රියාකාරකම | කාර්තුව | මූල්‍ය ඉලක්ක | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|
| වන ආරක්ෂණ කටයුතු සඳහා ගෙවීම් | 1 කාර්තුව | 500,000.00 | - |
| | 2 කාර්තුව | 2,000,000.00 | 158,190.00 |
| | 3 කාර්තුව | 1,500,000.00 | 184,357.00 |
| | 4 කාර්තුව | 1,000,000.00 | 576,545.17 |

### 8.3.5 504 E - මුද්‍රණ කටයුතු හා වෙනත් වියදම්

*වගුව 8.5 මුද්‍රණ කටයුතු හා වෙනත් වියදම්*

| ක්‍රියාකාරකම | කාර්තුව | මූල්‍ය ඉලක්ක | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|
| මුද්‍රණ කටයුතු හා වෙනත් වියදම් | 1 කාර්තුව | 1,000,000.00 | - |
| | 2 කාර්තුව | 1,000,000.00 | 70,000.00 |
| | 3 කාර්තුව | 1,000,000.00 | 60,000.00 |
| | 4 කාර්තුව | 1,000,000.00 | 85,000.00 |

## 8.4 2025.12.31 දිනට ප්‍රගතිය

### 8.4.1 504 A - තෑගි මුදල් ගෙවීම

*වගුව 8.6 තෑගි මුදල් ගෙවීම්*

| ක්‍රියාකාරකම | නිලධාරින් සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|
| වන අපරාධ වැටලීම සඳහා සහභාගී වූ නිලධාරීන්ට තෑගි මුදල් හා වන්දි ගෙවීම සඳහා | 2321 | 12,830,121.48 |

### 8.4.2 504 B - උසාවි ගමන් වියදම් ගෙවීම

*වගුව 8.7 උසාවි වියදම් ගෙවීම*

| ක්‍රියාකාරකම | නිලධාරින් සංඛ්‍යාව | වැයවූ මුදල (රු.) |
|---|---|---|
| උසාවි කටයුතු වලට සහභාගි වීම සඳහා ගෙවීමට | 926 | 8,086,318.90 |

## 8.4.3 504 C - වන ආරක්ෂණ කටයුතු සඳහා ගෙවීම්

*වගුව 8.8 වන ආරක්ෂණ කටයුතු සඳහා ගෙවීම්*

| කලාප කාර්යාලය | දිසාව | වියදම |
|---|---|---|
| කලාප කාර්යාලය - වයඹ/බස්නාහිර | - | 3,000.00 |
| | ගම්පහ | 196,000.00 |
| | කළුතර | 286,659.37 |
| | පුත්තලම | 300,000.00 |
| | කුරුණෑගල | 260,168.00 |
| කලාප කාර්යාලය - දකුණ / සබරගමුව | - | - |
| | රත්නපුර | 596,944.05 |
| | කෑගල්ල | 297,150.00 |
| | මාතර | 400,000.00 |
| | ගාල්ල | 180,000.00 |
| | හම්බන්තොට | 69,300.00 |
| කලාප කාර්යාලය - උතුරුමැද / නැගෙනහිර | - | - |
| | අනුරාධපුර | 299,983.00 |
| | පොළොන්නරුව | 50,000.00 |
| | ත්‍රිකුණාමලය | 93,690.00 |
| | මඩකලපුව | 100,000.00 |
| | අම්පාර | 442,480.00 |
| කලාප කාර්යාලය - ඌව/ මධ්‍යම | නුවරඑළිය | 104,960.00 |
| | මාතලේ | 60,000.00 |
| | මහනුවර | 58,330.29 |
| | බදුල්ල | 60,000.00 |
| | මොණරාගල | 200,000.00 |
| කලාපකාර්යාලය - උතුර | - | - |
| | වවුනියාව | 498,561.60 |
| | මුලතිව් | - |
| | කිලිනොච්චිය | 200,000.00 |
| | මන්නාරම | 100,000.00 |
| වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම් අංශයේ හා ප්‍රධාන කාර්යාලයේ වියදම් | (වන ආරක්ෂණ පුහුණු වැඩසටහන් හා මුද්‍රා මිටි, සකස් කිරීම හා ඉන්ධන වියදම්) | 1,766,194.00 |

## 8.4.4 504 D - පුහුණු ,සම්මන්ත්‍රණ හා වැඩසටහන්

වන ආරක්ෂණ කටයුතු පිළිබඳව හා ඊට සම්බන්ධ විෂයන් පිළිබඳ වන නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු හා සම්මන්ත්‍රණ 03 ක් පැවැත්වීමට කටයුතු කර ඇත.

*වගුව 8.9 පුහුණු ,සම්මන්ත්‍රණ හා වැඩසටහන්*

| දිසාව/කලාපය | පුහුණුව | වැඩසටහන සිදු කරන ලද කාර්තුව | | | |
|---|---|---|---|---|---|
| | | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව |
| පුත්තලම | ඩ්‍රෝන යන්ත්‍ර භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන | √ | | | |
| වව්නියාව | වනාන්තර ආරක්ෂා කිරීම සහ තෙත් කළාපීය වනාන්තර පද්ධතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | | | √ | |
| නුවරඑළිය වන විද්‍යායතනය | අධිකරණ කටයුතු සම්බන්ධව පුහුණු වැඩසටහන | | | | √ |

## 8.4.5 504 E -මුද්‍රණ කටයුතු හා වෙනත් වියදම්

*වගුව 8.10 මුද්‍රණ කටයුතු හා වෙනත් වියදම්*

| ආයතනය / පුද්ගලයා | ක්‍රියාකාරකම |
|---|---|
| දිසා මහේස්ත්‍රාත් අධිකරණය දෙහිඅත්තකණ්ඩිය | වැරදීමකින් බැරවූ දඩ මුදල් ලෙස රු. 25,000.00 ආපසු ගෙවීම |
| දිසා මහේස්ත්‍රාත් අධිකරණය -මොරවක | වැරදීමකින් බැරවූ දඩ මුදල් ලෙස රු. 45,000.00 ආපසු ගෙවීම |
| දිසා මහේස්ත්‍රාත් අධිකරණය - පැල්මඩුල්ල | වැරදීමකින් බැරවූ දඩ මුදල් ලෙස රු. 60,000.00 ආපසු ගෙවීම |
| දිසා මහේස්ත්‍රාත් අධිකරණය -අම්පාර | වැරදීමකින් බැරවූ දඩ මුදල් ලෙස රු. 80,000.00 ආපසු ගෙවීම |
| දිසා මහේස්ත්‍රාත් අධිකරණය -මැදවච්චිය | වැරදීමකින් බැරවූ දඩ මුදල් ලෙස රු. 5,000.00 ආපසු ගෙවීම |

## 8.5 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එෆ්ඩබ්එල්/ඊ/එෆ්ඩීඑෆ්/01/එෆ්ඒ/2025/22
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2026 අප්‍රේල් 22 දින

වන සංරක්ෂක ජනරාල්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**කැළෑ දෙපාර්තමේන්තු අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කැළෑ දෙපාර්තමේන්තු අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) අරමුදලේ 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාලයට අදාල රු.568,665 ක විගණන ගාස්තු සඳහා සහ ප්‍රවර්තන වර්ෂයේ විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එකතු කළ අගය මත බදු (වැට්) සඳහා ලියාපදිංචි වී ඇත. එහෙත් එම ලියාපදිංචිය අරමුදල සඳහා අදාල නොවන නමුත් 2023 වර්ෂයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදු කරන ලද මිලදී ගැනීම් සඳහා ගෙවන ලද රු.1,803,592 ක් වැට් බදු අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර පොදු තැන්පත් ගිණුම හරකර තිබුණි. එය නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සමුච්චිත අරමුදල හරකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආපසු ගෙවිය යුතු වැට් අයිභාර ලෙස බැරකර සාවද්‍ය ගිණුම්ගත කිරීමක් සිදු කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ 1:2(ආ) හි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2)(ඉ) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය වාර්තා හා කාර්යසාධන වාර්තා ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද, ආරම්භයේ සිටම එම වාර්තා සභාගත කර නොතිබුණි.

### 3.2 කාර්ය සාධනය

අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු නොකිරීම, තෑගි මුදල් ගෙවීම ප්‍රමාද වීම, වන ආරක්ෂණය සඳහා කළයුතු වියදම් කාලීනව හඳුනාගෙන නොතිබීම යනාදි කරුණු අනුව අරමුදලේ අරමුණු නිසි පරිදි ඉටු නොකර පොදු තැන්පත් ගිණුම තුල 2025 දෙසැම්බර් 31 දිනට රු.294,022,759 ක ශේෂයක් පැවතුණි. තවද කැළෑ අරමුදලින් වන අපරාධ වැටලීම සඳහා සහභාගී වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවීම සිදුකළ යුතු වුවද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන් අඩවි වන කාර්යාලයේ 2016 සිට 2025 දක්වා අවසන්ව පැවති වන අපරාධ නඩු 2ක් සඳහා රු.30,922 ක් ද, මන්නාරම් දිස්ත්‍රික්කයේ මඩු පාර අඩවියේ 2019 සිට 2023 වර්ෂය දක්වා අවසන්ව පැවති වන අපරාධ නඩු 44 කට අදාලව රු.377,500 ක තෑගි මුදල් 2025 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොතිබුණි.

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති

# 8.6 ගිණුම් වාර්තාව

කැලෑ දෙපාර්තමේන්තු අරමුදල් ගිණුම - 2025

வன பரிபாலன திணைக்களம் - 2025

Forest Department Fund Account - 2025

පටුන /கட்டண் /Index


| | සිංහල | தமிழ் | English | පිටුව /பக்கம்/Page |
|---|---|---|---|---|
| I | ගිණුම්කරණ ප්‍රතිපත්ති | கணக்கீட்டு கொள்கைகள் | Accounting Policies | 1 |
| II | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | முடிவடைந்தது நிதி அறிக்கைகள் தயாரித்தல் | Preparation of financial statements | 2 |
| III | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | முடிவடைந்த ஆண்டிற்கான நிதி செயல்திறன் அறிக்கை | Statement of financial performance | 3 |
| IV | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | நிதி நிலை அறிக்கை | Statement of Financial Position | 4 |
| V | ස්කන්ධ වෙනස් වීම් ප්‍රකාශය | பங்குகளில் ஏற்பட்ட மாற்றங்களின் அறிக்கை | Statement of changes in equity | 5 |
| VI | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | வருடத்திற்கான வன பரிபாலன திணைக்கள நிதியத்தின் காசு மித | Cash Flow Statement | 6 |
| VII | T ගිණුම් | T கணக்கு | T Accounts | 07 |
| VIII | වැඩ පත්‍රිකා | வேலைத் தாள்கள் | Working Sheets | 08 |
| IX | 2025.12.31 දිනට අවසන් වර්ෂය සඳහා තෑගි මුදලින් ලැබිය යුතු එහෙත් හිඟ විස්තර වාර්තාව උපලේඛණ 08 | 2025.12.31 ஆந் திகதி நிறைவு ஆண்டுக்காக பெறப்படவேண்டியவை | Schedule of Rewards receivable in arrears for the year ended 31 Dec 2025 - Schedule 08 | 9-11 |
| X | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගත් විශේෂිත සටහන් | 2025 ஆம் ஆண்டிற்கான நிதிநிலை அறிக்கைகள் தயாரிப்பின் அடிப்படையில் குறிப்பிட்ட குறிப்புகள் | Specific notes based on Preparation of financial statements for the year 2025 | 12-14 |
| XI | කැලෑ දෙපාර්තමේන්තු අරමුදල සම්බන්ධ කාර්ය සාධන වාර්තාව | வன பரிபாலன திணைக்கள நிதியத்தின் பெறுபேறு அறிக்கை | Performance report for Forest Department Fund | 15 |


සත්‍ය පිටපතකි

ජී. එල්. රසිකා චාන්දනී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ගිණුම් අංශය
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පිටු අංකය / பக்க இல / Page No : 01

## ගිණුම්කරණ ප්‍රතිපත්ති
## கணக்கீட்டு கொள்கைகள்
## Accounting Policies

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තු කැලෑ අරමුදල් ගිණුම පිළියෙල කර ඇත. මෙම මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම වේ.

පිටු අංක 02 සිට 14 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි උපදෙස් හා මාර්ගෝපදේශ විධිවිධානයන්ට අනුකූලව සිදු කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

Financial Statements are prepared & presented under the accrual basis of Accounting in Accordance with Sri Lanka Public Sector Accounting Standerds. (SLPSASs )

Head of the Department is responsible for the preparation and presentation of these financial statements.

